

# සේවය සඳහා නැගී සිටීම



රූහී ආයතනය





2 වන පොත

# සේවය සඳහා නැගී සිටීම

රුහි ආයතනය

ග්‍රන්ථ මාලාවේ පොත්:

රුහි ආයතනය විසින් නිර්මාණය කරන ලද ග්‍රන්ථ මාලාවේ වත්මන් ග්‍රන්ථ නාමයන් පහත දැක්වේ. තරුණ සහ වැඩිහිටියන් හට තම ප්‍රජාවට සේවය කිරීමට ඇති හැකියාව ඉහළ නැංවීමේ ක්‍රමානුකූල ප්‍රයත්නයක දී මෙම පොත්, පාඨමාලා වල ප්‍රධාන අනුපිළිවෙල ලෙස භාවිතා කිරීමට අදහස් කෙරේ. රුහි ආයතනය බහායි ළමා පන්තිවල ගුරුවරුන් පුහුණු කිරීම සඳහා මාලාවේ තුන්වන පොතෙන් විහිදෙන පාඨමාලා මාලාවක් මෙන්ම නව යෞවන කණ්ඩායම්වල සජීවිකාරකයින් නගා සිටුවීම සඳහා 5 වන පොතෙන් තවත් පාඨමාලා මාලාවක් ද සංවර්ධනය කරමින් සිටී. මේවාද පහත ලැයිස්තුවේ දක්වා ඇත. ක්ෂේත්‍රයේ අත්දැකීම් දියුණු වන විට ලැයිස්තුව වෙනස් විය හැකි බව සටහන් කළ යුතු අතර, සංවර්ධනය වෙමින් පවතින විෂයමාලා මූලිකාංග ගණනාවක් පුළුල් ලෙස ලබාදිය හැකි මට්ටමකට ළඟා වන විට අමතර ග්‍රන්ථ නාමයන් එකතු කරනු ලැබේ.

| | |
|---|---|
| **පළමු පොත** | *ආත්මයේ ජීවිතය පිළිබඳ සිතාබැලීම* |
| **දෙවන පොත** | *සේවය සඳහා නැඟී සිටීම* |
| **තුන්වන පොත** | *ළමා පන්ති සඳහා ඉගැන්වීම, පළමු ශ්‍රේණිය* |
| | *ළමා පන්ති සඳහා ඉගැන්වීම, දෙවන ශ්‍රේණිය (අනු පාඨමාලා)* |
| | *ළමා පන්ති සඳහා ඉගැන්වීම, තුන්වන ශ්‍රේණිය (අනු පාඨමාලා)* |
| | *ළමා පන්ති සඳහා ඉගැන්වීම, හතරවන ශ්‍රේණිය (අනු පාඨමාලා)* |
| **හතරවන පොත** | *ද්විත්ව ප්‍රකාශවීම්* |
| **පස්වන පොත** | *කණිටු යෞවනයින්ගේ බලයන් මුදාහැරීම* |
| | *මූලික පෙළඹවීම: පස්වන පොතෙහි පළමු අනු පාඨමාලාව* |
| | *චක්‍රය පුළුල් කිරීම: පස්වන පොතෙහි දෙවන අනු පාඨමාලාව* |
| **හයවන පොත** | *ධර්මය ඉගැන්වීම* |
| **හත්වන පොත** | *සේවා මාර්ගයෙහි එකට ගමන් කිරීම* |
| **අටවන පොත** | *බහා'උ'ල්ලා තුමාගේ ගිවිසුම* |
| **නවවන පොත** | *ඓතිහාසික දෘෂ්ටිකෝණයක් අත්පත්කර ගැනීම* |
| **දහවන පොත** | *උද්දීප්ත සමාජයක් ගොඩනැඟීම* |
| **එකළොස්වන පොත** | *භෞතික වත්කම* |
| **දෙළොස්වන පොත** | (ප්‍රකාශවීමට නියමිත) |
| **දහතුන්වන පොත** | *සමාජ ක්‍රියාකරකම්හි නිරතවීම* |
| **දහතරවන පොත** | (ප්‍රකාශවීමට නියමිත) |

ප්‍රකාශන හිමිකම: රුහී ආයතතනය, කොළොම්බියාව 1997, 2022
සංස්කරණය. 2022 June 2.1.1.PE සංස්කරණය

ආරම්භ කෘතිය Levantémonos a servir ලෙස ස්පාඤ්ඤ භාෂවෙන් මුද්‍රණය කරඇත
ප්‍රකාශන හිමිකම: රුහී ආයතතනය, කොළොම්බියාව 1987, 1996, 2020
ISBN 978-958-52941-0-3

රුහි ආයතනය
කලී, කොළොම්බියාව
විද්‍යුත් තැපෑල: instituto@ruhi.org
Website: www.ruhi.org

# අන්තර්ගතය

උපදේශකවරයා සඳහා අදහස් කිහිපයක්............................v

ඉගැන්වීමෙන් ලැබෙන ප්‍රීතිය...............................................1

උද්ගාමක සංවාදයන්...........................................................17

දැනුම ගැඹුරු කිරීමේ තේමාවන්........................................37

# උපදේශකවරයා සඳහා අදහස් කිහිපයක්

රූහි ආයතනයේ ප්‍රධාන පාඨමාලා මාලාවේ දෙවැන්න වන මෙම පොත අර්ථවත් සහ උද්ගාමක වූ සංවාදයකට දායක වීමට අපට හැකි කරවන හැකියාවන් පිළිබඳව සැලකිලිමත් වේ. පොතෙන් අවධානය යොමු කරන විශේෂිත සේවා ක්‍රියාව තුන්වන ඒකකයෙන් විස්තර කෙරේ. බලවත් බලවේගයන් පොදුවේ බුක්ති විඳින බැඳීම් කැබලිවලට ඉරා දමමින් සිටින ලෝකයක, සමාජයේ ජීවිතයට කේන්ද්‍රීය තේමාවන් ගවේෂණය කිරීම සඳහා ඔවුන්ගේ නිවෙස්වලට ගොස් මිතුරන් සහ අසල්වැසියන් හමුවීමේ පුරුද්ද, එය සංස්කෘතියේ කැපී පෙනෙන ලක්ෂණයක් බවට පත් වුවහොත්, වැඩිවන හුදකලාවීම නිසා ඇති වන සමහර රෝගවලට පිළියමක් වනු ඇත. මෙසේ නිර්මාණය කරන ලද සහයෝගීතාවයේ බැඳීම්, උද්දීප්ත සහ සුහදශීලී ප්‍රජාවන් ගොඩනැගීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට ඉවහල් වන බව එම ඒකකය යෝජනා කරයි.

අවශ්‍ය පරිපාලන ආයතන සහ නියෝජිතායතනවල සහාය ඇතිව කැපවූ මිතුරන්ගේ න්‍යෂ්ටියක් සම්බන්ධ කරගනිමින් අසල්වැසි ප්‍රදේශයක හෝ ගමක නිවෙස් සංචාරයට යාමේ තිරසාර වැඩසටහනක සංවිධානයේ මට්ටමක් ඉල්ලා සිටී. පොත හරහා කණ්ඩායමක් මෙහෙයවීමේදී, එවැනි අඛණ්ඩ උත්සාහයකට සම්බන්ධ වීමට සහභාගිවන්නන් සූදානම් වන බව උපදේශකයා මතක තබා ගත යුතුය. ඔවුන්ගේ අධ්‍යයනයේ සංරචකයක් ලෙස ඔවුන් සඳහා සංවිධානය කර ඇති සංචාරයන්, සේවා ජීවිතයක වැදගත් අංශයක් වන මෙම උත්සාහයන්ට වසරින් වසර සහභාගී වීමේ කැපවීමට තුඩු දිය යුතුය.

ආධ්‍යාත්මික සහ සමාජීය වැදගත්කම ඇති තේමාවන් ගවේෂණය කිරීමේ පැහැදිලි අරමුණ සඳහා නිවෙස්වලට සංචාරය කිරීමේ පුරුද්ද ප්‍රජාවක සංස්කෘතිය පැහැදිලිවම පොහොසත් කරයි. මේ සම්බන්ධයෙන් ඒ හා සමානව තීරණාත්මක වන්නේ නිවසේ සහ රැකියා ස්ථානයේ, පාසලේ සහ වෙළඳපොලේ සිදුවන බොහෝ අවිධිමත් සාකච්ඡාවන්ය. එසේ නම්, විටින් විට එදිනෙදා සංවාදයන් හට අධ්‍යාත්මික මූලධර්ම හඳුන්වා දීම, අවධානය යොමු විය යුතු හැකියාවකි. එහි සංවර්ධනය දෙවන ඒකකයේ කේන්ද්‍රස්ථානය වන අතර, මේ ආකාරයෙන්, තෙවන ඒකකයේ සිදු කරන ලබන අධ්‍යයනයන් සඳහා පදනමක් තැබීම සිදුකරයි.

මිතුරන් හා අසල්වාසීන් සමඟ අපගේ සංවාද උද්ගාමක වීමට නම්, ඔවුන් සමඟ වූ අපගේ අන්තර්ක්‍රියාවන් තුල ප්‍රීතිය ගෙන දීමට අපට හැකි විය යුතුය. "ඉගැන්වීමෙන් ලැබෙන ප්‍රීතිය" යන පළමු ඒකකයේ ආමන්ත්‍රණය කරන ලද විෂය මෙයයි. සාරයක් ලෙස ගත්විට, රූහි ආයතනය විසින් නිර්දේශ කරනු ලබන සියලුම සේවා ක්‍රියාවන් වලට ඇතුළත් වන්නේ, බහා'උ'ල්ලා තුමාගේ අණාවරණයේ සාගරයේන් අප සොයා ගන්නා දිව්‍යමය ප්‍රඥාවේ මුතු ඇට අන් අය සමඟ බෙදා හදා ගැනීමයි. පළමු ඒකකය අධ්‍යයනය කිරීම මෙම ලුහුබැඳීම තුළ ඇති ප්‍රීතිය පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීමට අදහස් කෙරේ. දෙවියන්වහන්සේගේ වචනය සහ එය අන් අය සමඟ බෙදාගැනීම ලැබීම මොනතරම් ආශීර්වාදයක්ද යන්න ගැන සිතා බැලීමට කොටස් කිහිපයක් හරහා සහභාගිවන්නන්ගෙන් ඉල්ලා සිටී. මෙම ක්‍රියාවෙන්, ඒකකය යෝජනා කරන්නේ, අප සේවයේ මාවතේ ගමන් කරන විට අපගේ පියවර කඩිනම් කරන ප්‍රීතිය උපදවන බවයි. එහෙත්, මෙම ගැඹුරු අධ්‍යාත්මික සත්‍යය සම්පූර්ණයෙන්ම ඒත්තු ගැන්වූ විට පවා, සේවය වෙන්කර දක්වන ගුණාංග සහ ආකල්ප ගැන සිතා බැලීමට අප අසමත් වුවහොත් ඉගැන්වීමේ ප්‍රීතිය අපට අහිමි විය හැකිය. මෙම ග්‍රන්ථ මාලාවේ පසුකාලීන බොහෝ පොත්වල සාකච්ඡාවට ලක්වන අභිමතාර්ථයන් මේවා වන අතර, 7 වන කොටසේ වෙන්වීමෙන් පටන් ගෙන කිහිපයක් පමණක් මෙහිදී විමර්ශනය කෙරේ. බහායි ලේඛනවලින් උපුටා දැක්වීම් තෝරාගැනීමක් මෙම ගුණාංගය පිළිබිඹු කිරීම සඳහා පදනම සකසයි, බාහිර සාධක මගින් සේවයේ ප්‍රීතිය අඩු නොකිරීමට නම් එය අත්‍යවශ්‍ය ගුණාංගයකි. වැදගත් දෙය නම් සහභාගිවන්නන් වෙන්වීම යනු පැත්තකට වී සිටීම හෝ සැලකිල්ලක් නොමැතිකම යන වැරදි අදහස අඟවමින් ඔවුන්ගේ අධ්‍යයනයෙන් ඉවත් නොවීමයි. වඩා හොඳ සහ වඩා හොඳ ප්‍රතිඵල අත්කර ගැනීමට අප උත්සාහ කරන විට අපගේ ශ්‍රමය තීව්‍ර කිරීමට සහ අපගේ සේවාවේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට අප නිරන්තරයෙන් උත්සාහ කළ යුතුය. මේ සඳහා උත්සාහයේ ස්වභාවය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් අවශ්‍ය වේ, එය 8 වන කොටසේ සලකා බලන මාතෘකාවකි. උපේක්ෂාව සහ කෘතඥතාවය, සේවා මාර්ගයට මූලික වන ආකල්ප දෙකක් වන අතර, එය ඊළඟ සහ අවසාන කොටසෙන් කෙටියෙන් සාකච්ඡා කෙරේ.

පොතේ දෙවන ඒකකය, "උද්ගාමකවූ සංවාදයන්", අවස්ථාවන් ඉඩදෙන විට අධ්‍යාත්මික මූලධර්ම වෙත යොමු කිරීමෙන් අවිධිමත් සංවාදයේ මට්ටම ඉහළ නැංවීමේ හැකියාව කෙරෙහි

අවධානය යොමු කරයි. එය විවිධ විෂයයන් පිළිබඳ කෙටි ප්‍රකාශ ගණනාවකින් සමන්විත වන අතර, ඒවා නිශ්චිත උපුටා දැක්වීම් නොවූවත්, 'අබ්දුල්-බහා තුමාගේ ප්‍රකාශයන් මත පදනම් වන අතර උන්වහන්සේ භාවිතා කළ බොහෝ වචන සහ වාක්‍ය ඛණ්ඩ ඇතුළත් වේ. විශ්වීය ආයාචනයක් ලෙස, එවා සියලු පසුබිම්වල මිනිසුන්ගේ අභිලාෂයන් සහ උත්සුකයන් ගැන කතා කරයි. ප්‍රකාශ අධ්‍යයනය කිරීමෙන්, සහභාගිවන්නන් 'අබ්දුල්-බහා තුමා' අධ්‍යාත්මික මූලධර්ම පැහැදිලි කළ ආකාරයෙන් අනුප්‍රාණයක් ලබා ගන්නා අතර, බහා'උ'ල්ලා තුමාගේ අනාවරණයේ සාගරයේ පවතින මුතු ඇට සොයා ගැනීමට ඔවුන් වෙහෙසෙන විට උන්වහන්සේ දෙස බැලීමේ පුරුද්ද අත්කර ගැනීමටත්, උන්වහන්සේගේ පියාගේ ඉගැන්වීම්වල අර්ථය සහ ඇඟවුම් තේරුම් ගැනීමත් සහ ඒවා අන් අය සමඟ නොමසුරුව බෙදා ගැනීමත්, එය බලාපොරොත්තු වන්නේය.

ඒකකයේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, චින්තනයේ අනුපිළිවෙල හඳුනා ගැනීමට සහ ඔවුනට ස්වභාවිකව ප්‍රකාශ කළ හැකිවන පරිදි එම අදහස් අභ්‍යන්තරීකරණය වන තුරු එය කීමට පුරුදු වීමට, සහභාගිවන්නන්ට එක් එක් ප්‍රකාශය කිහිප වතාවක් පරීක්ෂා කිරීමට අවස්ථාව ලබා දිය යුතුය. සමහරු, මුලදී, මූලික වශයෙන් ප්‍රකාශ කටපාඩම් කර ඒවා ඒකකයේ දිස්වන ආකාරයට අඩු වැඩි වශයෙන් පුනරුච්චාරණය කරනු ඇත. මෙය අපේක්ෂා කළ යුත්තකි. ධර්මීට පිළිබඳ ඔවුන්ගේ දැනුම ගැඹුරු වන අතරම ඔවුන්ගේ අත්දැකීම් වර්ධනය වන විට, ඔවුන්ට වඩා පුළුල් පරාසයක අන්තර්ගත සහ වඩාත් පොහොසත් වචන මාලාවකට ප්‍රවේශය ලැබෙනු ඇත, එය අන් අය සමඟ ඔවුන්ගේ අන්තර්ක්‍රියාවලින් පිළිබිඹු වනු ඇත. මෙම අවස්ථාවෙහිදී, සොයන දෙයඃ එනම් ඉගැන්වීම් පැහැදිලි කිරීමේ පහසුව සහ අබ්දුල්-බහා තුමාගේ චින්තනය සමඟ පෙලගැසීම දෙයාකාර බව උපදේශකයා විසින් හඳුනාගත යුතුය.

කණ්ඩායමේ සාමාජිකයින් එක් එක් ප්‍රකාශයේ අන්තර්ගතය ඉදිරිපත් කිරීමට ඉගෙන ගත් පසු, ඔවුන් වෙනත් ක්‍රියාකාරකමක් වෙත ගමන් කරන අතර, ඔවුන් අධ්‍යයනය කර ඇති අදහස් ඔවුන්ගේ පවුල්, මිතුරන් සහ එකට වැඩකරන්නන් සම්බන්ධ ගැටළු සමඟ සම්බන්ධ කිරීමට ඔවුන් දිරිමත් කරනු ලැබේ. මේ සඳහා, සංවාදයේ දී මතු කරන ලද මාතෘකා සහ ප්‍රශ්න කිහිපයක් ගැන සිතා බැලීමට සහ සාකච්ඡාවකට අදහස් හඳුන්වා දීමේ හැකියාව ලබා දෙන්නේ කුමන ඒවාද යන්න තීරණය කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටී. ප්‍රකාශ කිහිපයක් සඳහා, 'අබ්දුල්-බහා තුමා' විසින් ප්‍රකාශ කරන ලද අධ්‍යාත්මික මූලධර්ම සෑම තැනකම සිටින මිනිසුන්ගේ අවධානයට ලක්වන කරුණු කෙරෙහි ආලෝකය විහිදුවන ආකාරය නිදර්ශනය කිරීම සඳහා උදාහරණයක් හෝ දෙකක් සඳහන් කර ඇත. පොත අධ්‍යයනය කිරීම තවමත් සිදුවෙමින් පවතින අතරතුර, සෑම සාමාජිකයෙකුටම එක් එක් ප්‍රකාශයක් තෝරාගැනීමට සහ එහි අඩංගු අදහස් පිළිබඳව කතා කිරීමට පුද්ගලයන් කිහිප දෙනෙකු තෝරා ගැනීමට උපකාර කිරීමට උපදේශකවරයාට හැකි නම්, මෙම අභ්‍යාසය වඩා හොඳ ඵල ලබා දෙනු ඇත. මේ ආකාරයට, සහභාගිවන්නන් එකට මුණගැසෙන විට, ඔවුන් නිරත වූ සංවාදවල ගතිකත්වය එකිනෙකාට විස්තර කිරීමට කාලය වෙන් කළ හැකිය.

ඒකකයේ සෑම ප්‍රකාශයක් සඳහාම, කටපාඩම් කිරීම සඳහා බහා'උ'ල්ලා තුමාගේ ලේඛනවල ඡේද කිහිපයක් ඇතුළත් වේ. රූහි ආයතනය කටපාඩම් කිරීම කෙරෙහි අවධාරණය කර ඇති අතර, එය මාලාවේ පළමු පොතේ දැනටමත් පැහැදිලිව පෙනෙන අතර, 2 පොතෙන් එය වඩාත් පැහැදිලිව පෙනේ. මේ වන විට, සහභාගීවන්නන් ලේඛන වලින් වූ ඡේද නැවත නැවතත් මනසට ගෙන ඒමෙන් ලැබෙන අධ්‍යාත්මික පෝෂණය පිළිබඳව දැනුවත්ව සිටින බව උපකල්පනය කෙරේ. එසේ නම්, මෙම පොතෙහි, ඔවුන් දෙවියන්වහන්සේගේ වචනය මිනිස් හදවතට ඇති කරන බලපෑම පිළිබඳව තවදුරටත් මෙනෙහි කරනු ඇති අතර, තුන්වන ඒකකයේ, දෙවැන්නෙහි මෙන්, ඔවුන් තම කතාවේදී ලේඛනවල ඇති මූලධර්ම සහ අදහස් ඉදිරිපත් කිරීමට ඉගෙන ගනු ඇති අතර, සුදුසු විට, ඡේද ඍජුවම උපුටා දක්වනු ඇත. ඉගැන්වීම් නිවැරදිව පැහැදිලි කිරීම, ඒවායේ පිරිසිදු ස්වරූපයෙන් ඒවා අන් අයට ලබා දීම, අප සේවා මාවතේ ගමන් කරන විට වර්ධනය කර ගැනීමට උත්සාහ කරන හැකියාවන් අතර වේ. එය ආරම්භ කිරීමට ඇති විශිෂ්ට ස්ථානය වන්නේ 'අබ්දුල්-බහා තුමාගේ පැහැදිලි කිරීම් අධ්‍යයනය කිරීම සහ උන්වහන්සේ කළ ආකාරයෙන් ඒවා ප්‍රකාශ කිරීමට උත්සාහ කිරීම වන අතර එය දෙවන ඒකකයේ ව්‍යුහයට පාදක වන පරිශ්‍රයද වේ.

ඉහත දක්වා ඇති පරිදි, තුන්වන ඒකකය, "දැනුම ගැඹුරු කිරීමේ තේමාවන්", මෙම පොතේ ආමන්ත්‍රණය කර ඇති සේවා ක්‍රියාව වෙත යොමු කරයි - එනම්, ප්‍රජාවේ ජීවිතයට අත්‍යවශ්‍ය සාකච්ඡාවල නිරත වීමේ පැහැදිලි අරමුණ සඳහා මිතුරන් සහ අසල්වාසීන් හමුවීමට යෑමයි. ඒකකය තුළ සංවාද වර්ග තුනක් සැලසුම් කර ඇති අතර, ඒ සෑම එකක් සඳහාම නිශ්චිත අන්තර්ගතයක් යෝජනා කෙරේ. පළමු වර්ගය ගමක හෝ අසල්වැසි ප්‍රදේශයක පදිංචිකරුවන් සමඟ ක්‍රමානුකූල සංචාර වැඩසටහනක් තුළ ගවේෂණය කළ යුතු තේමා මාලාවක් වටා කැරකෙයි. විස්තර කර ඇති අන්තර්ගතය උනන්දුවක් දක්වන ප්‍රේක්ෂකයින් සමඟ විවිධ ආකාරවලින් හොඳින් බෙදා ගත හැකි වුවද,

තේමාවල මුල් අභිප්‍රාය වන්නේ - පවුලක සාමාජිකයින්ට ධර්මය පිළිබඳ ඔවුන්ගේ දැනුම ගැඹුරු කිරීමට අවස්ථාව ලබා දීම - වඩාත්ම උචිත ලෙස පවති. පසුව, ඒකකයේ වැඩි කොටසක්, මේ ආකාරයේ සංවාදයකට ලබා දී ඇත.

එහෙත්, විශේෂයෙන් කුඩා සහ කුඩා භූගෝලීය ඒකක ලෙස, ගම සහ නාගරික අසල්වැසි ප්‍රදේශ මට්ටම දක්වාම, උපදේශකයින්, නව යෞවන කණ්ඩායම්වල සජීවිකාරකයින් සහ ළමා පන්ති ගුරුවරුන් ලෙස කටයුතු කරයි හැකි පුද්ගලයින් සංඛ්‍යාවේ ඉහළ යාමක් දක්නට ලැබීම නිසා, මෑත වසරවල නිවෙස් සංචාරය කිරීමේ ක්‍රියාවේ නව මානයන් වෙත ගොස් ඇත. සැලකිය යුතු කරුණක් නම්, මෙම ක්‍රියාව ධර්මය පිළිබඳ දැනුම ප්‍රචලිත කිරීමේ අරමුණ සඳහා පමණක් නොවේ; නව යෞවනයින්ගේ අධ්‍යාත්මික සවිබල ගැන්වීම සහ දරුවන්ගේ අධ්‍යාත්මික අධ්‍යාපනය සඳහා වූ වැඩසටහන් සාර්ථක ලෙස දිග හැරීමට ද අත්‍යවශ්‍ය බව පෙන්වා දී ඇත. මෙහි දී පැහැදිලි වී ඇති දෙය නම්, සජීවිකාරකයින් සහ ගුරුවරුන් විසින් මෙම වැඩසටහන් දෙකෙහිම තරුණ දරුවන්ගේ දෙමාපියන් වෙත නිරන්තර සංචාරයන් සිදු කළ යුතු අතර, ඔවුන් හැඩගැසීමක් ලබාදෙන සංකල්ප සහ ප්‍රවේශයන් පිළිබඳ සාකච්ඡා කළ යුතු බවයි. එවැනි සාකච්ඡා දෙවන ආකාරයේ සංවාදයක් ඇති කරයි, එය 14 සහ 15 කොටස්වල විමර්ශනය කෙරේ. අනාගත පාඨමාලා වලදී අධ්‍යාපනික වැඩසටහන් දෙක පිළිබඳව සහභාගිවන්නන් වඩාත් හුරුපුරුදු වන බැවින්, මෙම කොටස්වල ආවරණය වන අන්තර්ගතය පුළුල් නොවේ. නමුත් මෙම ආකාරයේ සංවාදයේ වැදගත්කම පිළිබඳව ඔවුන් දැනුවත්ව සිටීම සහ දරුවන්ගේ ගුරුවරුන් සහ නව යෞවන කණ්ඩායම්වල සජීවිකාරකයින් දෙමාපියන් හමුවීමට යෑමට කැටුවයාම මෙම මුල් අවධියේදී ඉතා ඵලදායී බව ඔප්පු කළ හැකිය.

ඒකකයේ අපේක්ෂා කරන තුන්වන ආකාරයේ සංවාදයක් ඉතා විශේෂ අරමුණක් ඉටු කරයි. බොහෝ යෞවන යෞවනියන් ලෝකයේ අභිවෘද්ධියට දායක වීමට ඔවුන්ගේ දැඩි ආශාව ප්‍රකාශ කළ හැකි මාර්ග සොයමින් සිටිති. භාවිතයට ගනු ඇතැයි ආශාවෙන්, නොඉවසිල්ලෙන් සිටින සමාජය වෙනස් කිරීමේ යෝධ ධාරිතාවක් සහිත සංචිතයක් ඔවුන් නියෝජන කරයි. යෞවන කාලයට අනන්‍ය වූ අවස්ථාවන් සහ වගකීම් ගැන ආවර්ජනය කරන සම වයසේ මිතුරන් අතර සංවාදයක්, එහි සියලු ශක්තිය සහ අසාමාන්‍ය විභවයන් සමඟින්, බොහෝ විට, සේවාව පිළිබඳ සාකච්ඡාවකට තුඩු දිය හැකි අතර, ලොව පුරා ගම්වල සහ අසල්වැසි ප්‍රදේශවල සිදු කෙරෙන වැඩ කටයුතු කෙරෙහි උනන්දුවක් අවුළුවාලිය කළ හැකිය. අනෙක් අතට, බොහෝ කැමැත්තෙන්, ළමා පන්ති ගුරුවරුන් සහ නව යෞවන කණ්ඩායම්වල සජීවිකාරකයින් ලෙස නැගී එන පරම්පරාවන්ට අධ්‍යාත්මික අධ්‍යාපනය ලබා දීමේ හැකියාව ලබා ගැනීමේ මාධ්‍යයක් ලෙස ආයතනික පාඨමාලා සඳහා සම්බන්ධ වීමට කෙරෙන ආරාධනය සාදරයෙන් පිළිගනු ඇත. 9 සහ 10 කොටස් මගින් මෙම ආකාරයේ සංවාදයකදී ගවේෂණය කළ හැකි අදහස් කිහිපයක් දක්වා ඇත.

අර්ථවත් සංවාද ආරම්භ කිරීමට සහ පවත්වා ගැනීමට පුද්ගලයන්ට හැකිවන හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා, ඒකකයේදී, ඇත්ත වශයෙන්ම, යෝජනාකර ඇති පුළුල් තේමාවන් සහ අනුරූප අන්තර්ගතයෙන් ඔබ්බට යා යුතුය. පැහැදිලි ලෙස අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාවට අමතරව, සහභාගිවන්නන් අවශ්‍ය ආකල්ප සහ අධ්‍යාත්මික ගුණාංගද වර්ධනය කර ගත යුතුය. මේවා බොහෝමයක් ඒකකයේ දිග හැරෙන විස්තරයේ අභ්‍යන්තරයෙන් තිබේ, නමුත් ප්‍රශ්නගත හැකියාවන් සඳහා ඔවුන්ගේ වැදගත්කම 4 වන කොටසෙහි පැහැදිලිව දක්වා ඇත, සංචාරයක් සඳහා සූදනම් වීමේදී අපගේ හදවත් සහ මනස පිරවිය යුත්තේ කුමන ආකාරයේ හැඟීම් සහ සිතුවිලිද යන්න ගැන සහභාගිවන්නන් සිතයි, එසේම 5 වන කොටසෙහි, ඔවුන් නිහතමානීකමේ ගුණාත්මකභාවය පිළිබිඹු කරයි. මෙම කොටස්වලට සහභාගිවන්නන් විසින් ප්‍රමාණවත් අවධානයක් ලබාදෙන බවට සහතික කිරීමට උපදේශකයාට අවශ්‍ය වනු ඇත, මන්ද, අප කෙතරම් දැනුමක් ලබා ගත්තද, අපට කෙතරම් හොඳින් අදහස් ප්‍රකාශ කළ හැකි වුවද, අපගේ සංවාදයේ සඵලතාවය රඳා පවතින්නේ අප එවා වෙත ගෙන එන ගුණාංග සහ ආකල්ප මතය.

මෙම පොත් මාලාවේ විස්තර කර ඇති සේවා ක්‍රියාවන්, ප්‍රජාවක වර්ධනයට සහ සංවර්ධනයට කේන්ද්‍රීය වුවද, අධ්‍යයනයෙන් සහ ක්‍රියාවෙන් පුද්ගල ධාරිතාව ඉහළ නැංවීමට උත්සාහ කරන ක්‍රියාවලියක සියලුම අංගවලට වඩා ඉහළින් පවතින බව සඳහන් කළ යුතුය. සෑම උපදේශකයෙකුම අවබෝධ කර ගත යුතු දෙය නම්, මෙම ක්‍රියාවන් එකිනෙක මත ගොඩනගා, පොතෙන් පොතට සංකීර්ණත්වයෙන් වැඩි වන බවයි. එක් එක් සේවා ක්‍රියාව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට ඉගෙන ගැනීම, අනුගමනය කරන ඒවා ඉටු කිරීමට අවශ්‍ය ධාරිතාවයට තීරණාත්මක බව ඔප්පු කරයි. මෙම පොතේ යෝජනා කර ඇති පරිදි, නිවසකට කිහිප වතාවක්ම සංචාරය කරමින් අඛණ්ඩ සංවාදයක් පවත්වා ගැනීම, 1 පොතේ දිරිගන්වන ලද තමාගේම හෝ තවත් කිහිප දෙනෙකුගේ සහයෝගයෙන් නිතිපතා අධ්‍යාත්මික රැස්වීමක් පැවැත්වීමේ ක්‍රියාකාරකම්වලට වඩා පැහැදිලිවම වැඩි ඉල්ලුමක් පවතී.

තවද, වඩාත් සංකීර්ණ සේවා ක්‍රියාවන් ඉදිරියට ගෙන යාමට, සහභාගිවන්නන් හට මෙහි සඳහන් කර ඇති හැකියාවන් තුළ ඉදිරියට යාම අත්‍යවශ්‍ය වන්නේ කෙසේදැයි බැලීම අපහසු නොවනු ඇත.

1 වන පොතේ හඳුන්වාදීමේ ප්‍රකාශවල සඳහන් කර ඇති පරිදි, ලොව පුරා ආයතනික පාඨමාලා සඳහා සහභාගිවන්නන් විවිධ පසුබිම්වලින් පැමිණෙන අතර, මුලදී, බහායි ඉගැන්වීම් සමග විවිධ මට්ටමේ හුරුපුරුදුකමක් ඇත. ඔවුන් මෙම දෙවන පොත ආරම්භ කරන විට, ඔවුන් සැබවින්ම, පාඨමාලා මගින් විවෘත කරන ලද සේවා මාවතට පිවිසෙනු ඇත. නමුත් සමහර වෙනස්කම් පවතී. යෞවනයන් සම්බන්ධයෙන් ගත් කල, නිදසුනක් වශයෙන්, ඔවුන් ළමා හා නව යෞවනයන් සඳහා වන අධ්‍යාපනික වැඩසටහන් හරහා ගොස් නොමැති නම්, පොතේ ඉදිරිපත් කර ඇති බොහෝ ප්‍රකාශ සහ තේමා ඔවුන්ට අලුත් වනු ඇති අතර, එවා අධ්‍යයනය ඔවුන්ට ධර්මට පිළිබඳ ඔවුන්ගේම දැනුම ගැඹුරු කර ගැනීමට මාධ්‍යයක් ලෙස සේවය කරනු ඇත. කණ්ඩායමේ සෑම සාමාජිකයෙකු තුළම අවබෝධය පෝෂණය කිරීමට අවශ්‍ය නම්‍යශීලී බව සහ නිර්මාණශීලීත්වය ප්‍රදර්ශනය කිරීමට උපදේශකයා මේ සම්බන්ධයෙන් සූදානම්ව සිටිය යුතු අතර, පාඨමාලාවේ ප්‍රධාන පරමාර්ථය, සහභාගිවන්නන්ට අර්ථවත් සහ උද්ගාමක වන සංවාදයක නියැලීමට හැකියාව ලබා දෙන බවට වග බලා ගත යුතුය. එපමණක්ද නොව, පොත සේවයේ යොදවන දහස් ගණනක් වූ ප්‍රදේශ තුළ, ඒකක තුන දයක වීමට අපේක්ෂා කරන ප්‍රජාව ගොඩනැගීමේ ක්‍රියාවලිය එකම සංවර්ධන ලක්ෂ්‍යයක නොපවතී. ඉගෙන ගන්නා දේ ක්‍රියාවට නැංවීමෙන්, එක් ප්‍රදේශයකින් තවත් ප්‍රදේශයකට තරමක් වෙනස් හැඩයක් ලබා ගත හැකි අතර, මෙය ද, මෙම පිටු හරහා කණ්ඩායමක් රැගෙන යන සෑම සාමාජිකයෙකුගේම අවශ්‍යතා සඳහා උපදේශකයෙකු ප්‍රතිචාර දැක්විය යුතු සැලකිල්ල සහ පරිපූර්ණත්වය පිළිබඳ ඇඟවීමක් සපයයි.



# ඉගැන්වීමෙන් ලැබෙන ප්‍රීතිය

## අරමුණ

ඉගැන්වීමේ ප්‍රීතිය පවතින්නේ දෙවියන්වහන්සේගේ
වචනය අන් අය සමඟ බෙදාගැනීමේ
ක්‍රියාව තුළ බව අගය කිරීම

## 1 වන කොටස

*සේවය සඳහා නැගී සිටීම* යනු අධ්‍යයනය සහ ක්‍රියාව ඒකාබද්ධ කිරීමට උත්සාහ කරන රුහි ආයතනය විසින් පිරිනමනු ලබන පාඨමාලා මාලාවේ දෙවැන්නයි. එහි පරමාර්ථය වන්නේ ඔබ ද්විත්ව අරමුණක්: එනම් ඔබේම අධ්‍යාත්මික හා බුද්ධිමය වර්ධනයක් ඇති කර ගැනීමට සහ සමාජයේ පරිවර්තනයට දායක වීම ඉටු කිරීමට උත්සාහ කරන විට ඔබ ඇතුළුවී සිටින සේවා මාර්ගය ඔස්සේ තවදුරටත් ඉදිරියට යාමට ඔබට උපකාර කිරීමයි. පළමු පාඨමාලාවේ ඔබගේ සහභාගීත්වයෙන්, අප යොමු කරන මාර්ගය බහා'උ'ල්ලා තුමාගේ ලේඛනවල අපේක්ෂා කරන පරිදි නව ලෝක ක්‍රමයක් පිළිබඳ ඉලක්කය වෙත අපගේ දැස් යොමු කර ඇති ක්‍රියාවන් වන සේවා ක්‍රියා මාලාවකින් නිර්වචනය කර ඇති බව ඔබ දැනටමත් අවබෝධ කර ගත යුතුය. මේ අනුව, සේවා මාර්ගයේ ගමන් කිරීම යනුවෙන් අප හඳුන්වන බොහෝ දේ සමන්විත වන්නේ උන්වහන්සේගේ ඉගැන්වීම් අපගේම ජීවිතවලට සහ මනුෂ්‍ය වර්ගයාගේ ජීවිතයට අදාළ කර ගැනීමට අප දරන උත්සාහයයි. උන්වහන්සේගේගේ අනාවරණය පිළිබඳව උන්වහන්සේම මේ අයුරින් පවසයි:

> **"මාගේ සේවකයිනි! මාගේ ශුද්ධවූ, මාගේ දිව්‍යමය අනාවරණය පතුලේ අසාමාන්‍ය දීප්තියකින් යුත් මිල අධික වූ ගිණිය නොහැකි තරම් මුතු ඇට සැගවී ඇති සාගරයකට සමාන කළ හැක. තමන්ම උන්නදුවී මේ සාගරයේ වෙරළකරා ලගාවී, තමන්ගේ සෙවීමේ උනන්දුවට හා තමන් ගත් උත්සහයන්ට සාපේක්ෂකව, දෙවියන්වහන්සේගේ වෙනස් කළ නොහැකි, සැගවුන පත්‍රකවල කල් තබා නියම කර ඇති වාසි ලබා ගැනීමට උත්සහ කිරීම සෑම සොයන්නෙකුගේම යුතුකුමකි."[1]**

මෙම පළමු ඒකකය තුළ, බහා'උ'ල්ලා තුමාගේ අනාවරණයේ සාගරයේ පවතින ප්‍රඥාවේ මුතු සොයාගෙන ඒවා අන් අය සමග බෙද ගන්නා විට අපගේ සිතුවිලි අපගේ හදවත් පුරවන ප්‍රීතිය වෙත හැරේ. උන්වහන්සේගේ ලේඛනවල දක්නට ලැබෙන දිව්‍යමය මඟ පෙන්වීමේ මුතු ඇට කෙතරම් උත්කෘෂ්ට ලෙස විචිත්‍රවත් දැයි ඔබ 1 වන පොත අධ්‍යයනය කිරීමෙන් දැනටමත් දැක ඇත. අපි තවත් උපුටා ගැනීම් කිහිපයක් ගැන මෙනෙහි කරමු:

> **"දෙවියන්වහන්සේගේ භාෂණය පහනකි, එහි ආලෝකය මෙම වදන් වේ: ඔබ එක ගසක ඵලය, එක අත්තක කොළය.""[2]**

> **"මාගේ දර්ශණයෙහි ප්‍රියතම වනුයේ යුක්තියයි; ඔබ මා කැමති නම් එයින් ඉවත නොයන්න. මට ඔබ කෙරෙහි විශ්වාසය තැබිය හැකිවන පරිදි එය නොසලකා නොහරින්න."[3]**

> **"ඔබ ජීවත් වන යුගයේ අවශ්‍යතා ගැන උත්සුක ලෙස සැලකිලිමත් වන්න, එසේම එහි අවදනම් තත්වයන් සහ අවශ්‍යතා මත ඔබේ සාකච්ඡා මධ්‍යගත කරන්න."[4]**

> **"සියලු මිනිසුන් මවා ඇත්තේ දිනෙන් දින දියුණු වන ශිෂ්ටාචාරයක් ඉදිරියට ගෙන යාමටයි."[5]**

> **"ලෝකය ආක්‍රාන්තියට පත්වන අතර, සදාකාලික දෙය නම් දෙවියන්වහන්සේගේ ප්‍රේමයයි."[6]**

> **"ඔබ මාගේ ප්‍රදීපය වන අතර ඔබ තුල ඇත්තේ මාගේ ආලෝකයයි. ඔබගේ දීප්තිය එයින් ලබාගෙන මා හැර අනෙකෙක් නොසොයන්න. මම ඔබ පොහොසත් කර මවා ඔබ මත මාගේ අනුග්‍රහයන් පතුරුවා ඇති බැවිනි."[7]**

කාලයත් සමඟ මෙම කෙටි ඡේද මතක තබා ගැනීමට ඔබට අවශ්‍ය විය හැකිය.

## 2 වන කොටස

මෙම ඒකකයේ ප්‍රධාන තේමාව පිළිබඳ ඔබේ සාකච්ඡා ආරම්භ කිරීමට, පෙර කොටසේ උපුටා දක්වන ලද ඡේදය නැවත කියවා පහත අභ්‍යාස සිදු කරන්න:

1. පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න.

   අ. අපම.................................................................................බහා'උ'ල්ලාතුමාගේ අනාවරණය නමැති සාගරයේ ......................... කාරා ...................................... ................................ අපගේ යුතකුමයි.

   ආ. බහා'උ'ල්ලතුමාගේ අනාවරණය නමැති සාගරයේ වෙරලකරා ලගාවී තමන්ගේ ................................................ උනන්දුවට හා තමන් ගත් .................................................... සාපේක්ෂකව, දෙවියන්වහන්සේගේ වෙනස් කළ නොහැකි සැගවුන පත්‍රකවල කල් තබා නියම කර ඇති ..................................... ලබා ගැනිමට අපි උත්සාහ කළ යුතුයි.

   ඇ. බහා'උ'ල්ලතුමාගේ අනාවරණය නමැති සාගරයෙන් අප ලබා ගන්නා ප්‍රතිලාභ සමානුපාතික වනුයේ.............................................................................................................. ...........................................................................................................................

2. "තමන්ම උනන්දුවී" යන්නෙහි තේරුම කුමක්ද? ........................................................................... ..........................................................................................................................................

3. යමක් "ලබාගැනිමට උත්සාහ කිරිම" යනුවෙන් අදහස් වන්නේ කුමකද්?............................................ ..........................................................................................................................................

4. සැම සොයන්නෙක්ම ලබාගැනිමට උත්සාහ කළ යුත්තේ කුමක්ද?...................................................... ..........................................................................................................................................

5. එක් දෙයක් තවත් දෙයකට "සාපේක්ෂ්වීම" යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?............................ ..........................................................................................................................................

6. අපගේ සෙවීමේ උත්සාහයන්ට සාපේක්ෂ්ව බහා'උ'ල්ලාතුමාගේ අනාවරණයේ සාගරයේ වාසි අපට ලැබෙන බව එතුමා අපට පවසයි.

   අ. මේ වාසි ලබාගැනිම සඳහා අප කරන උත්සාහයන් පිළිබඳ උදහරණ කීපයක් දෙන්නඃ............................................................................................................................. ............................................................................................................................. ............................................................................................................................. ............................................................................................................................. ............................................................................................................................. .............................................................................................................................

   ආ. අපට ලැබෙන වාසි පිළිබද උදහරණය කීපයක් දෙන්නඃ..................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

**3 වන කොටස**

බහා'උ'ල්ලතුමාගේ අනාවරණය, මිල කළ නොහැකි වටිනාකමකින් යුත් මුතු ගැඹුරේ පවතින සාගරයක් වැනි බව දැන, එහි ප්‍රතිලාභ භුක්ති විඳීමට සහ එහි වෙරළට ළඟා වීමට අන් අයට උපකාර කිරීමට අප සැම කෙනෙකුම උපරිම උත්සාහයක් දරයි. නමුත් මෙම සාගරයේ වෙරළ අපෙන් කොපමණ දුරින්දැයි අප අපෙන්ම අසාගත හැකිය. බහා'උ'ල්ලා තුමා මෙසේ ප්‍රකාශ කරයිඃ

> **"එම්බා මාගේ සේවකය! එකම සත්‍ය දෙවියන් වහන්සේ මට සාක්ෂ්‍ය වන සේක! මේ අති ශ්‍රේෂ්ඨ, මේ ගැඹුරු මිණිය නොහැකි රළපතරින් හෙබි සාගරය ඔබට සමීපය. පුදුමාකාර ලෙසින් ඔබට සමීපය. එය ඔබගේ ජීවන ධමනියටත් වඩා ඔබට සමිප බැව් දැක ගන්න! ඔබ කැමතිනම් පමණක්, ඇසිපිය හෙලන වේගයෙන් මේ අවිනාශී අනුග්‍රහය, මේ දෙවියන්වහන්සේ විසින් දෙන ලද වරප්‍රසාදය, මේ අදෘෂ්‍ය පරිත්‍යාගය, මේ ඉතා ප්‍රබල හා කිව නොහැකි තරම් කීර්තිමත් දීමනාව කරා ළඟා වී එය භුක්තිවිඳිය හැක."[8]**

1. "මේ අති ශ්‍රේෂ්ඨ, මේ ගැඹුරු මිණිය නොහැකි රළපතරින් හෙබි සාගරය" යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද?..............................................................................................................................

   .......................................................................................................................................
2. මේ සාගරය අපට කොපමණ සමීපද?....................................................................................................

   .......................................................................................................................................
3. මේ සාගරය කරා අපට කොපමණ ඉක්මණින් ළඟා විය හැකිද?...................................................

   .......................................................................................................................................
4. පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න.

   අ. බහා'උ'ල්ලාතුමාගේ අනාවරණය නමැති අති ශ්‍රේෂ්ඨ සාගරය ..................................................................... අපට සමීපය.

   ආ. බහා'උ'ල්ලතුමාගේ අනාවරණය නමැති සාගරය ............................................... අපගේ ජීවන ධමනියටත් වඩා අපට සමිප ..................................................................

   ඇ. අපි කැමතිනම් පමණක් ............................................. වේගයෙන් ........................................................................................................ උන්වහන්සේගේ අනාවරණය නමැති සාගරය කරා ලගාවී, .....................................

   ඈ. ඇසිපිය හෙලන වේගයෙන් මේ අවිනාශී අනුග්‍රහය ................................................................................................................. ............................................................................................................. කරා ලගා වී උන්වහන්සේගේ අනාවරණය නමැති සාගරයෙන් භුක්තිවිඳින්න.

## 4 වන කොටස

බහා'උ'ල්ලා තුමාගේ අනාවරණයේ සාගරයේ වෙරළට ළඟා වූ පසු, අපි එහි නිධානවලින් උකහා ගන්නා අතර, අපගේම අධ්‍යයනයෙන්, යාච්ඤාවෙන් සහ භාවනාවෙන් සහ උන්වහන්සේගේ ධර්මයට සහ මනුෂ්‍යත්වයට සේවය කිරීමට අප දරන උත්සාහය තුළ අප නොකඩවා සොයා ගන්නා වූ, එහි දිව්‍යමය මඟ පෙන්වීමේ මුතු ඇට අන් අය සමඟ නිදහසේ සහ කොන්දේසි විරහිතව බෙදාහදා ගනිමු. මෙම රාජකාරියේ පරිශුද්ධභාවය පිළිබඳ නිරන්තර මතක් කිරීමක් උදෙසා පහත ඡේදය කටපාඩම් කිරීමට ඔබට යම් කාලයක් ගත කිරීමට අවශ්‍ය විය හැකිය.

> **"දෙවියන්වහන්සේගේ මාර්ගයෙහි සැරිසරන්නාණෙනි! උන්වහන්සේගේ වරප්‍රසාද සාගරයෙන් ඔබගේ කොටස ලබාගන්න. එහි පතුලේ සැඟවී ඇති දේවල් අහිමිකර නොගන්න. ඔබ එහි අඩංගු වස්තුවෙන් කොටසක් ලබාගත් අයගේ ගණයට වැටෙන්න. මේ සාගරයෙන් පිණිබිඳුවක පමණ ප්‍රමාණයක් පෘථිවියේ සහ ස්වර්ගයේ ඇති සියල්ලම මත හෙළුවහොත් ඔවුන් සවර්බලධාරීවූත්, සර්වඥවූත්, සර්වප්‍රාඥවූත් දෙවියන්වහන්සෙගේ දීමනාවන්ගෙන් පොහොසත් කිරීමට සෑහෙනවා ඇත. නෛෂ්ක්‍රම්‍යයේ අත්වලින් එහි ජීවදායක ජලය ඇදගෙන, සියළුම නිර්මාපිත දේවල් මිනිසුන් විසින් ඇතිකළ සීමාවන්ගෙන් පවිත්‍රකර, දෙවියන්වහන්සෙගේ ප්‍රබල ආසනයවූ මේ පවිත්‍ර වූ දීප්තිමත් ස්ථානායට ලගාවිය හැකි පරිදි ඒවා මත විසිරුවන්න."[9]**

## 5 වන කොටස

එවාට අවශ්‍ය අධ්‍යයනය සහ ක්‍රියාකාරකම් සිදු කරමින්, අප ආයතනයේ පාඨමාලා හරහා ඉදිරියට යන විට, අපගේ සේවා හැකියාව වර්ධනය වන අතර, අපගේ හදවත්වලට ඉමහත් ප්‍රීතිය ගෙන දෙන සහ අපගේ ද්විත්ව අරමුණ ඉටුකර ගැනීමට අපට සහාය වන සේවා ක්‍රියාවන් - එනම් දරුවන්ගේ අධ්‍යාත්මික අධ්‍යාපනය සඳහා වූ පන්ති වල ඉගැන්වීම, නව යෞවනයින් ඔවුන්ගේ අධ්‍යාත්මික සවිබල ගැන්වීම සඳහා වූ වැඩසටහනකට සම්බන්ධ කර ගැනීම සහ මිතුරන් පිරිසකට ප්‍රධාන අනුපිළිවෙලෙහි පොත් අධ්‍යයනය කිරීමට උපකාර කිරීම වැනි ක්‍රියා සිදු කිරීමට අපට හැකි වනු ඇත. මෙම ගමන පුරාවටම, අප බාල මහලු අන් අය සමඟ බෙදා ගන්නා, දෙවියන්වහන්සේගේ වචනය, අපගේ නිරන්තර අනුප්‍රාණයේ මූලාශ්‍රය වනු ඇත. එසේ නම්, එහි බලය සහ මිනිස් හදවතට එහි බලපෑම ගැන අප නිතර මෙනෙහි කිරීම සුදුසුය. පහත උපුටා දැක්වීම තුල, බහා'උ'ල්ලා තුමා මෙම බලය ගැන කථා කරයි:

> **"දේව වචනය, මිනිසුන්ගේ හදවත් තුල සිටුවා ඇති පැලෑටියකට සමාන කළ හැක. මේ පැලෑටියේ මුල් තදින් අල්ලාගෙන එහි අතු ස්වර්ගය කරා හා එයිනුත් එපිටට විහිදී යාහැකි වන පරිදි ප්‍රඥාවේත්, ශුද්ධවූ සහ පවිත්‍ර වූ වචන වලත් ජීව ජලයෙන් එහි වැඩීමට අනුබල දීම ඔබගේ යුතුකමයි"[10]**

1. දෙවියන්වහන්සේගේ වචනය සැසඳිය හැක්කේ කුමකටද? ..........................................................

   ..........................................................................................................................

2. දෙවියන්වහන්සේගේ වචනය නමැති ගසේ මුල් සිටුවනු ලැබ ඇත්තේ කොහේද?.....................

   ..........................................................................................................................

3. මෙම ගසේ වර්ධනය පෝෂණය කළ යුත්තේ කෙසේද?..............................................................

   ..........................................................................................................................

4. මෙම ගස කෙතරම් උසකට වර්ධනය විය හැකිද?....................................................................

   ..........................................................................................................................

5. දෙවියන්වහන්සේගේ වචනය අන් අය සමඟ බෙදගැනීම අතිශයින් වැදගත් වන්නේ මන්දැයි වාක්‍ය කිහිපයකින් පැහැදිලි කරන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

**6 වන කොටස**

අපගේ එදිනෙද ජීවිතයේ අප නියැලෙන විවිධ ක්‍රියාකාරකම් ගැන අපි සිතමු. අපි අපගේ ශරීරය පෝෂණය කරමු. අපි නව දැනුම ලබා ගැනීමට සහ අපගේ මානසික හැකියාවන් පුළුල් කිරීමට ඉගෙන ගනිමු. සමාජයේ ඵලදායී සාමාජිකයන් ලෙස ජීවත් වීමට අපට හැකි වන පරිදි අපි වැඩ කර කුසලතා වර්ධනය කරමු. අපි ක්‍රීඩා සහ විනෝදස්වාදයේ නිරත වෙමු. අපගේ බුද්ධිමය ප්‍රගතිය සහ භෞතිකමය යහපැවැත්ම සඳහා වැදගත් වන මෙවැනි ක්‍රියාකාරකම් රාශියක් අපගේ කාලයෙන් විශාල කොටසක් ගනී. නමුත් සෑම දිනකම, අප යාච්ඤාවේ යෙදෙන විට; තනිව හෝ මිතුරන් සමඟ, දිව්‍යමය ඉගැන්වීම් පිළිබඳ අපගේ දැනුම අප ගැඹුරු කරගන්නා විට; නොඑසේ නම්, ඕනෑම අසංඛ්‍යාත ආකාරයකින්, අප අවට සිටින අයට බහා'උ'ල්ලා තුමාගේ අනාවරණයේ සාගරයේ සැඟවී ඇති මුතු ඇට සොයා ගැනීමට උපකාර කරන යන අධ්‍යාත්මිකත්වය ආරෝපණය වූ එම විශේෂ අවස්ථා තිබේ. මෙම අවස්ථාවන් මිනිය නොහැකි තරම් වටිනා නොවේද? මෙම ස්වර්ගීය ආශීර්වාදවලට පංගුකාරයන් වීමට ලැබීම තරම් සතුටක් තවත් තිබේද?

මනුෂ්‍යත්වය නගා සිටුවීමට කැපවීමට අබ්දුල්-බහාතුමා අපව දිරිමත් කළ ආකාරය අප සෑම විටම සිහිපත් කළ යුතුය:

> **"අපි සියල්ලෝම එක් දිව්‍යමය අරමුණක් තුළ එක්සත්ව සිටිමු, කිසිම භෞතිකමය චේතනාවක් අපගේ නොවන්නේය, අපගේ ප්‍රියමනාපය වන්නේ දෙවියන්වහන්සේගේ ප්‍රේමය ලොව පුරා පැතිරවීමයි!"[11]**

ඔබ කටපාඩම් කර ගත් 1 වන කොටසේ උපුටා දැක්වීම් වලින් එකක් මිතුරෙකු සමඟ බෙද ගැනීමට ඔබට අවස්ථාව උදා වේ යැයි සිතමු. ඔබේ සිතට දැනෙන සතුට පැමිණෙන්නේ කොහෙන්ද? ස්වාභාවිකවම, බහා'උ'ල්ලා තුමාගේ වචනවලින් ඔබේ මිතුරා උද්ගාමක වනු ඇතැයි ඔබ බලාපොරොත්තු වේ. නමුත් ඔහු හෝ ඇය ඔබ බලාපොරොත්තු වූ උද්යෝගය නොපෙන්වන්නේ නම් කුමක් කළ යුතුද? ඔබේ සිතේ ඇති සතුට නිකම්ම පහව යන්නේද? එසේ නොවන්නේද?

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

**7 වන කොටස**

අපගේ ජීවිතයේ අප කරන සෑම දෙයකින්ම, දෙවියන්වහන්සේගේ වචනය අන් අය සමඟ බෙද ගැනීමට අප ගත කරන අවස්ථා විශේෂ ආශීර්වාද සමග ආයෝජනය කර ඇති බව අප වටහා ගන්නා විට, අපි වඩාත් වැදගත් නිගමනයකට එළඹෙමු: එනම් අප සේවයෙන් අප ලබන සතුට එම ක්‍රියාව තුළම පවතින බවයි. ඇත්ත වශයෙන්ම, අප කරන සේවා ක්‍රියාවන්ට වටිනා ප්‍රතිඵල ලැබෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු, නමුත් අපි ප්‍රතිඵලවලට ඕනෑවට වඩා බැඳී සිටියහොත්, ප්‍රශංසාවෙන් හෝ විවේචනවලින් අපට ඕනෑවට වඩා බලපෑම් ඇති වුවහොත්, ඉගැන්වීමේ සතුට අපට නැති වනු ඇත. සේවය කිරීමට අපව පෙලඹවිය යුත්තේ දෙවියන්වහන්සේගේ ප්‍රේමය මිස සාර්ථකත්වය ලැබීමට, ප්‍රතිලාභ ලබා ගැනීමට හෝ පිළිගැනීමට ඇති ආශාව නොවේ. මේ සියල්ලෙන් වෙන්වීම ප්‍රීතිමත් සේවයක අවශ්‍යතාවයකි. පහත උපුටා දැක්වීම් අධ්‍යයනය කිරීමෙන් ඔබට මෙම තේමාව පිළිබඳව මෙනෙහි කිරීමට උපකාරී වනු ඇත:

> **"එම්බා දර්ශන දෙකකින් යුත් පුරුෂය! එක් ඇසක් වසා අනිත් ඇස අරින්න. ලෝකයටත් එහි ඇති සියළු දෙයටත් එක් ඇසක් වසා, ආදරණීයයාණන්ගේ පූජනීය සෞන්දර්යයට අනිත් ඇස අරින්න."[12]**
>
> **"එම්බා මිත්‍රවරුනි! මියයායුතු සෞන්දර්යය වෙනුවෙන් සදකාලික සෞන්දර්යය අත් නොහරින්න. ඔබලාගේ ආදරය මේ දූවිල්ලෙන් සෑදි අස්ථිර ලෝකය මත නොතබන්න."[13]**
>
> **"එම්බා වාග් පුත්‍රය! ඔබගේ මුහුණු මා දෙසට යොමු කර, මා හැර අන් සියල්ලම අමතක කර දමන්න. මාගේ ස්වාධිපත්‍ය සද පවතින අතර මාගේ ඓශ්වර්යය විනාශ නොවී පවතින බැවින්, ඔබ මාහැර අනෙකෙක් සොයා යතහොත්, ඔබ සදකාලිකවම මුළු විශ්වය පුරා සෙව්වද, ඔබගේ සෙවීම නිෂ්ඵල වී යනු ඇත."[14]**
>
> **"එම්බා මිත්‍ර බවට පත්වූ ආගන්තකුය! මාගේ ශක්තිය නැමති හස්තයෙන් ඔබගේ හදවත නමැති ඉටිපන්දම දල්වනු ලැබිණ. එය ආත්මාර්ථය හා රාගය නමැති විරුද්ධ සුළඟින් නිවා නොදමන්න. ඔබගේ සර්වරෝග නිවාරණය මා පිළිබඳ ස්මරණයයි. එය අමතක නොකරන්න. මාගේ ප්‍රේමය ඔබගේ වස්තුව කරගෙන එය ඔබගේ ඇසත් ජීවිතයත් මෙන් රැක බලා ගන්න."[15]**
>
> **"වෙන්වීම සූර්යයා වැනිය; යම් කිසි හදවතක් තුල එය බබලන්නේ නම් එය තෘෂ්ණාව හා ආත්මාර්ථය නමැති ගිනන් නිවාලයි. අවබෝධයේ ආලෝකයෙන් ආලෝකමත්වූ දර්ශනයක් ඇති තැනැත්තා සහතික වශයෙන්ම ලෝකයෙනුත් එහි ඇති නිෂ්ඵල දෙයිනුත් වෙන්වී සිටිනු ඇත. ලෝකයත් එහි දූෂ්ඨත්වයත් නිසා ඔබ දුක් නොවන්න. වස්තුව නිසා බොරු අභිමානයෙන් හෝ දුප්පත්කම නිසා දුකින් නොපෙලෙන තැනැත්තා වාසනාවන්තයෙකි." [16]**

1. මේ ලෝකයෙන් වෙන්වී සිටිම යනුවෙන් අදහස් වන්නේ තවුසෙක්මෙන් ජීවත්වීමද?................

2. ලෞකික දෙයින් වෙන්වී සිටින අතරම යම් යම්දේ අයිතිකර ගැනීම කළ හැකිද?.....................

   ..............................................................................................................................................

3. තම ජීවිතයේ සෑම පැයක්ම වාගේ තම වැඩපල සඳහා යොදවන තැනැත්තෙක් ලෞකික දෙයින් වෙන්වුවෙක්ද?..............................................................................................................

4. තමන්ගේ මූලික අවශ්‍යතාවයන් පිරිමසා ගැනිමට සෑහෙන තරම් පමණක් වැඩකර ඉතිරි කාලය නිකරුණේ ගත කරන තැනැත්තා මේ ලෝකයෙන් වෙන්වෙවක්ද?................................................

5. සේවා ක්ෂේත්‍රයේදී භෞතිකමය අපහසුතාවයන් දරාගත නොහැකි පුද්ගලයෙක් ලෝකයෙන් වෙන්වෙවක්ද?......................................................................................................................

6. භෞතිකමය දේවලට අමතරව අපට බැඳිසිටිය හැකි බොහෝ දේ ඇත. ඔබ එවැනි පුද්ගලයෙක් නම් ඔබ බැඳිසිටිනු හැක්කේ කුමකටද

- ඔහු හෝ ඇය සේවා ක්‍රියාවක් කරන විට සහ කිසිවකු එය පිළිගන්නේ නැති විට අත්හැරීමට අවශ්‍යවන පුද්ගලයෙක් ?..........................................................................................
- යමෙකු ඔහු හෝ ඇය බෙදගන්නා අදහස් පිළිගන්නේ නැති විට අධෛර්යයට පත්වන පුද්ගලයෙක්?.........................................................................................................
- අන් අය විසින් ප්‍රතික්ෂේප කරනු ඇතැයි යන බිය නිසා ඔහුගේ හෝ ඇයගේ විශ්වාසයන් සඟවන පුද්ගලයෙක්? .........................................................................................

7. වෙන්වීම යන්නෙන් පැත්තකට වී සිටීම හෝ සැලකිල්ලක් නොමැතිකම අදහස් නොකෙරේ. පහත සඳහන් දේවලින් කෙනෙකු වෙන්වී නැති බවට ලකුණක් විය හැක්කේ කුමක් ද?

............... අන් අයගේ දියුණුව දැකීමෙන් සතුටක් ලැබීම
............... ළමයි කීප දෙනෙක් වැරදි විදියට හැසිරෙනවිට පන්තියකට ඉගැන්වීම නතර කිරීම
............... කෙනෙකුගේ ජයග්‍රහණ ගැන පුරසාරම් දෙඩවීම
............... වෙහෙස මහන්සි වී අධ්‍යයනය කිරීමට සහ තමා ලබා ගන්නා ප්‍රගතියෙන් තෘප්තිමත් වීම
............... පොදු යහපතට සේවය කිරීමට කෙනෙකුගේ හැකියාව වර්ධනය කිරීමට වෙහෙස මහන්සි වී වැඩ කිරීම
............... කෙනෙකුගේ රැකියාවේ විශිෂ්ටත්වය උදෙසා උත්සාහ කිරීම
............... පිරිසුදුකම පවත්වා ගැනීමට සහ නිවස පිරිසිදුව හා පිළිවෙලට තබා ගැනීම
............... කෙනෙකුගේ අයිති දේවල් ගැන සැලකිලිමත් වීම
............... අන් අයගේ යහපැවැත්ම ගැන සැලකිලිමත් වීම
............... කෙනෙකුගේ උත්සාහය ගැන ප්‍රශංසා නොකරන විට කලකිරීමට පත්වීම

8. අප සෑම කෙනෙකුටම වෙන්වීම කොතරම් වැදගත්ද යත්, මෙම කොටසේ ඇති සියලුම උපුටා දැක්වීම් කටපාඩම් කර ගැනීමට ඔබට යෝජනා කෙරේ.

**8 වන කොටස**

මනුෂ්‍යත්වයට සේවය කරන ප්‍රීතිමත් ජීවිතයක ත්‍යාගයන් ලැබීමට නම්, අප උත්සාහය දැරීමට කැමැත්තෙන් සිටිය යුතු අතර, අපගේ උත්සාහයන් සඳහා යම් මට්ටමක කැපකිරීමක් අවශ්‍ය විය හැකිය. අපි එදිනෙදා ජීවිතයේදී "කැපකිරීම" යන වචනය නිතර භාවිතා කරමු. යාළුවෙක් උදේ පාන්දර ගමනක් ගිහින් ආපසු එනවා නම්, අපි ඇයව රැගෙන ඒමට වේලාසනින් අවදි විය හැක. අපි පැය කිහිපයක නින්ද කැප කළා යැයි අපට පැවසිය හැකිය. අපට හිතවත් කෙනෙක් අසනීප වෙනවා; අපි ඔහුව රැකබලා ගැනීම සඳහා අපගේ ප්‍රියතම විනෝදාංශය පැය කිහිපයක් අත්හරිමු. ජීවිතයේ අප

අතිශයින් වෙහෙස මහන්සි වී වැඩ කළ යුතු අවස්ථා ඇති අතර, ඉලක්කයක් සපුරා ගැනීම සඳහා අපි සැනසීම කැප කරනවා යැයි සිතිය හැකිය.

අපගේ කාලය හා ශක්තිය ත්‍යාගශීලීව පරිත්‍යාග කරමින්, හැකිතාක් දුරට අපගේ භෞතිකමය සම්පත්වලින් කොටසක් ලබාදෙමින්, ධර්මයට සේවය කිරීමට අප සැමට උපරිම ආශාවක් ඇත. අප එසේ කරන විට, අප මතක තබාගත යුත්තේ, සේවය කිරීමේ මාවතේදී, අප මේ ලෝකයේ දේවල් අත්හැරිය හැකි නමුත්, අප අධ්‍යාත්මිකව වර්ධනය වන විට අපට ලැබෙන්නේ සැබෑ ප්‍රීතිය බවයි. ඉදිරි පාඨමාලා වලදී කැපකිරීමේ ස්වභාවය ගැන වැඩි විස්තර මෙනෙහි කිරීමට අපට අවස්ථාව ලැබෙනු ඇත. ආරම්භයේ සිටම හඳුනා ගත යුතු වැදගත් දෙය නම්, බීජය විසින් කැපකිරීම සිදුකරණ නිසා ගසක් උපදින්නාක් මෙන්, උසස් දේ සඳහා පහත් දේ අත්හැරීම එයට ඇතුළත් වන බවයි. කැපකිරීම ප්‍රීතිය දරන්නා වන අතර, අපි අඛණ්ඩ උත්සාහයක් ගැනීමට කැමති නම් මිස මෙම ප්‍රීතිය අපගේ නොවනු ඇත.

බහා'උ'ල්ලා තුමා මෙසේ ප්‍රකාශ කරයිඃ

**"උන්වහන්සේ සොයායාමට නම් දැඩිලෙස වෙහෙසවීම අවශ්‍යයි, උන්වහන්සේ සමග නැවත එක්වීම නැමැති මධුවිත බිමට නම් දැඩි ප්‍රේමය අවශ්‍යයි, එසේම මෙම කුසලානෙන් තොලගෑවිට අපට ලෝකය අමතක කළ හැක"[17]**

එසේම අබ්දුල්-බහාතුමා මෙසේ පවසයිඃ

**"……විවේක නොගන්න.., ශාන්තභාවය නොසොයන්න, මේ අස්ථිර ලෝකයේ සුඛ විහරණයන් කෙරෙහි නොබැඳෙන්න, සෑම බන්ධනයකින්ම නිදහස්වී දෙවියන්වහන්සේගේ රාජධානියේ සම්පූර්ණයෙන් තහවුරු වීමට මුළු හදවතින් සහ ආත්මයෙන්ම වෙර දරන්න. ස්වර්ගීය වස්තු ලබාගන්න. දිනෙන් දිනම වඩ වඩා ආලෝකමත් වන්න. ඒකීයභාවයේ එළිපත වෙතට වඩ වඩා ළංවන්න."[18]**

අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අප උත්සාහ කළ යුතු බව අපි කවුරුත් විශ්වාස කරමු. නමුත් මෙම සරල විශ්වාසය සතුව අප අමතක නොකළ යුතු ඇතැම් ප්‍රායෝගික ඇඟවුම් ඇත. එකක් නම්, සතුව ඇති ඉලක්කය හෝ කාර්යයේ දුෂ්කරතා මට්ටම සහ අවශ්‍යකරන ශක්තියේ ප්‍රමාණය අතර අනුරූපතාවයක් ඇති බව මතක තබා ගත යුතුය. අඩු මට්ටමකින් එය ඉටු කළ හැකි යැයි සිතුවහොත් අප අපවම රවටා ගන්නෙමු. නමුත් සැලකිල්ලට ගත යුතු එකම සාධකය උත්සාහයේ විශාලත්වයම නොවේ. ස්ථාවරත්වය සහ නොපසුබට උත්සාහය අවශ්‍ය වේ. අවධානය යොමු කිරීමද අවශ්‍ය වේ. එකකින් තවත් එකකට පැනීම සහ වැඩ නොකර අත්හැරීම නොමැතිව, වැඩ නිම කිරීමේ පුරුද්ද අත්‍යවශ්‍ය වේ. අඩමාන උත්සාහය ඵල නොදරයි. දරුවන්ගේ අධ්‍යාත්මික අධ්‍යාපනය සඳහා වන සතිපතා පන්තියක් ගැන සිතන්න. එක් එක් පන්තිය සඳහා සූදනම් වීම සඳහා ගුරුවරයා නිශ්චිත පැය ගණනක් කැප කළ යුතු අතර, පාඩමේ අන්තර්ගතය සිසුන්ට තේරුම් ගැනීමට උපකාර කිරීම සඳහා එහි කාලසීමාව පුරාම සම්පූර්ණයෙන්ම අවධානය යොමු කළ යුතුය, යෞවනයන්ගේ දෙමාපියන් වෙත නිතිපතා සංචාරය කළ යුතු අතර, ඔවුන්ගේ පුද්ගලික ප්‍රගතිය සතියෙන් සතිය අනුගමනය කලයුතුය. ගුරුවරයා ඉඳහිට පමණක් සූදනම් වන, වෙහෙසට පත් වූ විට සැසිය ඉක්මනින් හා හදිසි අවසානයකට ගෙන එන, සහ එක් එක් දරුවා ගැන සිතීමට සහ ඔහුගේ හෝ ඇයගේ ප්‍රගතිය දෙමාපියන් සමඟ සාකච්ඡා කිරීමට අවශ්‍ය කාලය කැප කිරීමට අපොහොසත් වන පන්තියක ඉරණම කුමක්ද වේද? ගුරුවරයා පිටත නගරයෙන් පැමිණෙන මිතුරෙකු සමඟ කාලය ගතකිරීමට වැනි වෙනත් වගකීමකට සහභාගී වීමට කැමති සෑම විටම පන්තිය අවලංගු කළහොත් කුමක් සිදුවන්නේද?

මෙම ප්‍රකාශ කිහිපය අපට ඒත්තු ගන්වන දෙය නම් අප ඉල්ලා සිටින සෑම උත්සාහයක්ම ප්‍රයත්නයේ ප්‍රමාණය සහ ගුණාත්මකභාවය යන දෙකටම අවධානය යොමු කළ යුතු බවයි. මෙය අප නියැලෙන සේවා ක්‍රියාවන් සඳහා පමණක් නොව; එය අපගේම සංවර්ධනයටද සමානව අදළ වේ.

මෙම ග්‍රන්ථ මාලාවේ පළමු පොතේ අපි සලකා බැලූ අධ්‍යාත්මික පුරුදු පවා - එනම් නිතිපතා යාච්ඤා කිරීම, දිනපතා ශුද්ධවූ ලේඛන කියවීම, ඉගැන්වීම්වලට අනුකූලව අපගේ ජීවිතය ගෙන එන්නේ කෙසේදැයි මෙනෙහි කිරීම, අධ්‍යාත්මික රැස්වීම්වලට මුළු හදවතින්ම සහභාගී වීම - අඛණ්ඩ වෙහෙසීම මත රඳ පවතී. උත්සාහයට අදළ ප්‍රකාශ ගණනාවක් පහත දක්වේ. කුමන ඒවා සත්‍ය දැයි තීරණය කිරීම මෙම කාරණය පිළිබඳව තවදුරටත් මෙනෙහි කිරීමට ඔබට උපකාරී වනු ඇතඃ

- .............. ඔබ බුද්ධිමත් නම්, ඔබ වෙහෙස මහන්සි වී වැඩ කිරීමට අවශ්‍ය වන්නේ නැත.
- .............. දුර මාර්ගයේ යන්නේ ඇයි; සෑම විටම කෙටි මාර්ගයක් සොයන්න.
- .............. වේදනාව නැත්නම් ලබාගැනීම්ද නැත්තේය.
- .............. ලොකු සිහින දකින්න; ඔබේ ආශාවන් ඉටු වනු ඇත.
- .............. ත්‍යාගය වැඩි වන තරමට උත්සාහය වැඩි වේ.
- .............. උත්සාහය වැඩි වන තරමට ප්‍රථිඵලය මිහිරි ය.
- .............. මුලදී ඔබ සාර්ථක නොවන්නේ නම්, උත්සාහ කරන්න, නැවත උත්සාහ කරන්න.
- .............. ඔබ වෙනුවෙන් අන් අයට එය කිරීමට හැකි විට වැඩ කරන්නේ ඇයි?
- .............. එය ඕනෑවට වඩා උත්සාහයක් ඉල්ලා සිටින්නේ නම්, එය එසේ කිරීමට අදහස් නොකෙරේ.
- .............. කුඩා පියවර - නිරන්තර සහ ස්ථාවර - දිගු ගමනක් යා හැකිය.
- .............. වටිනා කිසිවක් පහසුවෙන් ලැබෙන්නේ නැත.
- .............. විශිෂ්ටත්වය මුළු හදවතින්ම කැපවීම ඉල්ලා සිටී.
- .............. සැතපුම් දහසක ගමන ආරම්භ වන්නේ එක් පියවරකිනි.
- .............. නිකම්ම දේවල් ලැබෙන එක හොඳ මදි.
- .............. දේවල් සිදු වන තෙක් අප බලා සිටිය යුතු නැත; අපි ඒවා පසුපසලුහුබැඳ යා යුතුයි.
- .............. සාර්ථකත්වය වාසනාවන්ත කාරණයකි.
- .............. අපි මැජික් මගින් අපගේ ද්විත්ව අරමුණ සාක්ෂාත් කර නොගනිමු.
- .............. අපි සෑම දිනකම අපව විගණනයට කැඳවිය යුතුයි.

අපි අපගේම අධ්‍යාත්මික හා බුද්ධිමය වර්ධනයක් ළඟා කර ගැනීමට සහ සමාජයේ පරිවර්තනයට දයක වීමට උත්සාහ කරමින් සේවයේ මාවතේ ගමන් කරමු. මෙම දෙවැදෑරුම් අරමුණ ඉටු කර ගැනීම සඳහා අපගේ පැත්තෙන් විශාල උත්සාහයක් අවශ්‍ය බව පැහැදිලිය. බහා'උ'ල්ලා තුමා අපට මෙසේ පවසයිඃ

> **"අසමසම මැවුම්කරු සියලු මිනිසුන් එකම සාරයකින් නිර්මාණය කර, ඔවුන්ගේ යථාර්ථය උන්වහන්සේගේ සෙසු නිර්මාණයන්ට වඩා උසස් කර ඇත. සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය, ලබාගැනීම හෝ නැතිවීයාම, එබැවින්, මිනිසාගේම උත්සාහයන් මත රඳ පැවතිය යුතුය. ඔහු වෑයම් කරන තරමට ඔහුගේ දියුණුව වැඩි වෙනු ඇත."**[19]

ඔබ දැනටමත් එසේ කර නොමැති නම් ඉහත ඡේදය කටපාඩම් කර ගැනීමට ඔබට අවශ්‍ය විය හැකිය.

**9 වන කොටස**

සේවයෙන් ප්‍රීතිය ලබා ගැනීමට නම්, අප තුළ යම් යම් ආකල්ප පෝෂණය කළ යුතුය. නිදසුනක් වශයෙන්, දෙවියන් වහන්සේ අපට ලබා දී ඇති සේවයේ ත්‍යාගය සඳහා අප ස්තුතිවන්ත විය යුතුය; අප දෙවියන්වහන්සේගේ ධර්මයට සේවය කරන විට අප දෙවියන්වහන්සේට උපකාරයක් සිදු කරනවා යැයි සිතීමද කළ නොහැකිය. අශුභවාදයෙන් වැළකී ලෝකය පිළිබඳ ශුභවාදී දෘෂ්ටියකින් ජීවිතයට එළඹීමට ද අප ඉගෙන ගත යුතුය. සේවා මාවතේ ඇති බාධක තවදුරටත් ප්‍රගතිය සඳහා වූ පියවරයන් බවට පත් කළ හැකිය. දුෂ්කරතා මධ්‍යයේ වුවද, අපි අනාගතය දෙස විශ්වාසයේ දෑසින් යුතුව බලා සිටිමු. අබ්දුල්-බහා තුමාගේ පහත වදන් අපගේ උත්සාහයන්හී සංලක්ෂිත කළ යුතු බලාපොරොත්තුව සහ ශුභවාදී බව පෙන්වා දෙයිඃ

**"ආරම්භයේදී බීජය කෙතරම් කුඩා වුවත් අවසානයේ එය බලවත් ගසකි. ඔබ බීජ දෙස නොබලන්න, ගස, එහි මල්, එහි කොළ සහ ගෙඩි දෙස බලන්න."[20]**

**"එසේ නම්, සැබෑ ගොවියා උන්වහන්සේගේ අනුග්‍රහයේ දෑතින්, ස්වාමින්වහන්සේගේ සීසාන ලද කෙත්වල වපුරා, ප්‍රදනය කිරීම් වල සහ දීමනාවන්ගේ වර්ෂාවෙන් වතුර දමා, දූන් සත්‍යයේ දිවා තරුවේ උෂ්ණයෙන් හා ආලෝකයෙන් පෝෂණය වන මෙම කුඩා බීජයේ ඉතා වැදගත් අභිප්‍රාය දූන ගන්න."[21]**

**"ගසක් වැඩෙමින් වර්ධනය වන බව ඔබ දකින විට, එහි ප්‍රතිඵලය ගැන බලාපොරොත්තු වන්න. එය මල් පිපී අවසානයේ පල දරනු ඇත. ඔබ පදම් දූව හෝ පැරණි ගස් දුටුවහොත්, කුමන එලදූරීමක් වුවද බලාපොරොත්තු විය නොහැක."[22]**

**"එබැවින් දෙවියන්වහන්සේගේ ප්‍රේමවන්තයන් වෙහෙස මහන්සි වී, ඔවුන්ගේ උත්සාහයේ ජලයෙන්, මෙම බලාපොරොත්තුවේ ගස රැකබලා ගෙන ඇතිදූඩි කර පෝෂණය කළ යුතුය." [23]**

**"දෙවියන්වහන්සේ පිරිනමන ආශීර්වාදවලින් හදවත ඉවතට හැරෙන්නේ නම්, එය සතුටක් බලාපොරොත්තු වන්නේ කෙසේද? එය දෙවියන්වහන්සේගේ දයාව කෙරෙහි තම බලාපොරොත්තුව හා විශ්වාසය නොතබන්නේ නම්, එයට විවේකයක් ලබා ගත හැක්කේ කොතැනින්ද?"[24]**

ඉහත ඡේද පිළිබිඹු කිරීමට, පහත වාක්‍ය සම්පූර්ණ කරන්නඃ

1. ආරම්භයේදී බීජය කෙතරම් කුඩා වුවත් අවසානයේ එය ..............................................................
   ..........................................................................................................................................

2. අප බැලිය යුත්තේ කුඩා බීජය දෙස නොව ..........................................................................
   ....................................................... දෙසය

3. එසේ නම්, උන්වහන්සේගේ අනුග්‍රහයේ දෑතින්,.........................................................................
   ..........................................................................................................................................
   ..........................................................................................................................................
   ........................................................................................................... දෙවියන්වහන්සේ
   සතු කුඩා බීජයේ වැදගත්කම අප හඳුනාගත යුතුය.

4. ගසක් වැඩෙමින් වර්ධනය වන බව ඔබ දකින විට,........................................................................... ........................................................................................ වන්න

5. ගසක් වැඩෙමින් වර්ධනය වන බව ඔබ දකින විට, එය ................................................................ ............................................................................ වනු ඇතැයි අප බලාපොරොත්තු විය යුතුය.

6. අපගේ උත්සාහයේ ජලයෙන්, අප........................................................................................................ ............................................................................

7. දෙවියන්වහන්සේ පිරිනමන ආශීර්වාදවලින් හදවත ඉවතට හැරෙන්නේ නම්, ......................... ............................................................................?

8. හදවතක් දෙවියන්වහන්සේගේ දයාව කෙරෙහි තම බලාපොරොත්තුව හා විශ්වාසය නොතබන්නේ නම්, ........................................................................................................................ ............................................................................?

දැන්, මොහොතක් මෙනෙහි කරන්නඃ අපගේ ප්‍රීතිමත් සහ බලාපොරොත්තු සහගත ජීවය නිහතමානී කෘතඥතාවයේ ඉරියව්වක් සමඟ ඒකාබද්ධව අන් අයට ප්‍රීතිය ගෙන දෙන ප්‍රභවය බවට ඔබ එකඟද? තවද, ධර්මයට සේවය කිරීම සඳහා නැගීසිටින විට, මිනිස් සංහතිය එක්රැස් කිරීමේ දිනය වන නව දිනක උදව පිළිබඳ ශුභාරංචිය අප දරාසිටින බවට අප සැමවිටම මතක තබා ගනිමු. බහා'උ'ල්ලා තුමාගේ වදන් අපගේ හදවත් තුළ දෝංකාර දෙනු ඇතඃ

> **"ක්‍රියා කරන අය ප්‍රිතිමත්ය. තේරුම් ගන්නා අය ප්‍රිතිමත්ය; සත්‍යයට ඇලුම් කළ, ස්වර්ගයේ සහ පෘථිවියේ ඇති සියල්ලෙන් වෙන් වූ මිනිසා ප්‍රිතිමත්ය."**[25]

## REFERENCES


1. *Gleanings from the Writings of Bahá'u'lláh* (Wilmette: Bahá'í Publishing Trust, 1983,
   2017 printing), CLIII, par. 5, p. 369.

2. Ibid., CXXXII, par. 3, p. 326.

3. Bahá'u'lláh, *The Hidden Words* (Wilmette: Bahá'í Publishing Trust, 2003, 2012
   printing), Arabic no. 2, p. 3.

4. *Gleanings from the Writings of Bahá'u'lláh*, CVI, par. 1, p. 241.

5. Ibid., CIX, par. 2, p. 243.

6. Bahá'u'lláh, in *Women: Extracts from the Writings of Bahá'u'lláh, 'Abdu'l-Bahá, Shoghi Eff and the Universal House of Justice*, compiled by the Research Department of the Universal House of Justice (Wilmette: Bahá'í Publishing Trust, 1986, 1997 printing), no. 53, p. 26.

7. *The Hidden Words*, Arabic no. 11, p. 6.

8. *Gleanings from the Writings of Bahá'u'lláh*, CLIII, par. 5, p. 370.

9. Ibid., CXXIX, par. 1, p. 316.

10. Ibid., XLIII, par. 9, p. 109.

11. From a talk given on 19 November 1911, published in *Paris Talks: Addresses Given by 'Abdu'l-Bahá in 1911* (Wilmette: Bahá'í Publishing, 2006, 2016 printing), no. 32.2, p. 121.

12. *The Hidden Words*, Persian no. 12, p. 26.

13. Ibid., Persian no. 14, p. 26.

14. Ibid., Arabic no. 15, p. 7.

15. Ibid., Persian no. 32, p. 33.

16. Bahá'u'lláh, in *The Bahá'í World: Volume One, 1925–1926* (Wilmette: Bahá'í
    Publishing Trust, 1926, 1980 printing), p. 42.

17. *The Call of the Divine Beloved: Selected Mystical Works of Bahá'u'lláh* (Haifa: Bahá'í World Centre, 2018), no. 2.12, p. 17.

18. *Tablets of the Divine Plan: Revealed by 'Abdu'l-Bahá to the North American Bahá'is*

(Wilmette: Bahá'í Publishing Trust, 1993, 2006 printing), no. 13.6, pp. 95–96.

19. *Gleanings from the Writings of Bahá'u'lláh*, XXXIV, par. 8, p. 91.

20. *Selections from the Writings of 'Abdu'l-Bahá* (Wilmette: Bahá'í Publishing, 2010,
2015 printing), no. 40.3, pp. 118–19.

21. Ibid., no. 40.3, p. 119.

22. From a talk given on 11 May 1912, published in *The Promulgation of Universal Peace: Talks Delivered by 'Abdu'l-Bahá during His Visit to the United States and Canada in 1912* (Wilmette: Bahá'í Publishing, 2012), par. 2, p. 153.

23. *Selections from the Writings of 'Abdu'l-Bahá*, no. 206.13, pp. 356–57.

24. From a talk given by 'Abdu'l-Bahá on 21 November 1911, published in *Paris Talks*, no. 34.8, p. 133.

25. Bahá'u'lláh, *Epistle to the Son of the Wolf* (Wilmette: Bahá'í Publishing Trust, 1988,
2016 printing), p. 139.



# උද්ගාමක සංවාදයන්

## අරමුණ

සංවාදයකට අධ්‍යාත්මික මූලධර්ම
හඳුන්වා දීමේ හැකියාව ලබා ගැනීම

**1 වන කොටස**

මෙම පොතේ පළමු ඒකකය තුළ, දෙවියන් වහන්සේගේ වචනය අන් අය සමඟ බෙදාගැනීමේ ක්‍රියාවෙන් අප ලබන අප්‍රමාණ ප්‍රීතිය ගැන අපි කතා කළෙමු. අප සේවයේ මාවතේ ගමන් කරන විට, බහා'උ'ල්ලා තුමාගේ අනාවරණයෙන් අප ලබා ගන්නා අන්තර් දෘශ්ඨිය මිතුරන් හා හිතවතුන් සමඟ සාකච්ඡා කිරීමට බොහෝ අවස්ථා අප වෙත පැමිණේ. එසේ නම්, අප සියල්ලන්ටම වර්ධනය කර ගත යුතු අත්‍යවශ්‍ය හැකියාවන් අතර, අර්ථවත් සහ උද්ගාමක සංවාදයකට දායක වීමට අපට හැකි වන ඒවා වේ. මෙම සහ ඊළඟ ඒකකයන්හී අරමුණ වන්නේ මේ සම්බන්ධයෙන් ඔබට සහාය වීමයි. මෙහිදී ඔබ, අවස්ථාව එය ඉල්ලා සිටින විට, අධ්‍යාත්මික මූලධර්ම වෙත යොමු කිරීමෙන් සංවාදයේ මට්ටම ඉහළ නංවන්නේ කෙසේද යන්න පිළිබඳව සැලකිලිමත් වනු ඇත. ඔබගේ ගමේ හෝ අසල්වැසි ප්‍රදේශයේ උද්දීප්ත ප්‍රජාවක් ගොඩනැගීමේ ක්‍රමානුකූල ප්‍රයත්නයක කොටසක් ලෙස යම් යම් තේමා ඔස්සේ සංවාද මාලාවක් ආරම්භ කර පවත්වාගෙන යන්නේ කෙසේදැයි මීළඟ ඒකකයෙන් ඔබ සිතනු ඇත.

අප ඊළඟ කොටස් වලින් සිදු කරන්නේ, නිවැරදි උපුටා දැක්වීම් නොවුනත්, 'අබ්දුල්-බහා තුමාගේ කතා සහ පත්‍රික මත පදනම් වූ සහ උන්වහන්සේ භාවිතා කළ බොහෝ වාක්‍ය ඛණ්ඩ ඇතුළත් විවිධ විෂයයන් පිළිබඳ ප්‍රකාශ ගණනාවක් දෙස බැලීමයි. ඔබ එක් එක් ප්‍රකාශය කිහිප වතාවක් කියවා, අදහස් අනුපිළිවෙල හඳුනාගෙන, ඔබට ඒවා ස්වභාවිකව ප්‍රකාශ කිරීමට හැකි වන තෙක් ඔබේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයන් ශබ්ද නගා ඒවා පැවසිය යුතුය. සාකච්ඡාවක් ඉදිරියට ගෙන යාමට ධර්මයේ ඉගැන්වීම් උකහා ගැනීම සුදුසු යැයි ඔබට හැඟෙන විට පහසුවෙන් කතා කිරීමට සූදානම් වීමට මෙම අභ්‍යාසය උපකාර වනු ඇත.

මිනිස් හදවත විනිවිද යන විශේෂ බලයක් ඒවාට ඇති නිසාත්, ඔබේ කතාවට ගෙතුනු විට, සවන්දෙන්නා කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන නිසාත්, ලේඛන කොටස් කටපාඩම් කිරීම ඔබ මෙම ඒකකයේදීත් දිගටම කරගෙන යනු ඇත. එහෙත් සංවාදයකදී ලේඛන වලින් උපුටා දැක්වීමට ප්‍රඥාව අවශ්‍ය වේ. අවශ්‍ය වන්නේ මධ්‍යස්ථභාවයයි, ධර්මයේ ඉගැන්වීම් පැහැදිලි කිරීමට ලේඛනවලින් ඍජුව උපුටා දැක්වීම සහ තමන්ගේම වචන භාවිතා කිරීම අතර සමබරතාවයයි. මෙම සමබරතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා, ඔබ ලේඛන අධ්‍යයනයට විශාල කාලයක් හා ශක්තියක් වැය කළ යුතු අතර ඒවාට ඔබේ සිතුවිලි සහ හැඟීම් හැඩගස්වා ගැනීමට ඉඩ දිය යුතුයි.

**2 වන කොටස**

අධ්‍යයනය කිරීමට ඔබෙන් අසනු ලබන පළමු ප්‍රකාශය මානව වර්ගයාගේ අධ්‍යාපනඥයකුගේ අවශ්‍යතාවය ගැන සැලකිලිමත් වේ.

> අපි පැවැත්ම ගැන සලකා බලන විට, ඛනිජ, ශාක, සත්ව හා මනුෂ්‍යය යන සෑම රාජධානයකටම අධ්‍යාපනඥයෙකු අවශ්‍ය බව අප නිරීක්ෂණය කරමු. වත්තකට උයන්පල්ලෙකු අවශ්‍යයි. සරු අස්වැන්නක් ලබාගැනීමට නම් ඉඩමට ගොවියකු අවශ්‍ය වේ. මනුෂ්‍යයෙකු වනාන්තරයක හුදකලාව ජීවත්වීමට ඉඩ හැරියහොත් ඔහුගේ හැසිරීම සතෙකුගේ මෙන් වනු ඇත. ඔහුට අධ්‍යාපනය ලැබුණිනම් නිපුණත්වයේ ඉහලම මට්ටමට ළඟාවීමට හැකිවනු ඇත. අධ්‍යාපනඥයකු නොවන්නට ශිෂ්ඨාචාරයක් බිහි නොවනු ඇත.
>
> අධ්‍යාපනය තෙවැදෑරුම්ය: භෞතික, මානව හා ආධ්‍යාත්මික වශයෙනි. භෞතික අධ්‍යාපනය අදාළවන්නේ ශරීර සංවර්ධනය කෙරෙහිය. මානව අධ්‍යාපනය ශිෂ්ඨාචාරය සහ ප්‍රගතියයි පිළිබදවයි. එය පාරිපාලනය, සමාජ පිළිවෙළ, මානව සුභසාධනය, වාණිජ හා කර්මාන්ත, කලා සහ විද්‍යාව, වැදගත් සොයාගැනීම් සහ ශ්‍රේෂ්ඨ ව්‍යාපාර සමඟ කටයුතු කරයි. ආධ්‍යාත්මික අධ්‍යාපනය දිව්‍යමය පරිපූර්ණතාවයක් ලබාගැනිම කෙරෙහි බලපායි. නියම අධ්‍යාපනය යනු මෙයයි. මනුෂ්‍යයාගේ උසස් ආධ්‍යාත්මික ස්වභාවය සංවර්ධනය වන්නේ එහි ආධාරයෙනි.

ප්‍රගතිය සඳහා මනුෂ්‍යත්වයට භෞතික, මානව සහ අධ්‍යාත්මික අධ්‍යාපනඥයෙකු ලෙස පැහැදිලි අධිකාරියක් ඇති අධ්‍යාපනඥයෙකු අවශ්‍ය වේ. කවරෙකු හෝ, "මට විශාල බුද්ධියක් ඇත, මට එවැනි උගතෙකු අවශ්‍ය නැත" යනුවෙන් කිව හොත්, ඔහු පැහැදිලිවම ප්‍රතික්ෂේප වනු ඇත. ඒක හරියට ළමයෙක්, "මට අධ්‍යාපනයක් අවශ්‍ය නැහැ. මම මගේම චින්තනයට සහ බුද්ධියට අනුව ක්‍රියා කර මා විසින්ම විශිෂ්ටත්වය ලබා ගන්නෙමි." යනුවෙන් පවසනවා වැනිය.

ශරීරයේ පෝෂණය හා සෞඛ්‍ය හා සම්බන්ධ කරුනු සංවිධානය කරගැනිම සඳහා ආධාර කළහැකි, දැනුමෙන් ඉදිරියට යාමට, නව නිෂ්පාදන හා නව සොයාගැනිම් සිදුකිරීම සඳහා පෙළඹවිය හැකි, සහ, වඩාත්ම වැදගත් දෙය නම්, ආත්මයේ ජීවිතයට එයට ස්වසනය කළ හැකි අංග සම්පුර්ණ අධ්‍යාපනඥයෙකුගේ අවශ්‍යතාවය මනුෂ්‍යවර්ගයාට නිරත්තරයෙන්ම තිබිණ. සාමාන්‍ය මනුෂ්‍යයෙකුට මේ දුෂ්කර කාර්යය ඉටු කළ නොහැක. ඒවා ඉටුකිරිමේ බලය ඇත්තේ දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීමකට පමණි. මේ උතුමන්ලා වනාහි දෙවියන්වහන්සේ විසින් කලින් කලට ලොවට පහල කරවන මනුෂ්‍යවර්ගයාගේ විශ්ව අධ්‍යාපනඥයෝ වෙති.

1. ඔබේ කණ්ඩායමේ ප්‍රකාශය කිහිප වතාවක් කියවා එහි අන්තර්ගතය හොඳින් ඉගෙන ගැනීමට එකිනෙකාට උදවු කරන්න. ඉදිරිපත් කරන ලද අදහස්වලට අදළ ප්‍රශ්න ඔබ එකිනෙකාගෙන් ඇසිය යුතු අතර ඒවා ස්වභාවිකව සහ පහසුවෙන් ප්‍රකාශ කිරීමට පුරුදු විය යුතුය.

2. ඊළඟට, ඔබ මෙහි ප්‍රකාශ කිරීමට ඉගෙන ගත් අදහස් සංවාදයකට හඳුන්වා දිය හැකි ආකාරය ඔබේ කණ්ඩායම තුළ සාකච්ඡා කරන්න. අධ්‍යාපනය තුන් ආකාරයක යැයි ඔබ හදිසියේම ඔබේ මිතුරන්ට පැවසීමට නොයන බව පැහැදිලිය. එසේ නම්, ඉහත අදහස් අදළ බව ඔප්පු වන අන්තර්ක්‍රියා වර්ග ගැන සිතා බැලීම වටී. සමහර විට සාකච්ඡාවට ලක්ව ඇති කාරණය වන්නේ සමාජයේ සදචාරාත්මක පරිහානිය හෝ ලෝකයේ අභිවෘද්ධිය සඳහා කටයුතු කරන්නේ කෙසේද යන්නයි. මිතුරන්, පවුලේ සාමාජිකයන් සහ හිතවතුන් සමඟ ඔබ නිරත වන විවිධ සංවාද ගැන මෙනෙහි කරන්න. ඔවුනොවුන්ගේ සිත් තුළ පවතින ප්‍රශ්න අතර, මෙම ප්‍රකාශයේ ඇති අදහස් වටා සංවාදයකට යොමු විය හැකි යමක් තිබේද?

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

3. ඔබ දැන් ඉගෙන ගත් විෂය වැනි විෂයයන් පිළිබඳ සංවාද වලදී බොහෝ විට ප්‍රශ්න මතු වේ. "ඔබ පවසන මෙම සමහර අධ්‍යාපනඥයින් කවුරුන්ද?" යනුවෙන් කවුරුහරි ඇසුවහොත් ඔබ දෙන පිළිතුර කුමක්ද?

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

4. පහත දැක්වෙන්නේ මනුෂ්‍යවර්ගයාහට අධ්‍යාපනඥයෙකුගේ අවශ්‍යතාවයට පිළිබඳ වූ බහා'උ'ල්ලා තුමාගේ ලේඛනවලින් උපුටා දැක්වීම් කිහිපයකි. ඒවා ගැන මෙනෙහි කර අවම වශයෙන් එකක්වත් කටපාඩම් කරගන්න. මේ ආකාරයෙන්, ඔබට සුදුසු විට ඔබේ කථාවට ලේඛනවල ඡේද වියන්නට හැකිවනු ඇත.

"සියලුම මිනිසුන් නිර්මාණය කරනු ලැබ ඇත්තේ සද ප්‍රගතියට යන ශිෂ්ඨාචාරයක් ඉදිරියට ගෙනයාම සඳහාය."[1]

"එකම සත්‍ය දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ මහිමයට කීර්තිය වේවා, තමන් වහන්සේම මනුෂ්‍යයාට අනාවරණය කරනු ලැබිමේ අරමුණ වනාහි ඔවුන්ගේ සත්‍ය හා අභ්‍යන්තර තම ආත්මයන්හි සැඟවී පවතින මාණික්‍ය එළි දක්විමයි."[2]

"දෙවියන්වහන්සේ තම අනාගත වක්තෘවරුන් මනුෂ්‍යයා වෙත එවීමේ අරමුණ ද්වීධාකාරය. පළමුවැන්න නම් මනුෂ්‍ය දරුවන් නොදනුවත්කමේ අඳුරෙන් මුද ගෙන, සැබෑ අවබෝධයේ ආලෝකය වෙතට ඔවුනට මග පෙන්වීමයි. දෙවැන්න වනාහි මනුෂ්‍ය වර්ගයාගේ සාමය හා ශාන්තභාවය සහතික කර ඔවුන් ස්ථාවර කළ හැකි සියලුම මාර්ග සපයාදීමයි."[3]

"මනුෂ්‍යයාට සියලුම කාලවලදී සහ සියලුම තත්වයන් යටතේ තමන්ට උනන්දුකරවීමට මගපෙන්විමට සහ උපදෙස් දීමට සහ ඉගැන්වීමට කෙනෙක් අවශ්‍යය."[4]

## 3 වන කොටස

පහත ඡේදවල දෙවියන්වහන්සේව දැනගත හැක්කේ උන්වහන්සේගේ ප්‍රකාශනයන් තුළින් පමණක් වන අතර මිතුරන් සමඟ සංවාදයේ යෙදෙන විට ඔබට ප්‍රයෝජනවත් වන ආකාරය විස්තර කරයි.

අනන්ත විශ්වය ගැන සලකා බලන්න. මැවුම්කරුවෙකු නොමැතිව එය නිර්මාණය කළ හැකිද? එසේත් නැතිනම් මැවුම්කරුගේ යථාර්ථය උන්වහන්සේ මැවූ දෙයින් කවද හෝ අවබෝධ කර ගත හැකිද? අපි මුළු නිර්මාණයම නිරීක්ෂණය කළහොත් අපට පෙනෙන්නේ පහත් දෙයට එයට වඩා උසස් දෙයෙහි බලය වටහාගැනීමට නොහැකි බවයි. ඒ නිසා ගල සහ ගස කෙතරම් පරිණාමය වුවද, පෙනීම සහ ශ්‍රවණය කිරීමේ බලය කිසිද සිතාගත නොහැකිය. සත්ත්වයාට කිසිවිටෙක මිනිසාගේ යථාර්තය වටහාගැනීමටත්, මනුෂ්‍ය ආත්මයේ ශක්තීන් පිළිබඳව දැනුවත් වීමටත් නොහැක. එබැවින් මැවූ අපට අපගේ මැවුම්කරුගේ යථාර්ථය තේරුම් ගත හැක්කේ කෙසේද?

අපගේ අවබෝධයට කිසිදක දෙවියන්වහන්සේ වෙත ළඟා විය නොහැකි වුවද, අපට උන්වහන්සේ දැනගැනීමෙන් තොර නොවේ. දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම් වන විශේෂ පැවැත්මක් වරින් වර පෘථිවියේ විද්‍යාමාන වේ. පැහැදිලි, ඔප දැමූ කැඩපතකින් දිස්වන සූර්ය කිරණ මෙන් මෙම ශුද්ධවූ ප්‍රකාශවීම් තුළ දෙවියන්වහන්සේට අයත් සියලු පරිපූර්ණත්වය, ත්‍යාගය සහ තේජස දෘශ්‍යමාන වේ. දර්පණය සූර්යයා පරාවර්තනය කරයි යැයි කීමෙන් අදහස් වන්නේ සූර්යයා එහි උසින් බැස කැඩපතට ඇතුළත් වූ බවක් නොවේ. එසේම දෙවියන්වහන්සේ පවිත්‍රතා ස්වර්ගයෙන් මේ පැවැත්මේ තලයට නොබසියි. මෙයින් අදහස් කරන්නේ මෙයයිඃ දෙවියන්වහන්සේගේ නම් සහ ගුණාංග සහ පරිපූර්ණත්වය ගැන මනුෂ්‍ය වර්ගයා දන්නා, ඉගෙන ගන්නා සහ තේරුම් ගන්නා සියල්ල උන්වහන්සේගේ ශුද්ධවූ ප්‍රකාශවීම් වෙත යොමු වේ.

1. මෙම ප්‍රකාශය ඔබේ කණ්ඩායම තුළ කිහිප වතාවක් කියවා එහි අන්තර්ගතය පිළිබඳව එකිනෙකාගෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමෙන් පසු, ඔබ යම් තරමක පහසුවකින් අදහස් පැවසීමට පුරුදු විය යුතුය.

2. දැන් ඔබ මෙහි ඉගෙන ගත් අදහස් ස්වභාවිකව සංවාදයකට පිවිසිය හැකි ආකාරය ඔබේ කණ්ඩායම තුළ සාකච්ඡා කරන්න. නිදසුනක් වශයෙන්, දෙවියන්වහන්සේගේ පැවැත්ම හෝ

ජීවිතයේ අරමුණ පිළිබඳ සාකච්ඡාවකදී මෙය පහසුවෙන් කළ හැකිය. ඔබේ පවුලේ අය සහ මිතුරන් අතර සංවාදයේ දී මතු වූ වෙනත් මාතෘකා සහ ප්‍රශ්න ඔබට මෙම අදහස් හුවමාරු කර ගැනීමේ හැකියාව ලබා දෙනවාද?

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

3. ඔබේ මිතුරන් සමඟ සංවාදයකදී, ඔබ ඉගෙන ගත් අදහස් හඳුන්වා දීමට ඔබට අවස්ථාවක් තිබේ යැයි සිතමු. දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම් තුළින් අප උන්වහන්සේ ගැන දන්නා සමහර දේවල් මොනවාද? යනුවෙන් ඔවුන්ගෙන් කෙනෙක් ඔබෙන් ඇසුවොත් ඔබ පිළිතුරු දෙන්නේ කෙසේද?

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

4. ඔබ මෙම විෂය පිළිබඳව මිතුරන් සමඟ කතා කරන විට ඔබට ඒවා උපුටා දැක්විය හැකි වන පරිදි බහා'උ'ල්ලා තුමාගේ ලේඛනවලින් පහත සඳහන් කොටස් එකක් හෝ කිහිපයක් කටපාඩම් කිරීමට ඔබට අවශ්‍ය විය හැකියඃ

**"සත්‍යයේ සූර්යයාගෙන් නික්මෙන මේ දීප්තිමත් ආත්ම භාවයන් පිළබිඳ දැනීමෙනුත් එතුමන්ලා වෙතට සැපත්වීමෙනුත් හැර සියලු දේවලම ආරම්භයවූ උන්වහන්සේ පිළිබඳ දැනීම ලබාගැනිමත් උන්වහන්සේ වෙතට එළඹීමත් කළ නොහැක."[5]**

**"තම අවබෝධය කොපමණ තීක්ෂණ වුවද කිසිම මනුෂ්‍යයෙකුට දිව්‍යමය වෛද්‍යවරයා ලබා ඇති ප්‍රඥාවේ සහ අවබෝධයේ උසස් තත්වයට ලගාවිම කළ නොහැක."[6]**

**"දෙවියන්වහන්සේගේ ප්‍රකාශවිම නම්වූ තැනැත්තාණන් සදහටම උන්වහන්සේගේ නියෝජිතයාත් උන්වහන්සේ වෙනුවෙන් කථාකරන්නාත් විය. ඇත්ත වශයෙන්ම එතුමා උන්වහන්සේගේ අතිශ්‍රේෂ්ඨ පටබැදි නාමවල අරුණෝදයත් උන්වහන්සේගේ උත්කෘෂ්ඨ ගුණාංගවල උදගිරත් වේ."[7]**

**"එසේම මේ සෑම දෙවියන්වහන්සේගේ ප්‍රකාශවිමකට වැඩකටයුතු සහ ක්‍රියාවන් පමණක් නොව එතුමන්ලාට අයත් සෑම දෙයක්ම සහ අනාගතයේදි එතුමන්ලා ප්‍රකාශයට පත් කරණ සෑම දෙයක්ම දෙවියන්වහන්සේ විසින් නියම කරන ලද ඒවා බවත් උන්වහන්සේගේ කැමැත්තේ සහ අරමුණේ පිළිබිඹු විමක් බවටත් නිසැක වන්න."[8]**

## 4 වන කොටස

ආගමේ ඒකීයභාවය බොහෝ දෙනෙකුට උනන්දුවක් දක්වන විෂයයක් වන අතර, පහත දැක්වෙන අදහස් ඔබට අවස්ථා ගණනාවකදී උපකාර වනු ඇත:

කුමන පහනකින් දිස්වුවත් අප ආලෝකයට ආදරය කරන්නන් විය යුතුය. රෝස මල කුමන උයනේ පිපුණත් අපි එයට ආදරය කරන්නන් විය යුතුය. සත්‍යය කුමන මූලාශ්‍රයකින් ආවත් අප සත්‍යය සොයන්නන් විය යුතුය. එක් පහනකට ඇලීසිටීමෙන් තවත් පහනක ආලෝකය බැබළෙන විට එය අගය කිරීමෙන් අපව වළක්වාලිය හැකිය. සත්‍යය සෙවීමේදී, අපි පූර්ව නිගමනවලින් මිදිය යුතු අතර අපගේ අගතීන් අත්හැරිය යුතුය. අපගේ කුසලානය තමාගෙන්ම පිරී තිබේ නම්, ජීවන ජලය සඳහා එහි ඉඩක් නැත.

ආගම ලෝකයේ ආලෝකයයි. එය අපගේ පියවර මෙහෙයවන අතර අපට නිමක් නැති සතුටේ දොරටු විවර කරයි. විරුද්ධවාදයක් නොඉවසන විශ්වාසය සහ අන්ධ අනුකරණය යන සීමාවලින් මිදී සියලුම ශ්‍රේෂ්ඨ ආගම්වල ඉගැන්වීම් විමර්ශනය කරන විට, ඒවා එකම පදනමක් මත රඳා පවතින බව අපට වැටහෙනු ඇත. ඔවුන් සියල්ලෝම දෙවියන්වහන්සේ පිළිබඳ දැනුම හෙළි කරති. ඔවුන් සොයන්නේ මනුෂ්‍යත්වයේ ලෝකයේ අභිවර්ධනයයි.

ඇත්ත වශයෙන්ම, කාලය හා ස්ථානයේ අවශ්‍යතා අනුව එක් එක් ආගම විසින් ප්‍රචාරය කරන ලද සමාජ නීති සහ රෙගුලාසි අතර වෙනස්කම් තිබේ. නමුත් එවායේ සාරය අනුව සියලුම ආගම් එකකි. එවා ශ්‍රද්ධාව, දැනුම, නිශ්චිතභාවය, යුක්තිය, ධර්මිෂ්ඨභාවය, උසස් මනස, විශ්වාසවන්තදයක භාවය, දෙවියන්වහන්සේට වූ ප්‍රේමය සහ පින්කටයුතු වගා කරති. ඔවුන් පිරිසිදුකම, වෙන්වීම, නිහතමානිකම, තිතික්ෂාව, ඉවසීම සහ ස්ථාවරත්වය උගන්වයි. මේ මනුෂ්‍ය ගුණධර්ම සෑම ශාසනයකදීම අලුත් වන්නේය.

අගතීන් සහ අන්ධ අනුකරණය නිසා බොහෝ දෙනෙකුට ආගමේ අභ්‍යන්තරයෙන් පවතින ඒකීයභාවය දැකීමට නොහැකි වීම අවාසනාවකි. මනුෂ්‍යත්වයට දෙවියන් වහන්සේගේ මඟ පෙන්වීම සත්‍යය වන අතර සත්‍යයට බෙදීම් නොමැත; එය එකකි. පූර්ව නිගමන පසෙකලා ස්වාධීනව සත්‍ය විමර්ශනය කරන්නේ නම්, අපගේ සෙවුම ඒකීයභාවයට තුඩු දෙනු ඇත. ආගම අපව එක්සත් කළ යුතුය; එය මිනිසුන් අතර ආදරයේ බැඳීම් ඇති කළ යුතුය. එය සතුරුකමට හා ආරවුලට හේතුව බවට පත්වේ නම්, එය නොපැමිණීම වඩාත් සුදුසුය.

1. පෙර කොටසේ මෙන්, ඔබ මෙම ප්‍රකාශය ඔබේ කණ්ඩායම තුළ කිහිප වතාවක් කියවා, අදහස්වලට අදාළ ප්‍රශ්න එකිනෙකාගෙන් අසා ඒවා හොඳින් ප්‍රකාශ කිරීමට පුරුදු විය යුතුය.

2. බොහෝ විට මිනිසුන්ගේ මනසෙහි ඇති ආගමික ගැටුම් ගැන පවසමින්, ඔබ අධ්‍යයනය කළ අදහස් සංවාදයකට ගෙනීමට ඔබ යා හැකි ආකාරය ඔබේ කණ්ඩායම තුළ සලකා බලන්න. නමුත් සත්‍යය විමර්ශනය කිරීමේ වැදගත්කම සහ ප්‍රචාරවලට හසු නොවී සිටීමේ වැදගත්කම ගැන සාකච්ඡා කරන මිතුරන් කිහිප දෙනෙකු අතර ඔබ ද සිටිනු ඇත. මිතුරන් සහ අසල්වාසීන්, සගයන් සහ හිතවතුන් සමඟ ඔබගේ මෑත සංවාද ගැන නැවත සිතන්න. මෙම අදහස් වටා ඇති සාකච්ඡාවකින් ප්‍රයෝජන ගත හැකි ඔවුන්ගේ මනසෙහි ඇති සමහර ගැටලු මොනවාද?

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

3. සංවාදයේදී ඉහත අදහස් බෙදගැනීමෙන් පසු, "සියලු ආගම්වලට පොදු සත්‍යයන් මොනවාද?" යනුවෙන් යමෙකු ඔබෙන් ඇසුවහොත් ඔබ පිළිතුරු දෙන්නේ කෙසේද?

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

4. බහා'උ'ල්ලා තුමාගේ ලේඛනවලින් පහත සඳහන් කොටස් වලින් එකක් හෝ දෙකක් කටපාඩම් කරගන්නා ලෙසට යෝජනා කෙරේ:

**"ලෝකයේ වෙසෙන මිනිසුන් කවර ජාතියකට හෝ ආගමකට අයත් වුවද එක් ස්වර්ගිය ප්‍රභවයකගෙන් තම ප්‍රබෝධය ලබාගන්නා බවටත් එක් දෙවියන්වහන්සේ කෙනෙකුගේ යටත් වැසියන් බවටත් කිසිම සැකයක් ඇතිවිය නොහැක."[8]**

**"සියලුම ආගම්වල අනුගාමිකයින් සමග මිත්‍රත්වයෙන් සහ සහෝදරත්වයෙන් ආශ්‍රය කරන්න."[9]**

**"දේව ධර්මය සහ උන්වහන්සේගේ ධර්මය උනන්දුකරවන මූලික අරමුණ නම් මනුෂ්‍ය වර්ගයාගේ ඕනෑ එපාකම් ආරක්ෂා කිරීම හා ඔවුන් අතර ඒකීයභාවය වර්ධනය කිරීමයි...."[10]**

**"දෙවියන්වහන්සේගේ ආගම ප්‍රේමය සහ ඒකීයභාවය උදෙසාය. එය වෛරයේ හෝ භේදයේ හේතුවක් කර නොගන්න."[11]**

## 5 වන කොටස

මීළඟට ඔබෙන් අධ්‍යයනය කිරීමට ඉල්ලා සිටින විෂයය වන්නේ විද්‍යාව සහ ආගම අතර වූ සම්බන්ධයයි.

ආගම විද්‍යාවට අනුකූල විය යුතුය. සත්‍යය කුමක්දැයි වටහා ගැනීමට දෙවියන්වහන්සේ අපට හේතු හිමිකොට දී ඇත. විද්‍යාව සහ ආගම යන දෙකම හේතුවේ ප්‍රමිතීන් සපුරාලීමට අපේක්ෂා කෙරේ. එබැවින් ඔවුන් එකිනෙකා සමඟ එකඟ විය යුතුය. ඒවා මිනිස් බුද්ධියට විශාල උසකට යා හැකි පියාපත් දෙකක් වන අතර, එම පියාපත් දෙක සමගින් මනුෂ්‍යත්වයට පියාසර කළ හැකිය. එක් තටුවක් ප්‍රමාණවත් නොවේ.

විද්‍යාව දෙවියන්වහන්සේගේ දායාදයකි. එය භෞතික ලෝකයේ නීති සොයා ගන්නා අතර ස්වභාවධර්මය අප මත පනවා ඇති සීමාවන් ජය ගැනීමට අපට හැකි වේ. විද්‍යාත්මක උපකරණ ආධාරයෙන් පියවි ඇසට නොපෙනෙන දේවල් අපි දකින අතර ක්ෂණයකින් විශාල දුරක් හරහා සන්නිවේදනය කරමු. විද්‍යාව වර්තමානය සහ අතීතය ඒකාබද්ධ කරන අතර අනාගතයේ අභිරහස් විනිවිද යයි. මිනිසුන්ගේ දියුණුව රඳා පවතින්නේ විද්‍යාත්මක ජයග්‍රහණ මතයි.

දෙවියන්වහන්සේගේ ආගම සත්‍යය ප්‍රවර්ධනය කරන්නා, දැනුමේ ආධාරකරුවා සහ මානව වර්ගයා ශිෂ්ඨත්වයට පත් කරන්නාද වෙති. ආගමෙන් තොරව විද්‍යාව භෞතිකවාදය ඉදිරියට

ගෙන යාමේ මෙවලමක් බවට පත්වන අතර අවසානයේ බලාපොරොත්තු සුන්වීම කරා ගෙන යයි. ආගම විද්‍යාවට විරුද්ධ වූ විට එය හුදු මිත්‍යා විශ්වාසයක් බවට පත් වේ. ආගම සහ විද්‍යාව සමගියෙන් ගමන් කළහොත් දූන් මනුෂ්‍යත්වයට දුක් ගෙන දෙන වෛරය සහ මහත් දෙම්නස බොහෝ දුරට අවසන් වනු ඇත.

1. සෑම විටම මෙන්, ඔබේ කණ්ඩායමේ ප්‍රකාශය කිහිප වතාවක් කියවා, ඡේදයෙන් ඡේදය කියවා, ඔබ එය ස්වභාවිකව ප්‍රකාශ කිරීමට තරම් හොඳින් අන්තර්ගතය ඉගෙන ගන්නා තෙක් එකිනෙකාගෙන් ප්‍රශ්න අසන්න.

2. පහත සඳහන් දේ පැවසූ කෙනෙකුට ඔබ ප්‍රතිචාර දක්වන්නේ කෙසේද? "ආගම අතීතයට අයත් දෙයක්; විද්‍යාව මානව වර්ගයාගේ සියලු ගැටලු විසඳනු ඇත." ආගම මිථ්‍යාදෘෂ්ටිය හා සමාන නොවන බවත්, විද්‍යාවෙන් තොරව එය එසේ වන බවත්, ආගමෙන් තොර විද්‍යාව භෞතිකවාදයෙන් උපන් බලාපොරොත්තු සුන්වීමට හේතු වන බවත් පැහැදිලි කිරීම ඔබට ප්‍රයෝජනවත් වේද? මෙය සිදු වන ආකාරය පිළිබඳ උදහරණ ලබා දිය හැකිද?

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

3. බහා'උ'ල්ලාතුමාගේ ලේඛනවලින් පහත සඳහන් කොටස් එකක් හෝ කිහිපයක් කටපාඩම් කරන ලෙස යෝජනා කෙරේ:

**"සර්වබලධාරීන් වහන්සේ මනුෂ්‍යයා කෙරෙහි ප්‍රදනය කරන ලද මේ අනුග්‍රහයන් අතර ප්‍රථම සහ ප්‍රධාන වන්නේ අවබෝධය නමැති ත්‍යාගයයි... මෙම ත්‍යාගය මිනිසාට සෑම දෙයකදීම සත්‍යය වටහා ගැනීමට බලය ලබා දෙයි, ඔහුව හරි දෙයට යොමු කරයි, සහ නිර්මාණයේ රහස් සොයා ගැනීමට ඔහුට උපකාර කරනු ඇත."[12]**

**"ලෝකය දෙස බලන්න, ඒ මත ටිකක් ඕනෑකමින් සිතා බලන්න. එය ඔබේ ඇස් ඉදිරියෙහි තමාගේම පොත විවෘත කර, මෝස්තරකරු, සර්ව ඥනාන්විත ඔබගේ ස්වාමීන්වහන්සේගේ පන්හිදෙන් එහි කොටා ඇති දේ අනාවරණය කරයි. "[13]**

**"දැනුම මිනිසාගේ ජීවිතයට පියාපත් වැනිය, ඔහුගේ ආරෝහණය සඳහා ඉණිමඟකි. එය අත්පත් කර ගැනීම සෑම කෙනෙකුගේම යුතුකමයි."[14]**

**6 වන කොටස**

මනුෂ්‍යත්වයේ ඒකීයභාවය අද සෑම තැනකම මිනිසුන්ගේ හදවත් තුළ දෝංකාර දෙන විෂයයක් වන අතර, පහත ඉදිරිපත් කර ඇති අදහස් ඔබ සමඟ සාකච්ඡා කිරීමට බොහෝ දෙනෙක් සාදරයෙන් පිළිගනිති.

නොයෙක් වර්ණවලින් යුත් සුවඳින් යුත් මල් එක පැත්තකින් වැවෙන උද්‍යානයක් නෙතට පිනවන සුළුය. එවා වෙනස් වුවද, සෑම මලක්ම එකම වැස්සකින් ප්‍රබෝධමත් වන අතර එක් හිරුගේ උණුසුම ලබා ගනී. මනුෂ්‍යත්වය සම්බන්ධයෙන්ද මෙය සත්‍යයකි. එය බොහෝ වර්ග සහ වර්ණ වලින් සමන්විත වේ. නමුත් සියල්ලන් පැමිණෙන්නේ එකම දෙවියන්වහන්සේගෙන් වන අතර සියල්ලටම එකම සම්භවයක් ඇත. සංගීතය තුළ විවිධ ස්වර එකට මුසු වී පරිපූර්ණ

ස්වර සංඝාතයක් ඇති කරන ආකාරයෙන් මිනිස් පවුල තුළ ඇති විවිධත්වය සහජීවනයේ උල්පතක් විය යුතුය.

පැවැත්ම සඳහා ඒකීයභාවය අවශ්‍යය. ප්‍රේමය ජීවිතයේ එකම හේතුවයි. භෞතික ලෝකයේ, සියලු දේවල මූලද්‍රව්‍ය ආකර්ෂණ නියමය මගින් එකට තබා ඇත. ඒවායේ මූලධාතු එකට බැඳී පවතින්නේ ආකර්ෂණයේ නීතිය අලංකාර මලක් ලෙස යම් යම් මූලධාතු එකට එකතු කරමිනි. එහෙත් ඒ ආකර්ෂණය ඉවත් වූ විට මල විනාශ වී එහි පැවැත්ම අවසන් වෙයි. මනුෂ්‍ය වර්ගයා කෙරෙහිද මෙය මෙසේමය. ආකර්ෂණය, එකමුතුව හා ඒකීයභාවය මනුෂ්‍ය වර්ගයා එකට බැඳ තබන බලවේගයන් වෙති.

බහා'උ'ල්ලා තුමා ලෝකයේ සිටින සියළුම මනුෂ්‍යවර්ග එකට එකතු කිරිම සඳහා මෝසත්රයක් සාද තිබේ. ඔවුන් මේ ඒකීයභාවයේ මණ්ඩලය තුලට ඇද ගැනීමට අප හැකි සෑම උත්සාහයක්ම කළ යුතුය. අපේ අදහස්වලට වඩා වෙනස් ජාති, ආගම් සහ මත දරන මිනිසුන් හමු වූ විට මේ වෙනස්කම් අප අතර බාධක බවට පත් වීමට ඉඩ නොතැබිය යුතුය. අප ඔවුන් මනුෂ්‍ය වර්ගයා නමැති ලක්ෂණ උද්‍යානයෙහි වැඩෙන විවිධ පාටැති රෝස මල් ලෙස සිතා ඔවුන් අතර සිටිම ගැන සතුටු විය යුතුයි.

1. ඔබ පෙර ප්‍රකාශයන්හිදී කළාක් මෙන් ඉහත ප්‍රකාශය අධ්‍යයනය කිරීමෙන් පසු, ඔබ වටා දිග හැරෙන බොහෝ සංවාද ගැන සිතන්න. මෙම අදහස් ඔවුන් සමග බෙදා ගැනීමට ඔබට හැකියාව විවෘත කරන මිනිසුන්ගේ මනසෙහි ඇති ගැටළු මොනවාද?

...................................................................................................................................

...................................................................................................................................

...................................................................................................................................

...................................................................................................................................

2. මනුෂ්‍යවර්ගයාගේ ඒකීයභාවය පිළිබඳ සංවාදයක් තම ප්‍රජාව තුළ එකමුතුකමේ වැදගත්කම පිළිබඳ සාකච්ඡාවකට තුඩු දිය හැකිය. ඒ සඳහා අප එක් එක් කෙනාට දයක විය හැකි ආකාරය ගැන ඔබට වචන කිහිපයක් පැවසිය හැකිද?

...................................................................................................................................

...................................................................................................................................

...................................................................................................................................

...................................................................................................................................

3. පහත සඳහන් උපුටා දැක්වීම් එකක් හෝ කිහිපයක් කටපාඩම් කිරීමට ඔබට අවශ්‍ය විය හැක, එවිට ඔබ ඔබේ මිතුරන් සමඟ මෙම විෂය ගැන කතා කරන විට ඒවා වෙත යොමු විය හැක:

**"ඒකීයභාවයේ කූඩාරම ගොඩනගා ඇත; ඔබලා එකිනෙකා අමුත්තන් ලෙස නොසලකන්න. ඔබලා එක ගසක ගෙඩිය, එක අත්තක කොළය."[15]**

**"ඒකීයභාවයේ ආලෝකය කොපමණ ප්‍රබලද කිවහොත්, එයට මුලු පෘථිවියම ආලෝකමත් කළ හැක."[16]**

**"ඔබලාගේ මුහුණු ඒකීයභාවය දෙසට යොමු කොට, එහි ආලෝකයේ දීප්තිය ඔබ මත බැබලීමට ඉඩ හරින්න. ඔබලා එකට එකතු වී, දෙවියන්වහන්සේ වෙනුවෙන්, ඔබලා අතර භේදයට හේතුවූ සෑම දෙයක්ම මුලිනුපුටා දැමීමට තීරණය කරන්න."[17]**

**"මිත්‍රත්වය, කරුණාවන්ත භාවය හා ඒකීයභාවය වැඩි දියුණු කරන දේ කෙරෙහි තදින් බැඳි සිටිම මනුෂ්‍යයාට යෙදේ."[18]**

## 7 වන කොටස

පහත ප්‍රකාශය බොහෝ මිනිසුන්ගේ මහත් සැලකිල්ලක් දක්වන යුක්තිය පිළිබඳ විෂය පිළිබඳ සාකච්ඡා සඳහා දයක වීමට ඔබට උපකාරී වනු ඇතඃ

පුද්ගලයන්ගේ හැකියාවන්ගේ වෙනස මානව පැවැත්මට මූලික වේ. එබැවින්, සියලු මිනිසුන්ට සෑම අතින්ම සමාන විය නොහැක. එහෙත් මානව කටයුතු සම්පූර්ණයෙන් යුක්තිය පිළිබඳ මූලධර්මය මගින් පාලනය විය යුතුය. යුක්තිය පරිශුද්ධ විය යුතු අතර සෑම පුද්ගලයෙකුගේම අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුය.

යුක්තිය සීමා නොවේ; එය විශ්වීය ගුණාංගයකි. එය මිනිස් ජීවිතයේ සියලුම දෙපාර්තමේන්තු තුළ ක්‍රියාත්මක විය යුතුය. සමාජයේ සෑම සාමාජිකයෙක්ම ශිෂ්ටාචාරයේ ප්‍රතිලාභ භුක්ති විඳිය යුතුය, මන්ද අප සියල්ලන්ම මනුෂ්‍යත්වයේ ශරීරයට අයත් වන බැවිනි. මේ ශරීරයේ එක් සමාජිකයෙකු සංවේගය හෝ පීඩාවට පත් වුවහොත් අනෙක් සියලුම සමාජිකයින්ද අවිකල්පයෙන් දුක් විඳිති. කෙනෙක් පීඩාව පත්ව සිටින විට අනිත් අය සැහැල්ලුවෙන් සිටින්නේ කෙසේද? අද සමාජයට අවශ්‍ය පරස්පරත්වය සහ සමමිතිය නොමැත; එය හොඳින් සකසා නැත. මුළු මිනිස් පවුලේම යහපැවැත්ම සහ සන්තෝෂය සහතික කරන නීති සහ ප්‍රතිපත්ති අවශ්‍ය වේ.

යුක්තිය ස්ථාපිත වන්නේ ත්‍යාගය සහ දඬුවම යන කුළුණු මතය. ශ්‍රද්ධාවක් නැති, දිව්‍යමය ඵලවිපාකය ගැන බියක් නැති අය විසින් පාලනය කරනු ලබන ආණ්ඩු, අසාධාරණ නීති ක්‍රියාත්මක කරනු ඇත. පීඩාව වැලැක්වීමට නම් ත්‍යාගය ගැන වූ බලාපොරොත්තුව සහ දඬුවමට ඇති බිය යන දෙකම අවශ්‍ය වේ. නීති සම්පාදකයින් සහ නීති පරිපාලකයින් ඔවුන්ගේ තීරණවල අධ්‍යාත්මික ප්‍රතිවිපාක පිළිබඳව දැනුවත් විය යුතුය. ඔවුන්ගේ ක්‍රියාවන්හි ප්‍රතිවිපාක මේ භූමික ජීවිතයෙන් ඔබ්බට ඔවුන් පසුපස හඹා යනු ඇතැයි විශ්වාස කරන සහ ඔවුන්ගේ විනිශ්චයන් දිව්‍යමය යුක්තියේ සමතුලිතතාවයෙන් කිරා බලන බව දන්නා පාලකයන් නිසැකවම කෲරත්වය සහ පීඩනයෙන් වැළකී සිටිනු ඇත.

1. ඉහත අදහස් ස්වභාවිකව ප්‍රකාශ කිරීමට ඔබ ඉගෙන ගත් පසු, ප්‍රකාශයේ ඉදිරිපත් කරන අන්තර් දෘෂ්ඨිය ප්‍රයෝජන ගත හැකි සංවාදයේ මාතෘකා මොනවාදැයි සලකා බලන්න.

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

2. අයුක්තිය කිසිදු අවසන් නොවනු ඇතැයි විශ්වාස කරන කෙනෙකුට ඔබ ප්‍රතිචාර දක්වන්නේ කෙසේද?

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

3. පහත දැක්වෙන්නේ ඔබට කටපාඩම් කිරීමට දිරිගන්වනු ලබන යුක්තිය සම්බන්ධ බහා'උ'ල්ලා තුමාගේ ලේඛනවලින් උපුටා දැක්වීම් කිහිපයකි.

**"මිනිසුන්ගේ ආලෝකය යුක්තියයි. දුෂ්ට පාලනය හා කර භාවය නමැති ප්‍රතිවිරුද්ධ සුළඟින් එය නොනිවාලන්න. යුක්තියේ අරමුණ නම් මිනිසුන් අතර ඒකීයභාවය ඇති කිරීමයි."[19]**

**"කිසිම දීප්තියක් යුක්තිය හා සමාන කළ නොහැක. ලෝකයේ ක්‍රමානුකූල භාවයත් මනුෂ්‍යවර්ගයාගේ ශාන්තභාවයත් රදපවත්නේ ඒ මතය."[20]**

**"ලෝකය පුහුණු කරනු ලබන්නේ යුක්තිය විසිනි, එය රදපවත්නේ ත්‍යාගය හා දඬුවම යන කුළුණු දෙක මතය. මේ කුළුණු දෙක ලෝකයට ජීව ප්‍රභවය වෙති."[21]**

## 8 වන කොටස

ගෙවී යන සෑම දිනකම ධනවතුන් සහ දුප්පතුන් අතර පරතරය පුළුල් වන අතර පහත ප්‍රකාශය මේ පිළිබඳව සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳව මිතුරන් සමග කතා කිරීමට ඔබට සහාය වනු ඇත.

අද, පරස්පරත්වය සහ සුහද සබඳතා නොමැතිකම නිසා, සමාජයේ සමහර සාමාජිකයන් තෘප්තිමත් වන අතර, ඉතා සුවපහසුව සහ සුඛෝපභෝගී ජීවිතයක් ගත කරන අතර අනෙක් අය ආහාර සහ නවාතැන් හිඟව සිටිති. සමහරු අතිමහත් ලෙස ධනවත් වන අතර තවත් අය අන්ත දුප්පත්කමෙන් ජීවත් වෙති.

කිහිප දෙනෙකුට අසීමිත ලෙස ධනය රැස්කර ගැනීමටත් තවත් පිරිසක් අසරණ වීමටත් නොහැකි වන පරිදි සමාජයේ නීති සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. මට්ටමේ සහ හැකියාවේ වෙනස්කම් නිර්මාණයට ආවේනික බැවින් සියල්ල සමාන විය යුතු බව මින් අදහස් නොවේ. එහෙත් ධනයේ බේදජනක අධිකත්වය සමගින් අධෛර්යමත් කරන දිළිඳුකම අහෝසි කළ හැකිය. ධනපතියෙකුට ධනයක් තිබීම නිවැරදි නම්, කම්කරුවාට පැවැත්ම සඳහා ප්‍රමාණවත් වත්කමක් තිබීම ද ඒ හා සමානව සාධාරණය. අන්ත දරිද්‍රතාවය දකින විට කොතැනක හෝ කුරිරු පාලනයක් අපට හමුවනු ඇත.

කාරණයේ සාරය නම් දිව්‍යමය යුක්තිය මිනිස් තත්වයන් තුළ ප්‍රකාශ විය යුතු බවයි. සමස්ත ආර්ථික තත්වයේ මූලික කරුණු දිව්‍යමය ස්වභාවයක් ගන්නා අතර හදවතේ සහ ආත්මයේ ලෝකය සමග සම්බන්ධ වේ. ධනවත් අය ඔවුන්ගේ අධිකත්වය දිය යුතුය; ඔවුන් තම හදවත් මෘදු කර දයානුකම්පිත බුද්ධියක් වර්ධනය කර ගත යුතුය. හදවත් කෙතරම් එකට බැඳී තිබිය යුතුද යත්, ආදරය එතරම් ප්‍රමුඛ විය යුතුද යත් ධනවතුන් ආර්ථික ගැලපීම් ස්ථිර ලෙස ස්ථාපිත කිරීමට බොහෝ කැමැත්තෙන් පියවර ගනු ඇත. ප්‍රජාව තුළ අන්ත දරිද්‍රතාවය පවතින අතරම ඔවුන් විශාල ධනයක් හිමි කර ගැනීම යුක්ති සහගත හෝ නීත්‍යානුකූල නොවන බව ඔවුන්ම අවබෝධ කර ගත යුතුය. මේ ආකාරයෙන්, ඔවුන්ට සුවපහසු ලෙස ජීවත් වීමට හැකි තරම් තබා ගනිමින්, ඔවුන් තම ධනය කැමැත්තෙන් ලබා දෙනු ඇත.

1. ප්‍රකාශය කියවා සුපුරුදු ආකාරයෙන් ඔබේ කණ්ඩායම තුළ එය අධ්‍යයනය කරන්න. ධනය හා දරිද්‍රතාවයට සම්බන්ධ මිනිසුන්ගේ මනසෙහි බොහෝ ප්‍රශ්න තිබේ - රැකියා, වැටුප්, නිවාස,

එයින් නම් කලහැකි කිහිපයකි. මෙම ප්‍රකාශයේ ඇති අදහස්වලින් ප්‍රයෝජන ගත හැකි වෙනත් මාතෘකා ගැන ඔබට සිතිය හැකිද?

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

2. ඉහත අදහස් ඔබ සඳහන් කරන බව ඇසූනු කෙනෙකු ඔබෙන් පහත සඳහන් දේ ඇසුවහොත් ඔබ දෙන පිළිතුර කුමක්ද? "ඔබ කියන්නේ ධනවතුන් දැඩි බදු නීති තේරුම් ගෙන එයට සහය ලබා දී එසේම ඔවුන් කැමැත්තෙන්ම ගෙවිය යුතු දේ ගෙවයි කියාද? මෙය කළ හැකි යැයි ඔබ සිතන්නේ කෙසේද?"

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

3. බහා'උ'ල්ලා තුමාගේ ලේඛනවලින් වූ මෙම උපුටා දැක්වීම් එකක් හෝ දෙකක් කටපාඩම් කර ගැනීමට යෝජනා කෙරේ:

**"....එයින් ඔබටත් අන් අයටත් ප්‍රයෝජන ලැබෙනු පිණිස, ඔබ යහපත් හා ආශ්චර්යමත් ඵලයන් දිය යුතුය. එබැවින් ශිල්ප හා වෘත්තීන්හි නියැලීම සෑම කෙනෙකුටම අනිවාර්ය වේ, මන්ද, අහෝ අවබෝධය ඇති පුරුෂයෙනි! ධනයේ රහස එහි ඇත."[22]**

**"ඔබගේ දෑස් දයාව දෙසට යොමු කර ඇත්නම්, ඔබට ප්‍රයෝජන ගෙන දෙන දේවල් අත්හැර මනුෂ්‍ය වර්ගයාට ප්‍රයෝජනවත් වන දෙයහි නියැලෙන්න. ඔබගේ දෑස් යුක්තිය දෙසට යොමු වී ඇත්නම්, ඔබ ඔබ වෙනුවෙන් තෝරා ගන්නා දේ ඔබේ අසල්වැසියාටද තෝරාගන්න. "[23]**

**"තමාට වඩා තම සහෝදරයාට සලකන කරන තැනැත්තා ආශිර්වාද ලද්දෙකි."[24]**

**"කිසිදු යහපත් ක්‍රියාවක් කිසිද නැති වී හෝ නැති වන්නේ නැත, මක්නිසාදයත් කරුණාවන්ත ක්‍රියාවන් ක්‍රියා කරන්නන්ගේ ප්‍රයෝජනය සඳහා දෙවියන්වහන්සේ සමඟ සුරකින ලද නිධානයකි."[25]**

**". . . මධ්‍යස්ථ සීමාවන් ඉක්මවා නොයෑමට ප්‍රවේශම් වන්න, ප්‍රමාණය ඉක්මවා යන අය අතරට ගණන් ගනු ලැබේ." [26]**

## 9 වන කොටස

අගතිය පිළිබඳ විෂය පිළිබඳ සාකච්ඡාවලට සහභාගි වීමට ඔබට උපකාර වන අදහස් කිහිපයක් පහත දැක්වේ.

ආගමික, වාර්ගික, ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගික, ආර්ථික යන සෑම ආකාරයකම අගතිය මනුෂ්‍යත්වයේ මන්දිරය විනාශ කරන අතර දෙවියන්වහන්සේගේ ආඥාවලටද විරුද්ධ වේ. වසර දහස් ගණනක් තිස්සේ මානව වර්ගයා යුද්ධයෙන් පීඩා විඳිමින් සිටින අතර මෙම අගතීන්ගෙන්

එකක් හෝ තවත් එකක් නිසා ඇති වූ ලේ වැගිරීම් වලින් පීඩා විඳිති. ඒවා පවතින තාක් මනුෂ්‍යත්වයට විවේකයක් නැත.

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ අනාගතවක්තෘවරුන් එවා ඇත්තේ ආදරය හා එකමුතුකම ඇති කිරීමේ එකම අරමුණ සඳහා ය. සියලුම ස්වර්ගීය පොත් ආදරයේ ලිඛිත වචනයයි. ඔවුන් විරසකයට හේතුව බව ඔප්පු වුවහොත් ඒවා නිෂ්ඵල වී ඇත. එමනිසා, ආගමික අගතිය විශේෂයෙන් දෙවියන්වහන්සේගේ කැමැත්තට සහ අණට විරුද්ධය.

ජාතික අගතිය සම්පූර්ණයෙන්ම යුක්ති සහගත නොවේ. පෘථිවිය එක් දේශයකි, එක් රටකි. ජාතීන් වෙන් කරන රේඛා සහ මායිම් මනඃකල්පිතය; ඔවුන් දෙවියන්වහන්සේ විසින් මවන ලද ඒවා නොවේ. මිනිසුන් ගංගාවක් රටවල් දෙකක් අතර මායිම් රේඛාවක් ලෙස ප්‍රකාශ කරයි, සෑම පැත්තකටම නමක් ලබා දෙයි, නමුත් ගංගාව දෙකම සඳහා නිර්මාණය කර ඇති අතර එය සැමට ස්වභාවික ධමනියක් වේ. ජීවිතයේ ත්‍යාගයන් යුද්ධයට සහා විනාශයට හේතුව බවට පත් කිරීමට මිනිසුන් පොළඹවන්නේ පරිකල්පනය සහ නොදැනුවත්කම නොවේද?

වාර්ගික අගතිය මිථ්‍යා විශ්වාස මිස අන් කිසිවක් නොවේ. පුද්ගලයෙකුගේ සමේ වර්ණය හුදෙක් ඔහුගේ හෝ ඇයගේ මුතුන් මිත්තන් දේශගුණයට හා පරිසරයට අනුවර්තනය වීමේ ප්‍රතිඵලයකි. චරිතය මනුෂ්‍යත්වයේ සැබෑ නිර්ණායකයයි. විශිෂ්ටත්වය ජාතිය සහ වර්ණය මත රඳා නොපවතී. ශ්‍රද්ධාව, හදවතේ පිරිසිදුකම, යහපත් ක්‍රියා සහ ප්‍රශංසනීය කථාව දෙවියන්වහන්සේගේ එළිපත්තෙහි පිළිගත හැකි දෙයකි.

දිගු කලක් තිස්සේ කාන්තාවන් පිරිමින්ට යටත් කර අසාධාරණයට ලක්ව ඇත. පිරිමි සහ ගැහැණු අතර වෙනස භෞතික ලෝකයේ අවශ්‍යතාවයකි; ආත්මයේ ලෝකයේ ඔවුන් සමාන ය. දෙවියන්වහන්සේගේ ඇස්තමේන්තුව අනුව, පිරිමි සහ ගැහැණු ලෙස භේදයක් නොමැත. සියලු මනුෂ්‍ය වර්ගයාට උන්වහන්සේ විසින් බුද්ධිය සහ සංජානනය ලබා දී ඇත. සියලු දෙනාටම ගුණධර්ම ලබා ගැනීමේ හැකියාව දී ඇත. පුද්ගලයෙකුගේ ලිංගිකත්වය වෙනස් කොට සැලකීමට හේතු වන තත්වයක් අද නොමැත.

පරණ ගිවිසුමේ වදන්වලට අනුව, දෙවියන්වහන්සේ පවසා ඇත්තේ, "අපගේ ස්වරූපයෙන්, අපගේ සමානකමට අනුව මිනිසා සාදමු යනුවෙනි." මෙය පැහැදිලිවම කාන්තාවන්ටද අදාළ වේ. මිනිසා දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මවා ඇත; එනම් දිව්‍යමය ගුණාංග මනුෂ්‍ය යථාර්ථය තුළ පිළිබිඹු වී ප්‍රකාශයට පත්වේ. මෙය සමස්ත මනුෂ්‍ය වර්ගයාටම සත්‍යයකි. දෙවියන්ගේ ස්වරූපයෙන් මවන ලද්දේ එක් වර්ණයක්, වාර්ගික හෝ ජාතිකත්වයක් ඇති අය පමණක් යැයි ප්‍රකාශ කිරීම කොතරම් දුරට පිළිගත නොහැකි ද? ධනවතුන් පමණක් උන්වහන්සේගේ රූපයෙන් සෑදී ඇති බව හෝ දෙවියන්වහන්සේට සමීප වීමට සමාජයේ ඉහළ තනතුරක් නිර්ණායකයක් ලෙස සිතීම බව ඇඟවුම් කිරීම කෙතරම් විකාර සහගතද? අගතීන් අත්හැර රාජධානියේ සදාචාරයන් අත්පත් කර ගැනීමෙන් මිස මනුෂ්‍යත්වයට ආලෝකය ලබා ගත නොහැක.

1. ඔබ පෙර ප්‍රකාශය කළාක් මෙන් මෙම ප්‍රකාශය අධ්‍යයනය කර, අගතිය තුරන් කිරීම සඳහා ඉල්ලා සිටින ඔබේ මිතුරන් සහ අසල්වාසීන් සංවාදයට ගෙනවිත් ඇති අභියෝග කිහිපයක් ගැන සිතන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

2. ඉහත අදහස් ඔබ පවසන බව අසා සිටි කෙනෙක් "අපට අගතියක් තිබිය හැකිද සහ එය නොදැන සිටිය හැකිද?" යනුවෙන් ඔබෙන් ඇසුවොත් ඔබ දෙන පිළිතුර කුමක්ද?

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

3. මෙම අදහස් පිළිබඳ ඔබේ සාකච්ඡාවලට බහා'උ'ල්ලා තුමාගේ ලේඛනවලින් පහත සඳහන් උපුටා දැක්වීම් වලින් එකක් හෝ ඇතුළත් කිරීමට ඔබට අවස්ථාවක් සොයාගත හැකිය:

**"පෘථිවිය එකම රටක් වන අතර මනුෂ්‍යවර්ගයා එහි පුරවැසියන් වේ."**[27]

**"ලෝකයේ සියලුම අංකුර එක් ගසකින් ද, සියලු ජල බිංදු එක් සාගරයකින් ද මතු වී ඇත, සියලු ජීවීන් ඔවුන්ගේ පැවැත්මට ණයගැතියි."** [28]

**"අද තමාවම මුළු මහත් මානව වර්ගයාගේම සේවයට කැපකර සිටින තැනැත්තා සැබවින්ම මිනිසෙකි"**[29]

**"හොඳ චරිතයක ආලෝකය සූර්යයාගේ ආලෝකය සහ එහි දීප්තිය අභිබවා යයි."**[30]

**"මිනිසාගේ වෙනස පවතින්නේ ආභරණ හෝ ධනය මත නොව, යහපත් හැසිරීම සහ සැබෑ අවබෝධය මතය."** [31]

**"මිථ්‍යා විශ්වාසවල ප්‍රතිමා බිඳ දැමීමට සහ මිනිසුන්ගේ පරිකල්පනවල වැස්ම ඉරා දැමීමට දෙවියන්වහන්සේ ඔබට සියලු තත්වයන් යටතේ කරුණාවෙන් උපකාර කරනු ඇත."** [32]

**"සියලු මිනිසුන් අතර වඩාත්ම නොසැලකිලිමත් වන්නේ උදාසීන ලෙස වාද කරන සහ තම සහෝදරයා අභිබවා යාමට උත්සාහ කරන තැනැත්තායි."** [33]

## 10 වන කොටස

මිතුරන් සමඟ සංවාදයේ යෙදෙන විට, ඔබට බොහෝ විට පහත ප්‍රකාශයේ ඇති ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ අදහස් උකහා ගත හැකි වනු ඇත.

> භෞතික සූර්යයා, එහි ආලෝකය සහ තාපය හරහා, පෘථිවියේ සියලු දේවල යථාර්ථය හෙළි කරයි. ගසේ සැඟවී ඇති ඵලයන් හිරුගේ බලයට ප්‍රතිචාර වශයෙන් එහි අතු මත දිස් වේ. එලෙසම, සත්‍යයේ සූර්යයා, අධ්‍යාත්මික ආකාශයේ පූර්ණ තේජසින් බබළමින්, අතීතයේ නොපෙනුණු යථාර්ථයන් ආලෝකයට ගෙන එයි. මෙම යුගයේ දී, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ මූලධර්මය සම්පූර්ණයෙන්ම පිළිගෙන ඇති අතර එය දැන් ස්ථාපිත සත්‍යයක් වී ඇත්තේ එබැවිනි.
>
> දෙවියන්වහන්සේ ඉදිරියෙහි ස්ත්‍රී පුරුෂ භේදයක් නොමැති බව බහා'උ'ල්ලා තුමා පැහැදිලිවම ප්‍රකාශ කර ඇත. යුග ගණනාවක් පුරා පැවති අසමානතාවයේ තත්වය පුරුෂයින්ගේ උසස් බවේ ප්‍රතිඵලයක් නිසා නොව; සරලව කිවහොත්, කාන්තාවන්ට ඔවුන්ගේ සියලු හැකියාවන් වර්ධනය කර ගැනීමට සමාන අවස්ථාවන් ලබා දී නොතිබීමයි. ඔවුන්ට එරෙහි අගතිය

තිබියදීත්, කෙසේ වෙතත්, ඉතිහාසයේ විශාලතම ජයග්‍රහණ අත්කරගත් බොහෝ කාන්තාවන්ගේ ජීවිත කතාවන් ඇත.

එවැනි එක් කාන්තාවක් වූයේ පර්සියානු කිවිඳියකු වූ, තහිරිය. ඇය උපත ලැබුවේ 1800 ගණන්වල මුල් භාගයේදී කාන්තාවන් සම්පූර්ණයෙන්ම පිරිමින්ගේ යටතට පත්වූ රටකය. දෙවියන්වහන්සේගේ නව එළිදරව්වේ සත්‍යය පිළිගත් පළමු කාන්තාව ඇයයි. ඇය නව දිනයක උදාව සාක්ෂි දරූ විට, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයේ යථාර්ථය පිළිගත යුතු කාලය පැමිණ ඇති බව ඇයට ඒත්තු ගියාය. මෙම සත්‍යය ප්‍රකාශ කිරීමට ඇය සිය ශක්තිය කැප කළාය. ඇගේ දැනුම සහ කවීකත්වය ඇගේ කාලයේ සිටි වඩාත්ම උගත් මිනිසුන්ව ව්‍යාකූල කළේය. පීඩිත රජෙකුගේත් නූගත් උඩගු පූජකයින්ගේත් සියලු බලවේග ඇයට එරෙහි වුවද සත්‍යය ප්‍රකාශ කිරීමට ඇය මොහොතකටවත් පසුබට වූයේ නැත. අවසානයේදී, ඇය දැඩි ලෙස වැළඳගත් ධර්මය වෙනුවෙන් ඇය තම ජීවිතය පුද කලේය.

දෙවියන්වහන්සේ අදහස් නොකළ දේ විශ්වාස කිරීම නොදැනුවත්කම සහ මිථ්‍යා විශ්වාසයි. අද කාන්තාවන්ට අධ්‍යාපනය ලැබීමට සහ මානව ප්‍රයත්නයේ සෑම ක්ෂේත්‍රයකම පිරිමින් සමඟ සමානාත්මතාවයෙන් යුත් ස්ථානයක් ලබා ගැනීමට සෑම අවස්ථාවක්ම ලබා දිය යුතුය. අධ්‍යාත්මික ක්ෂේත්‍රයේ මෙන් මෙලොවදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය යථාර්ථයක් වන තුරු මනුෂ්‍ය වර්ගයාගේ සැබෑ ප්‍රගමනය කළ නොහැකි වනු ඇත.

1. ඔබ සෑම විටම මෙන් ඔබේ කණ්ඩායම තුළ මෙම ප්‍රකාශය අධ්‍යයනය කර අදහස් පැවසීමට පුරුදු විය යුතුය. එය ලබා දෙන අන්තර් දෘශ්ඨිය ප්‍රයෝජන ගත හැකි ඔබේ මිතුරන් සමඟ ඔබ මෑතකදී කළ සංවාදයක් තිබේද? සාකච්ඡාවට බඳුන් වූ ගැටළු මොනවාද?

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

2. සෑම ක්ෂේත්‍රයකින්ම පිරිමින් හා සම තැන ගැහැනියට හිමිවන්නේ නම් වෙනස් විය යුතු වර්තමාන සමාජයේ පවතින සමහර විශ්වාසයන් සහ ආකල්ප මොනවාද?

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

3. පහත දැක්වෙන්නේ ඔබට කටපාඩම් කිරීමට අවශ්‍ය බහා'උ'ල්ලා තුමාගේ ලේඛනවලින් උපුටා දැක්වීම් කිහිපයකි.

**"දෙවියන්වහන්සේගේ දර්ශනය හමුවේ අතීතයේදී ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය එක සමාන වූවාක් මෙන්ම අනාගතයේදීද නිරන්තරයෙන්ම එසේ වනු ඇත."**[34]

**"අපි ඔබ සියලු දෙනාම එකම දූවිල්ලෙන් නිර්මාණය කළේ ඇයි දැයි නොදන්නෙහිද? කිසිවෙක් අනෙකාට වඩා උසස් නොවීම සඳහාය."**[35]

**"මේ දවස දිව්‍යමය මහිමයේ හස්තය සියලුම විශිෂ්ඨත්වයන් ඉවත්කර ඇත. දෙවියන්වහන්සේගේ සේවකයින් හා උන්වහන්සේගේ සේවිකාවන් එකම තලයක සිටින සේ සලකා ඇත."**[36]

## 11 වන කොටස

අධ්‍යයනය කිරීමට ඔබෙන් ඉල්ලා සිටින අවසාන ප්‍රකාශය විශ්ව අධ්‍යාපනය පිළිබඳ විෂය වේ:

අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම අපේ කාලයේ ඉතාමත් කාලීන අවශ්‍යතාවයකි. අධ්‍යාපනය තම කේන්ද්‍රීය අවශ්‍යතාවයක් බවට පත් නොකළහොත් කිසිම ජාතියකට සමෘද්ධිය අත්කර ගත නොහැක. මිනිසුන්ගේ පරිහානියට මූලිකම හේතුව දැනුමට ප්‍රවේශය නොමැතිකමයි.

අධ්‍යාපනය ආරම්භ කළ යුත්තේ ළදරු වියේදීමය. අධ්‍යාත්මික සහ සදචාරාත්මක නීතිවලට අනුව ඔවුන්ගේ චරිත ශෝධනය කිරීමට සහ ඔවුන් කලා හා විද්‍යාවන්හි පුහුණුව ලබා ඇති බව සහතික කිරීමට, තම දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට උපරිමයෙන් කැපවීම පියෙකුගේ සහ මවකගේ යුතුකමකි. මව්වරුන් මානව වර්ගයාගේ පළමු අධ්‍යාපනඥයින් ය; ඔවුහු තම දරුවන්ට දැනුම නමැති පියයුරෙන් කිරි දෙති. සෑම දරුවෙකුටම අධ්‍යාපනය ලැබිය යුතුය; මෙය නොසලකා හැරිය හැකි කාරණයක් නොවේ. අවශ්‍ය වියදම් පියවා ගැනීමට දෙමාපියන්ට හැකි නම්, ඔවුන් එය කළ යුතුය. නොඑසේ නම් දරුවාගේ අධ්‍යාපනය සඳහා ප්‍රජාව විසින් මාර්ග සැපයිය යුතුය.

සෑම මිනිසෙක් තුළම විශිෂ්ටත්වය ළඟා කර ගැනීමේ ආශාව අධ්‍යාපනයෙන් වර්ධනය විය යුතුය. අප මානව පරිපූර්ණත්වයට ඇලුම් කළ යුතු අතර ආශාවෙන් එය ලුහුබැඳ යා යුතුය. මනුෂ්‍ය ලෝකයේ ගුණාංග - අවංකභාවය, පක්ෂපාතිත්වය, මනුෂ්‍යත්වයට සේවය කිරීම, ආදරය සහ යුක්තිය සඳහා ප්‍රසිද්ධ වීමට, අප ආධ්‍යාත්මික විශිෂ්ටතාවයක් අපේක්ෂා කළ යුතුයි. සාමය සහ එකමුතුකම ප්‍රවර්ධනය කිරීම සහ ඉගෙනීම පෝෂණය කිරීම සඳහා අප ගන්නා උත්සාහයන් මගින් අප කැපී පෙනෙන්න උත්සාහ කළ යුතුයි. එවැනි මාවතකට මිනිසුන් යොමු කිරීම අධ්‍යාපනයේ සැබෑ කාර්යයයි.

1. ඔබේ කණ්ඩායමේ මෙම ප්‍රකාශය අධ්‍යයනය කිරීමෙන් පසු, අධ්‍යාපනය සම්බන්ධයෙන් ඔබේ මිතුරන්ට ඇති ගැටළු කිහිපයක් හඳුනා ගැනීමට උත්සාහ කරන්න. ඉහත අදහස් ඔවුන්ගේ ගැටළු විසඳන්නේ කෙසේද?

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

2. බහා'උ'ල්ලා තුමාගේ ලේඛනවලින් පහත උපුටා දැක්වීම් එකක් හෝ කිහිපයක් කටපාඩම් කරන ලෙස යෝජනා කෙරේ:

**"යම් කිසි පුද්ගලයෙකුට දැනීමක් හෝ දක්ෂතාවයන් නැතිව අත්හැර දැමීම යෝග්‍ය නැත. එවිට ඔහු වඳ ගසක් වැනි වන බැවිනි."**[37]

**"මිහිමත වෙසෙන මනුෂ්‍යවර්ගයාගේ අධ්‍යාපනය කෙරෙහි ඔබගේ මනස සහ කැමැත්ත යොමු කරන්න......"**[38]

**"කලා, කර්මාන්ත හා විද්‍යාවන් ජීව ලෝකය උසස් තත්වයකට පත් කරන අතර එහි උත්කර්ෂවත් භාවයට හිතකරය. දැනීම මිනිසෙකුගේ ජීවිතයට පියාපත් වැනිවාක් මෙන්ම ඔහුගේ ආරෝහණය සඳහා ඉණිමගක් බඳුය."**[39]

"ඇත්ත වශයෙන්ම දැනීම මනුෂ්‍යාට වටිනා වස්තුවකි. කීර්තියේත්, පරිත්‍යාගයෙත්, ප්‍රීතියේත්, උත්කර්ෂවත් භාවයේත්, උද්යෝගයේත්, සන්තෝෂයේත් ප්‍රභවයකි."[40]

## 12 වන කොටස

සාමය හැමෝගෙම හිතේ තියෙන ප්‍රශ්නයක්. එහි ස්ථාපිත කිරීම වඩාත් හදිසි හා වැදගත් වේ. දැන් ඔබ කලින් ප්‍රකාශවල දක්වා ඇති මූලධර්ම ගැන තරමක් සිතා බලා ඇති නිසා, විශ්ව සාමය පිළිබඳ ප්‍රශ්නය ගැන මෙනෙහි කිරීම ප්‍රයෝජනවත් බව ඔබට පෙනී යනු ඇත.

යුද්ධය තුරන් කිරීම සඳහා ප්‍රායෝගික පියවර ගැනීම සඳහා බොහෝ දේ රඳා පවතින්නේ ඇත්ත වශයෙන්ම ආණ්ඩු මත ය. ජාතීන් අතර ජාත්‍යන්තර සහයෝගීතාවයේ විවිධ ආකාර මෙන්ම සාමය ලුහුබැඳීම සඳහා ආරවුල් විසඳීමට සහ ආයුධ අඩු කිරීමට දේශපාලන ගිවිසුම් අත්‍යවශ්‍ය වේ. එහෙත්, එවැනි ක්‍රියාමාර්ග කෙතරම් වැදගත් වුවත්, කලින් සාකච්ඡා කළ මූලධර්ම ලොව පුරා ස්ථාපිත නොකළහොත් ඒවා කල් පවතින සාමයකට මඟ පාදන්නේ නැත. මිනිසුන් යථාර්ථය විමර්ශනය කිරීමට ඉගෙන ගෙන සත්‍යය එකක් බව අවබෝධ කර නොගන්නේ නම්, පැරණි එදිරිවාදිකම් දිගටම පවතිනු ඇත්දැයි අප අපෙන්ම අසාගත යුතුද? අප සැමටම තිබෙන්නේ එකම සම්භවයක්ය. දෙවියන්වහන්සේ අප සියල්ලන්ම ගැන සෝදිසියෙන් සිටින අතර උන්වහන්සේගේ ප්‍රකාශවීම් තුළින් අප සියල්ලන්ම පුහුණු කරයි. උන්වහන්සේලාගේ ඉගැන්වීම් රඳා පවතින්නේ ආදරය සහ මිත්‍රත්වයේ එකම පදනම මතය. ආගම්හී ඒකීයභාවය පිළිගත් විට පමණක් ආගමික ආරවුල් නතර වී ආගමේ ආලෝකය සාමයේ මාවත ආලෝකවත් කරයි. අපි තවදුරටත් විමසිය යුත්තේ, නොදැනුවත්කමේ වලාකුළු දුරු කර, සාමයට ප්‍රබල බාධකයක් වන, සෑම ආකාරයකම අගතියේ අසත්‍යය ප්‍රදර්ශනය කිරීමට, විද්‍යාව සහ ආගම සමගියෙන් ක්‍රියා කිරීම අවශ්‍ය නොවේද? යන්නයි, ඇසීමට තවත් ප්‍රශ්නයක් නම්, ලෝකයේ සෑම අස්සක් මුල්ලක් නෑරම ධනවතුන් හා දුප්පතුන් අතර පවතින අසීමිත විෂමතාවයට විසඳුම් ලබා නොදෙන්නේ නම්, සාමකාමී ලෝකයක් ගොඩනැගිය හැකිද? යන්නයි. තවද, කාන්තාවන්ට පිරිමින් හා සමානව මානව ප්‍රයත්නයේ සෑම ක්ෂේත්‍රයකම ගමන් කිරීමට ඉඩ දෙන තුරු ඉතිහාසයේ බොහෝමයක් සංලක්ෂිත ප්‍රචණ්ඩත්වය සාමයට සහ සැබෑ සමෘද්ධියට මග පාදන්නේ නැත. නැගී එන පරම්පරාවන් එවැනි මූලධර්මවලට අනුව විශ්වීය වශයෙන් අධ්‍යාපනය ලැබිය යුතුය, එසේ නොවුවහොත් සාමය සඳහා ඇති සෑම බලාපොරොත්තුවක්ම සුන් වනු ඇත. ඔබට මනුෂ්‍ය වර්ගයාගේ අනාගතය ගැන සැලකිලිමත් වන අන් අය සමඟ බෙදා ගැනීමට හැකි වන පරිදි බහා'උ'ල්ලා තුමාගේ පහත වචන කටපාඩම් කිරීමට ඔබට අවශ්‍ය විය හැකියඃ

"ඒකීයභාවය ස්ථිරව පිහිටුවාලනතුරු මනුෂ්‍යාවර්ගයාගේ ශුභ සිද්ධියත්, එහි සාමය සහ සුරක්ෂිතභාවයත් සාක්ෂාත් කරගත නොහැක."[41]

## REFERENCES


1. *Gleanings from the Writings of Bahá'u'lláh* (Wilmette: Bahá'í Publishing Trust, 1983, 2017 printing), CIX, par. 2, p. 243.

2. Ibid., CXXXII, par. 1, p. 325.

3. Ibid., XXXIV, par. 5, p. 89.

4. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas* (Wilmette: Bahá'í Publishing Trust, 1988, 2005 printing), no. 11.1, p. 161.

5. Bahá'u'lláh, *The Kitáb-i-Íqán: The Book of Certitude* (Wilmette: Bahá'í Publishing Trust, 2003, 2018 printing), par. 151, p. 131.

6. *Gleanings from the Writings of Bahá'u'lláh*, XXVIII, par. 2, p. 77.

7. Ibid., XXIV, par. 1, p. 66.

8. Ibid., CXI, par. 1, p. 246.

9. Ibid., XLIII, par. 6, p. 106.

10. Ibid., CX, par. 1, p. 244.

11. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas*, no. 15.4, p. 220.

12. *Gleanings from the Writings of Bahá'u'lláh*, XCV, par. 1, pp. 219–20.

13. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas*, no. 9.13, p. 141.

14. Ibid., no. 5.13, p. 51.

15. *Gleanings from the Writings of Bahá'u'lláh*, CXII, par. 1, pp. 247–48.

16. Ibid., CXXXII, par. 3, p. 326.

17. Ibid., CXI, par. 1, p. 246.

18. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas*, no. 7.20, p. 90.

19. Ibid., no. 6.25, pp. 66–67.

20. Bahá'u'lláh, cited by Shoghi Eff *The Advent of Divine Justice* (Wilmette: Bahá'í Publishing Trust, 2006, 2018 printing), par. 42, p. 41.

21. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas*, no. 3.23, p. 27.

22. Bahá'u'lláh, *The Hidden Words* (Wilmette: Bahá'í Publishing Trust, 2003, 2012 printing), Persian no. 80, p. 51.

23. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas*, no. 6.19, p. 64.

24. Ibid., no. 6.37, p. 71.

25. Bahá'u'lláh, in *Ḥuqúqu'lláh—The Right of God: A Compilation of Extracts from the Writings of Bahá'u'lláh and 'Abdu'l-Bahá and from Letters Written by and on Behalf of Shoghi Eff ndi and the Universal House of Justice*, compiled by the Research Department of the Universal House of Justice (Wilmette: Bahá'í Publishing Trust, 2007), no. 16, p. 16.

26. *Gleanings from the Writings of Bahá'u'lláh*, CXVIII, par. 2, p. 283.

27. Ibid., CXVII, par. 1, p. 282.

28. Bahá'u'lláh, cited by Shoghi Effendi, *The Promised Day Is Come* (Wilmette: Bahá'í Publishing Trust, 1996, 2018 printing), par. 279, p. 187.

29. *Gleanings from the Writings of Bahá'u'lláh*, CXVII, par. 1, p. 282.

30. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas*, no. 4.11, p. 36.

31. Ibid., no. 6.3, p. 57.

32. Ibid., no. 6.3, p. 58.

33. *The Hidden Words*, Persian no. 5, pp. 23–24.

34. Bahá'u'lláh, in *Women: Extracts from the Writings of Bahá'u'lláh, 'Abdu'l-Bahá, Shoghi Eff and the Universal House of Justice*, compiled by the Research Department of the Universal House of Justice (Wilmette: Bahá'í Publishing Trust, 1986, 1997 printing), no. 54, p. 26.

35. *The Hidden Words*, Arabic no. 68, p. 20.

36. Bahá'u'lláh, in the compilation *Women*, no. 3, p. 3.

37. Bahá'u'lláh, in *Excellence in All Things: A Compilation of Extracts from the Bahá'í Writings*, compiled by the Research Department of the Universal House of Justice (London: Bahá'í Publishing Trust, 1981, 1989 printing), no. 5, p. 2.

38. *Gleanings from the Writings of Bahá'u'lláh*, CLVI, par. 1, p. 378.

39. Bahá'u'lláh, *Epistle to the Son of the Wolf* (Wilmette: Bahá'í Publishing Trust, 1988, 2016 printing), p. 26.

40. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas*, no. 5.13, p. 52.

41. *Gleanings from the Writings of Bahá'u'lláh*, CXXXI, par. 2, p. 324.



# දැනුම ගැඹුරු කිරීමේ තේමාවන්

## අරමුණ

ආධ්‍යාත්මික වැදගත්කම ඇති තේමා ගැන කතා කිරීමට
මිතුරන් සහ අසල්වැසියන් හමුවීමේ පුරුද්ද වර්ධනය කිරීම

**1 වන කොටස**

මෙම තුන්වන ඒකකය, පෙර එක මෙන්, අර්ථවත් සහ උද්ගාමක වූ සංවාදයකට පිවිසීමට අපට හැකි වන හැකියාවන් ගැන සැලකිලිමත් වේ. දෙවන ඒකකයේ අපගේ අවධානය යොමු වූයේ අධ්‍යාත්මික මූලධර්ම වෙත යොමු කරමින් සංවාදයේ මට්ටම ඉහළ නැංවීමට ඉදිරිපත් වන බොහෝ අවස්ථාවන් කෙරෙහිය. මෙහිදී අවධානය යොමු වන්නේ ප්‍රජාවගේ ජීවිතයට කේන්ද්‍රගත තේමා එකට ගවේෂණය කිරීම සඳහා අප මිතුරන්ගේ සහ අසල්වාසීන්ගේ නිවෙස්වලට කරන සංචාරයන් වෙතය.

ලොව පුරා ගම්වල සහ අසල්වැසි ප්‍රදේශවල මිතුරන් කණ්ඩායම් නිරන්තර අධ්‍යාත්මික රැස්වීම්, දරුවන්ගේ අධ්‍යාත්මික අධ්‍යාපනය සඳහා වූ පන්ති, නව යෞවනයන්ගේ රැස්වීම්, අධ්‍යයන කව සහ තරුණ කඳවුරු සහ විවිධ ආකාරයේ ක්‍රියා මාලාවන් ඇතුළත් අන්තර් සම්බන්ධිත ක්‍රියාකාරකම් සමූහයක දැඩි ලෙස නියැලී සිටිති. මෙම ක්‍රියාකාරකම් රටාව ප්‍රදේශයක් තුළ මුල් බැස ගන්නා විට සහ වැඩිවන සංඛ්‍යාවක් සේවා ක්‍රියාවන් සඳහා කැප වන විට, මිතුරන්ගේ න්‍යෂ්ටිය ප්‍රමාණයෙන් හා ශක්තියෙන් වර්ධනය වේ. ගමෙහි හෝ අසල්වැසි ප්‍රදේශයේ වැඩි වැඩියෙන් නිවෙස් සංචාරයන් හී ක්‍රමානුකූල වැඩසටහනක් දැන් වේගවත් වෙමින් පවතින ප්‍රජා ගොඩනැගීමේ ක්‍රියාවලියේ වැදගත් අංගයකි. එවැනි සංචාරයන්හිදී විවිධ තේමාවන් කෙරෙහි අවධානය යොමු කෙරේ. නිදසුනක් වශයෙන්, බහායි ළමා පන්තියක ගුරුවරයා, අධ්‍යාපනයට අදළ මාතෘකා සාකච්ඡා කිරීමට ළමයින්ගේ දෙමාපියන් නිතර කැඳවිය යුතුය. සජීවිකාරකයින් සහ උපදේශකයින් ලෙස සේවය කරන අය විසින් නව යෞවනයන් හා තරුණයින්ගේ නිවෙස්වලට ගොස් මනුෂ්‍ය ජීවිතය තුළ මෙම පොරොන්දු වූ වසර හා සම්බන්ධ අභියෝග සහ අවස්ථාවන් සම්බන්ධ විෂයයන් පිළිබඳව සාකච්ඡා කිරීම අවශ්‍ය වේ. ධර්මය පිළිබඳ ඔවුන්ගේ දැනුම ගැඹුරු කරන තේමා මත නිවසක සාමාජිකයන් සමඟ පවත්වන සංවාදයන් ඒ හා සමානව අත්‍යවශ්‍ය බව ඔප්පු වී තිබේ. සමස්තයක් වශයෙන් ගත් කල, සමාජය තුළ මතුවෙමින් පවතින මිත්‍රත්වයේ සංස්කෘතියට එවැනි සංචාර වල බලපෑම අධිතක්සේරු කළ නොහැක.

**2 වන කොටස**

මෙම ඒකකයේ අරමුණ සඳහා, අපි ඉහත විස්තර කර ඇති ක්‍රියාවලිය ඉදිරියට යන මනඃකල්පිත අසල්වැසි ප්‍රදේශයක් දෙස බලනු ඇති අතර, නිවෙස් සංචාරයකදී දිග හැරිය හැකි ආකාරයේ සංවාදයන් පරීක්ෂා කිරීමේ සන්දර්භයක් ලෙස අපි එය භාවිතා කරමු.

අලෙහන්ද්‍රා විශ්වවිද්‍යාලයේ තුන්වන වසරේ ඉගෙනුම ලබන තරුණියකි. ඇය සහ ඇගේ එක් සහෝදරයෙක්, ශිෂ්‍යයෙක්, ඔවුන්ගේ දෙමව්පියන් සමඟ අප සිතන අසල්වැසි ප්‍රදේශයේ, ඔවුන් ඉපදී හැදී වැඩුණු නිවසේ ජීවත් වේ. ඔවුන් හතර දෙනා සහ මෑතකදී අසල්වැසි ප්‍රදේශයට පදිංචියට පැමිණි තරුණ යුවළක් සෑම සතියකම යාච්ඤා කිරීමට සහ 8,000ක පමණ ජනගහනයක් තුළ ඔවුන් වටා පිහිටුවා ඇති ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ගැන උපදේශනයට රැස් වෙති. තවත් තිදෙනෙක්: මාස හයකට පෙර ආරම්භ වූ ළමා පන්තියක ගුරුවරියක් සහ ඔවුන් කුඩා කාලයේ ඔවුන්ගේ කණ්ඩායමේ සජීවිකාරකයා වූ සහ තම දෙමාපියන් බැලීමට නිතර පැමිණෙන අලෙහන්ද්‍රාගේ වැඩිමහල් සොහොයුරෙකුගේ සහය ඇතිව නව යෞවන කණ්ඩායමක ප්‍රයත්නයන් මෙහෙයවන දහත් හැවිරිදි තරුණයින් දෙදෙනෙක්, මෙම සතිපතා රැස්වීම්වලට වරින් වර සහභාගී වන අතර ඔවුන්ගේම සේවා ක්‍රියාවන් ගැන පමණක් නොව සමස්ත ප්‍රජාව ගොඩනැගීමේ ක්‍රියාවලිය ගැනද ක්‍රමානුකූලව සිතීමට පටන් ගනී.

අප විමසා බලන පළමු සංවාද කට්ටලය වන්නේ අසල්වැසි ප්‍රදේශයේ ප්‍රසිද්ධ හා ගෞරවනීය පවුලක් වන සැන්චේස්වරුන් සහ අලෙහන්ද්‍රා අතරය. ස්වාමිපුරුෂයා සහ භාර්යාව වයස අවුරුදු හැටක පසුවන අතර, ඔවුන්ගේ පුතුන් හා දූවරුන් ඇති දැඩි කර, දැන් ඔවුන් තනිවම ජීවත් වන්නේ අලෙහන්ද්‍රාගේ නිවසින් කොටස් කිහිපයක් ඈතිනි. සැන්චේස් මහතාට සහ මහත්මියට සාක්ෂරතාව ඇති නමුත් විධිමත් අධ්‍යාපනයක් ලබා නැත. ඔවුන් භුක්ති විඳින පුලුල්ව පැතිරුනු ගෞරවයට හේතුව වන්නේ ඔවුන් පරිත්‍යාගශීලී ජීවිතයක සහ පවිත්‍ර ක්‍රියාවන් හී අත්දැකීම් තුළින් ලබා ගත් ප්‍රඥාව නිසාය.

ඔවුන් කලක සිට බහායි ඉගැන්වීම් ගැන දැනුවත්ව සිට ඇත, නමුත් ඔවුන් ඉතා උනන්දුවෙන් විමර්ශනය කිරීමට තීරණය කර ඇත්තේ මෑතකදීය. සතියකට පෙර, ඔවුන් ප්‍රජාවට සම්බන්ධ වීමට ඇති ආශාව පිළිබඳව අලෙහන්ද්‍රාගේ දෙමාපියන්ට දන්වා සිටියහ. ඔවුන් පිළිගැනීම සඳහා රැස්වීමක් දැනටමත් සැලසුම් කර ඇති අතර, ඊට අමතරව, ධර්මය පිළිබඳ ඔවුන්ගේ දැනුම ගැඹුරු කිරීමට උපකාරී වන තේමා මාලාවක් ඔවුන් සමඟ බෙදා ගැනීමට අලෙහන්ද්‍රා සති කිහිපයක් නිතිපතා ඔවුන් වෙත සංචාරය කරන බවටද එකඟ වී ඇත. සංචාරයන් පිළිබඳ වූ කථාව අනුගමනය කිරීමෙන්, ඔබට මෙම තේමාවන් ගවේෂණය කිරීමටත්, ඒ සමඟම එවැනි අවස්ථාවලදී සංවාදයේ ඇති ගතිකත්වය පිළිබිඹු කිරීමටත් හැකි වනු ඇත.

## 3 වන කොටස

අලෙහන්ද්‍රා සැන්චෙස් මහතා සහ එම මහත්මිය සමඟ ඇයගේ පළමු සංවාදය දෙවියන් වහන්සේගේ සදාකාලික ගිවිසුම යන තේමාව පිළිබඳ කෙටි පැහැදිලි කිරීම පදනම් කර ගැනීමට සැලසුම් කරයි.

සියළුම දේවල නිර්මාතෘවරයාණන් ඒකීයවූත්, අනුපමවූත්, ස්වයංජීවිවූත් දෙවියන්වහන්සේය. සීමිත දෙයට අසීමිත දෙය අවබෝධ කර ගත නොහැකි බැවින්, මිනිස් මනසට දෙවියන්වහන්සේගේ සාරය අවබෝධ කරගත නොහැකි බැව් බහා'උ'ල්ලා තුමා අපට උගන්වා තිබේ. මිනිසුන් උන්වහන්සේ ගැන කරන නිරූපණයන් ඔවුන්ගේම පරිකල්පනයේ ඵලයන් පමණි. දෙවියන්වහන්සේ මිනිසෙකු නොවන අතර ඔහු විශ්වය පුරා පැතිරී ඇති හුදු බලයක්ද නොවන්නේය. අපගේ පැවැත්මේ ප්‍රභවය හැඳින්වීම සඳහා අපට පාවිච්චි කිරීමට සිදුවී ඇති දෙව් පියාණන්, ස්වර්ගීය බලය, ශ්‍රේෂ්ඨම ආත්මභාවය වැනි වචන එකිනෙකින් විස්තරවන්නේ මිනිස් දිවෙන් කළහැකි උන්වහන්සේගේ නම් සහ ලක්ෂණ වන අතර ඒවා උන්වහන්සේව විස්තර කිරීමට කොහෙත්ම ප්‍රමාණවත් නොවේ.

ගුහ්‍ය වචනවල අප මෙසේ කියවමු:

**"එම්බා මනුෂ්‍ය පුත්‍රය! ඔබ මැවීම මම ප්‍රිය කෙළෙමි. ඒ නිසා මම ඔබ මැවීමි එහෙයින් ඔබගේ නාමය නම්කර ඔබගේ ආත්මය ජීව ප්‍රාණයෙන් පිරවිය හැකි වන පරිදි ඔබ මට ප්‍රේම කරන්න."**[1]

මෙම ඡේදයේ, බහා'උ'ල්ලා තුමා අපට පවසන්නේ දෙවියන්වහන්සේ අප කෙරෙහි දක්වන ප්‍රේමය අපගේ පැවැත්මට හේතුව බවයි. අපව ආරක්ෂා කරන, අපව පොෂණය කරන සහ ජීවාත්මයෙන් අපව පුරවන මෙම ප්‍රේමය ගැන අප සැමවිටම සිහිකල්පනාවෙන් සිටිය යුතුය. දුෂ්කරතා හෝ සුවපහසුව, දුක හෝ ප්‍රීතිය ඇති අවස්ථාවලදී, උන්වහන්සේගේ ප්‍රේමය සැමවිටම අපව වැළඳ ගන්නා බව අප මතක තබාගත යුතුය.

බහායි ඉගැන්වීම් වලින්, අප ඉගෙන ගන්නේ, උන්වහන්සේගේ ප්‍රේමයෙන් අපව නිර්මාණය කර, දෙවියන්වහන්සේ අප සමඟ ගිවිසුමකට එළඹ ඇති බවයි. "ගිවිසුම" යන වචනයේ තේරුම පුද්ගලයන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් අතර වූ ප්‍රතිඥාවක් හෝ පොරොන්දුවක්ය. සදාකාලික ගිවිසුමට අනුව, සර්ව ත්‍යාගශීලී නිර්මාතෘවරයා කිසි දෙනෙක අප අත් නොහරින අතර කලින් කලට උන්වහන්සේගේ ප්‍රකාශවීමක් මගින් උන්වහන්සේගේ කැමැත්ත සහ අරමුණ අපට දැනගැනීමට සලස්වන සේක.

"ප්‍රකාශට පත්කරනවා", යන ක්‍රියාවෙහි තේරුම අනාවරණය කරනවා යනුයි, එනම් ඊට කලින් දැන නොතිබූ දෙයක් පෙන්වා දීමයි. දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම් වනාහි අපට දේව වචනය අනාවරණය කරන ඒ විශේෂ ආත්මභාවයන් වෙති. උන්වහන්සේලා දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව ජීවත් වන අන්දමත්, සත්‍ය ප්‍රීතිය ලබාගන්නා අන්දමත් අපට උගන්වන විශ්ව

අධ්‍යාපනඥයින් වෙති. මේ දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම් අතර ආබ්‍රහම් තුමා, ක්‍රිෂ්ණ තුමා, මෝසෙස් තුමා, සොරොවැස්ටර් තුමා, බුදුන් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ, මුහම්මද් තුමා සහ, ඇත්ත වශයෙන්ම, මානව ඉතිහාසයේ මෙම යුගය සඳහා දෙවියන්වහන්සේගේ නිවුන් ප්‍රකාශයන් වන බාබ් තුමා සහ බහා'උ'ල්ලා තුමාද වෙති.

මේ අනුව, දෙවියන්වහන්සේගේ සදාකාලික ගිවිසුම තුළ, උන්වහන්සේගේ කොටස සැමවිටම ඉටු කර ඇත, අප සැවොම අපගෙන්ම ඇසිය යුතු මූලික ප්‍රශ්නයක් නම්, "මම මගේ ගිවිසුමේ කොටස ඉටු කරන්නේ කෙසේද?" යන්නයි. සියලුම ආගමික ග්‍රන්ථවල අපට සොයාගත හැකි පිළිතුර වන්නේ: දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම් හඳුනාගෙන උන්වහන්සේලාගේ ඉගැන්වීම්වලට කීකරු වීමෙන්ය. මෙම ප්‍රතිචාරය අපගේ ජීවිතයේ අරමුණම පෙන්වා දෙයි, එනම් දෙවියන්වහන්සේ දැන හඳුනාගෙන නමස්කාර කිරීම වේ. කෙටි අනිවාර්ය යාච්ඤාවේදී අප මෙසේ ප්‍රකාශ කරමු.

**"මාගේ දෙවියනි, ඔබ දැන හැඳින ගනු සඳහාත්, ඔබවහන්සේට වඳිනු පුදනු සඳහාත් මා මැවූ වගට මම සාක්ෂි වෙමි. මාගේ දුබල බවට හා ඔබවහන්සේගේ ශක්තියටත් මාගේ නිර්ධන භාවයට හා ඔබවහන්සේගේ වස්තු සම්භාරයටත් මම මේ අවස්ථාවේදී සාක්ෂි වෙමි.**

**"ආපදාවෙහිදී පිහිට වන්නාවූත් ස්වයංභූ වූත් ඔබවහන්සේ හැර අන් දෙවිකෙනෙක් නැත."[2]**

දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම් තුළින් මිස අපට දෙවියන්වහන්සේව දැනගැනීමට නොහැකි බැවින්, අපගේ ජීවිතයේ අරමුණ සාක්ෂාත් කර ගත හැකි එකම ක්‍රමය උන්වහන්සේලා හඳුනාගෙන උන්වහන්සේලාගේ ඉගැන්වීම් පිළිපැදීමයි. මෙලොව සාමය සහ යුක්තිය ස්ථාපිත කරන බවට සියලු ශුද්ධ වූ ග්‍රන්ථවල ඇති ප්‍රතිඥාව ඉටුවෙමින් පවතින කාලයක ජීවත්වීමේ ත්‍යාගය ලැබීම ගැන කෘතඥතාවයෙන් අද අපගේ හදවත් උතුරා යයි. බහා'උ'ල්ලා තුමා මෙසේ ප්‍රකාශ කරයි:

**"දෙවියන්වහන්සේගේ ඉතා අනර්ඝ ත්‍යාගයන් මනුෂ්‍යවර්ගයා වෙත ගලා ඒමට සැලැස්වූ දිනය අදයි. සකල නිර්මාපිත දේවලට උන්වහන්සෙගේ ඉතා ප්‍රබල කරුණාව කාවැද්දූ දිනය අදයි. ඔවුන්ගේ වෙනස්කම් අමතක කරදමා, සම්පූර්ණ ඒකීයභාවයෙන් හා සමගියෙන් යුතුව උන්වහන්සේගේ ආරක්ෂාව හා ආදර කරුණාව නමැති ගසෙහි සෙවනැල්ල යට සකල මනුෂ්‍ය වර්ගයාම විසිය යුතුය."[3]**

අප අපගේ කතාව දිගටම කරගෙන යාමට පෙර, ඔබ ඉහත පැහැදිලි කිරීම කියවා ඔබේ කණ්ඩායමේ අනෙකුත් සහභාගිවන්නන් සමඟ ඡේදයෙන් ඡේදයෙන් එය මෙනෙහි කළ යුතුය. ඔබ එකිනෙකාට ස්වභාවිකව සහ පහසුවෙන් අදහස් ප්‍රකාශ කිරීමට හැකි වන තෙක් ඔබට එකිනෙකාගෙන් ප්‍රශ්න ඇසීමට සහ එකට පිළිතුරු දිය හැකිය. උපුටා දැක්වීම් හොඳින් ඉගෙන ගැනීම විශේෂයෙන් වැදගත් වේ, මේ ආකාරයේ සාකච්ඡාවලදී ලේඛනවල කොටස් බෙදගැනීම අත්හළ නොහැකි කරුණකි. මෙම කොටසේ ඉදිරිපත් කර ඇති අදහස් සහ උපුටා දක්වා ඇති ඡේදවල තේරුම ගැන සිතීමට පහත අභ්‍යාස ඔබට උපකාරී වනු ඇත:

1. දෙවියන්වහන්සේ සාරය අවබෝධ කරගත නොහැකි බව ඔබ කෙනෙකුට පැහැදිලි කරන්නේ කෙසේද? ඉහත සඳහන් පළමු ඡේදය මේ සම්බන්ධයෙන් ඔබට උපකාර විය යුතුය.

    ............................................................................................................................................
    ............................................................................................................................................
    ............................................................................................................................................
    ............................................................................................................................................

2. දෙවියන්වහන්සේ අපව නිර්මාණය කලේ ඇයි?...............................................................................

.......................................................................................................................................................

3. "ගිවිසුම" යන වචනයේ තේරුම කුමක්ද?...........................................................................................

.......................................................................................................................................................

4. මනුෂ්‍යාවර්ගයා සමඟ ඇති සදාකාලික ගිවිසුමේ දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇත්තේ කුමක්ද? ..........................................................................................................................................

.......................................................................................................................................................

5. අපගේ ජීවිතයේ අරමුණ කුමක්ද?.....................................................................................................

.......................................................................................................................................................

6. අපට කිසිද දෙවියන්වහන්සේගේ සාරය දැනගත නොහැකි නම්, අපගේ ජීවිතයේ අරමුණ දෙවියන්වහන්සේව දැනගැනීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?..............................................

.......................................................................................................................................................

7. "ප්‍රකාශවීම" යන වචනයේ තේරුම කුමක්ද?.......................................................................................

.......................................................................................................................................................

8. දෙවියන්වහන්සේගේ ප්‍රකාවීම් කිහිපයක් නම් කරන්නඃ .......................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

9. ගිවිසුමේ අපගේ කොටස ඉටු කිරීමට නම් අපෙන් අවශ්‍ය වන්නේ කුමක්ද? ..............................

.......................................................................................................................................................

10. පහත වාක්‍ය සම්පූර්ණ කරන්නඃ

අ. මේ දවසේදී, දෙවියන්වහන්සේගේ .................................................. මනුෂ්‍යවර්ගයා වෙත ගලා ඒමට සැලැස්වූ දිනය අදය.

ආ. මේ දවසේදී, දෙවියන්වහන්සේගේ සකල නිර්මාපීත දේවලට ...................................... ...........................................................කාවැද්දූ දිනය අදය.

ඇ. මේ දවසේදී, අපගේ වෙනස්කම් ......................................, සම්පූර්ණ ඒකීයභාවයෙන් හා සමගියෙන් යුතුව ..................................................................................................

.......................................................................................................................................................

11. බහා'උ'ල්ලා තුමා ලෝකවාසීන්ගෙන් කුමක් කරන ලෙස ඉල්ලා සිටින්නේද?..............................

.......................................................................................................................................

.......................................................................................................................................

**4 වන කොටස**

සැන්චෙස් මහතා සහ එම මහත්මිය සමඟ බෙද ගැනීමට අලෙහන්ද්‍රා සැලසුම් කරන ලද තේමාවේ අන්තර්ගතය ඇගේ සිතේ තිබූ එකම දෙය නොවේ. මෙම යුවළ සමඟ ශක්තිමත් මිත්‍රත්වයක් ගොඩනඟා ගැනීමට ඇය බලාපොරොත්තු වන්නේය. පළමු අත්දැකීමෙන්, අගතියේ සහ තමාගේ ලොකුකම් දක්වන ආකල්පයේ අනර්ථකාමී බලපෑම් ඇය දනී. මේවා ඇය ස්වභාවිකවම මග හරිනු ඇත; ඇගේ උසස් අධ්‍යාපනය ඇගේ නිහතමානී බව අඩු කර නැත. ඇගේ හදවතේ සැන්චෙස්ලා කෙරෙහි සැබෑ ආදරයක් හා ගෞරවයක් මිස අන් කිසිවක් නැත. ඇය පළමු තේමාව පැහැදිලි කිරීමට යන්නේ කෙසේදැයි සලකා බලන විට, සති ගණනාවක් පුරා දිග හැරෙන අඛණ්ඩ සංවාදයක ආරම්භය මෙය බව ඇය තමාටම මතක් කර ගනී. අදහස් අනුපිළිවෙල පැහැදිලි ලෙස ඉදිරිපත් කිරීම වැදගත් වුවද, යුවළගේ ප්‍රතිචාරයට සවන් දීම සඳහා ඇය යම් යම් ස්ථානවල නතර විය යුතු බව ඇය හඳුනා ගනී. "මම නොසන්සුන් නොවී සිටීමට උත්සාහ කළ යුතුයි" ඇය තමාටම කියාගනියි, "මොකද මම දිගටම කතා කරගෙන යන විට, සංවාදයක් හැඩගැසීමට අවස්ථාවක් නොලැබේ". අලෙහන්ද්‍රා මේ මාර්ග ඔස්සේ ටික වේලාවක් ඇගේ සංචාරය ගැන දිගටම සිතයි. ඔබ ඇයගේ ස්ථානයේ සිටියේ නම්, ඔබේ මනසට ඇතුළු වීමට සුදුසු සිතුවිලි ලෙස ඔබ සලකන්නේ පහත සඳහන් දේවලින් කුමක්ද?

................. ධර්මය තුල සැන්චෙස්වරුන්ට උපදෙස් දීම සහ මම ඔවුන්ට උගන්වන සෑම දෙයක්ම ඔවුන් ඉගෙන ගන්නා බවට වග බලා ගැනීම මගේ කාර්යයයි.

................. මෙම අපූරු යුවළ සමඟ ටික වේලාවක් ගත කිරීමට සහ ඔවුන් සමඟ ලේඛනවල ඡේද බෙද ගැනීමට හැකි වීම මොනතරම් භාග්‍යයක්ද?

................. මෙම සංචාරය වැදගත් බව මම දනිමි. නමුත්, මට වෙනත් දේවල් කිරීමට ඇති නිසා එය වැඩි කාලයක් ගත නොවනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

................. උපුටා දැක්වීම් ඔවුන්ට ඉතා අපහසු වනු ඇත. මම සරල අදහස් කිහිපයක් පමණක් සඳහන් කළ යුතුය. වැදගත් වන්නේ ඔවුන්ට ආදරය පෙන්වීමයි.

................. ඔවුන්ගේ වයසේදී, සැන්චෙස්වරුන්ට බොහෝ දේ ඉගෙන ගත නොහැක.

................. අපි තේමාව සාකච්ඡා කර උපුටා දැක්වීම් ගැන මෙනෙහි කරන විට ඔවුන්ගේ අන්තර් දෘශ්ඨීන් වලට ඇහුන්කන් දීමට මම බලාපොරොත්තුවෙන් සිටිමි.

................. ඔවුන්ට කියවීමේ හැකියාව ඇත. මම විෂය හඳුන්වා දී ඔවුනටම අධ්‍යයනය කරගෙන යෑම සඳහා උපුටා දැක්වීම් ඔවුන් වෙත තබා යමි.

................. අදහස් ඉදිරිපත් කරන විට, උපුටා දැක්වීම් එකට අධ්‍යයනය කර ඒවා ගැන විමසා බැලීමට මට බොහෝ විට විරාමයක් තැබීමට සිදුවේ.

................. බාධාවකින් තොරව මුළු තේමාවම ඉදිරිපත් කිරීමට මට හැකි වනු ඇතැයි මම බලාපොරොත්තු වන අතර, අවසානයේදී ප්‍රශ්න ඇතිදැයි ඔවුන්ගෙන් අසමි.

එවැනි සංචාරයක් සඳහා සූදානම් වීමේදී ඔබට ඇතිවිය යුතු හෝ නොයුතු වෙනත් හැඟීම් ගැන ඔබට සිතිය හැකිද?

## 5 වන කොටස

සැන්චෙස් නිවසට අලෙහන්ද්‍රාගේ පළමු සංචාරය හොඳින් සිදුවිය. මෙම යුවළ ඇගේ නොසන්සුන් බව දකින අතර ඔවුන්ගේ උණුසුම් සහ කරුණික භාවය සමඟින් ඇයට පහසුවක් සපයයි. ඔවුන් සාවධානව සවන් දෙන අතර උපුටා දැක්වීම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සාකච්ඡාවට සම්පූර්ණයෙන්ම සහභාගී වේ. දුෂ්කරතාවයක් ඇති වන එකම මොහොත වන්නේ අවසානයේ සැන්චෙස් මහත්මිය "බහායි ප්‍රජාවට සම්බන්ධ වීමෙන් මම ක්‍රිස්තුස් වහන්සේව අමතක කරනවාද? " යන ප්‍රශ්න අසමින් අලෙහන්ද්‍රාව පුදුමයට පත් කරන විටය. අලෙහන්ද්‍රා පිළිතුර දන්නා නමුත් එය සකස් කිරීමට ඇයට කාලය ගතවේ. සැන්චෙස් මහතා සිනාසෙමින් ඇගේ උපකාරයට පැමිණේ: "මම හිතන්නේ අපි බහායි ඉගැන්වීම් ගැන ඉගෙනගත් නිසා ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇති මගේ ආදරය ඇත්ත වශයෙන්ම වර්ධනය වී ඇත." "ලෝකයේ බොහෝ දෙනෙකුගේ මාර්ගය ඒ ආකාරයෙන් වේ" යනුවෙන් ඇගේ සිතුවිලි එකට එකතු කරගත් අලෙහන්ද්‍රා එයට එකතු කරමින් පවසයි. "දෙවියන්වහන්සේගේ ඒකීයභාවය, ආගම්වල ඒකීයභාවය සහ මනුෂ්‍ය වර්ගයාගේ ඒකීයභාවය ගැන බහා'උ'ල්ලා තුමා උගන්වන දේ නිසා මෝසෙස් තුමා, ක්‍රිස්තුස් වහන්සේ, ක්‍රිෂ්ණ තුමා, බුදුන් වහන්සේ, සොරොවැස්ටර් තුමා සහ මුහම්මද් තුමා කෙරෙහි ඔවුන්ගේ ආදරය ශක්තිමත් වේ."

අලෙහන්ද්‍රාගේ සංචාරයේ දී එය ඉතා ඵලදායි කර ගැනීම සඳහා තිබිය යුතු ගුණාංග සහ ආකල්ප කිහිපයක් ගැන සාකච්ඡා කිරීමට ඔබේ කණ්ඩායම තුළ මොහොතක් ගත කිරීම ඔබට ප්‍රයෝජනවත් වනු ඇත. ඔබ සලකා බැලිය යුතු ප්‍රධානතම දෙය නම් නිහතමානී භාවයයි. සියලු නිහතමානීකමේ පදනම වන්නේ දෙවියන්වහන්සේ ඉදිරියෙහි වූ යටහත්පහත් භාවයයි. එයින් උන්වහන්සේගේ නිර්මාණය ඉදිරියෙහි නිහතමානීකම පැනනඟිනු ඇත. යමෙක් දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ ප්‍රකාශවීම් ගැන කතා කරන විට නිහතමානිවීමට වඩා වෙන වැදගත් අවස්ථාවක් තිබේද. ඔබ බහා'උ'ල්ලාතුමාගේ පහත සඳහන් වදන් ගැන මෙනෙහි කර ඒවා කටපාඩම් කිරීමට සෑම උත්සාහයක්ම ගත යුතුය:

> **"දෙවියන්වහන්සේගේ ආදරණීයයන් වූ ඔවුන්, කොතැනදී එකට එකතු වුවද, කවුරුන් මුණ ගැසුණද, දෙවියන්වහන්සේ පිළිබඳ ආකල්පයේදී සහ උන්වහන්සේගේ ප්‍රශංසාව සහ මහිමය පිළිබඳව ස්තුති පූජා පැවැත්වීමේදී කොතරම් නිහතමානිත්වයක් හා යටහත්පහත් බවක් ප්‍රදර්ශනය කළ යුතුදයත්, ඔවුන්ගේ පාද යට ඇති දූවිලි වල සෑම අංශුවක්ම ඔවුන්ගේ භක්තියේ ගැඹුරු බව ගැන සාක්ෂි විය හැක. මේ ශුද්ධාත්ම විසින් කරනු ලබන සංවාදය කොතරම් බලයකින් යුක්ත විය යුතුද යත්, මේ දූවිලි අංශුම එහි බලපෑමෙන් පීනායනු ඇත. ඔවුන් පැවතිය යුත්තේ කවර අන්දමකටදයත් ඔවුන් පාතබා ගමන් කරණ පොළොව මෙබඳු වචන වලින් කිසි දිනක ඔවුන් නොඇමතිය යුතුයි. 'මම ඔබලාට වඩා ඉහලින් සැලකුම් ලැබිය යුත්තේ වෙමි. සාක්ෂියක් වශයෙන් ගොවියා මා මත තබන බර ඉසිලීමේදී මම කොතරම් ඉවසිලි සහගතද, සකල අනුග්‍රහයන්ගේම ප්‍රභවය වූ උන්වහන්සේ විසින් මට ප්‍රදානය කර ඇති ආශිර්වාදයන් සියළුම සතුන් වෙත නොකඩවා බෙද දෙන්නේ මා විසිනි. මා මත ප්‍රදානය කර ඇති ගෞරවයත්, මා තුල සැඟවී ඇති අසීමිත වස්තුවත් - සකල නිර්මාණයේම අවශ්‍යතාවයන් සපුරාලන වස්තුවත් - ගැන නොසලකා මා දක්වන නිහතමානී බව බලන්න. මිනිසුන්ගේ පාදවලින් මා මැඩගෙන යනවිට මා කොපමණ යටහත්පහත් අන්දමින් ඊට ඉඩ දෙන්නේදැයි සලකා බලන්න.....'"[4]**

ඉහත සඳහන් කළ පරිදි, අපගේ සෙසු මනුෂ්‍යයන් ඉදිරියෙහි නිහතමානීකම පැනනඟිනු ලබන්නේ දෙවියන්වහන්සේ ඉදිරියෙහි ඇති යටහත්පහත් කමෙනි. ඇතැම් තේමාවන් පිළිබඳ අපගේ අවබෝධය ගැඹුරු කිරීමට මිතුරෙකුගේ හෝ අසල්වැසියෙකුගේ නිවසකට යන විට අපගේ යාච්ඤා පූර්වක ආකල්පය උපකල්පනය කරන්නේ එම නිහතමානිකමෙනි. සංවාදය අතරතුර, අපි අපගේ

සිතුවිලි නිතරම දෙවියන්වහන්සේ දෙසට හරවා, අපගේ සහ පැමිණ සිටින සෑම කෙනෙකුගේම මනස් සහ හදවත් ආලෝකමත් කර දෙන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටිමු. මෙම අරමුණ මනසේ තබාගෙන අපට කටපාඩම් කළ හැකි බොහෝ වාක්‍ය ඛණ්ඩ සහ වාක්‍ය යාඥාවන් හී ඇත. මේවා ඉන් කිහිපයක් පමණි:

**"අපගේ හදවත් ආලෝකමත් කර අපට පැහැදිලිව දැකිය හැකි ඇස් හා සාවධාන කන් ලබාදෙන්න."[5]**

**"ස්වාමිනි ! ඔබවහන්සේගේ අසීමිත දීමනාවන් ප්‍රදානයකර, ඔබවහන්සේගේ මාර්ගෝපදේශකත්වයේ ආලෝකය බැබලීමට සලස්වන්න."[6]**

**"සත්‍ය අවබෝධයේ දෙරටුව විවෘත කර. ධර්මයේ ආලෝකය දීප්තිමත්ව බැබලීමට සලස්වන්න."[7]**

**"ස්වාමීනි! ඔබවහන්සේගේ ආලෝකය අපට පෙනෙනු පිණිස අපගේ දෑස් ආලෝකමත් කරන්න."[8]**

**"මම සම්පූර්ණයෙන්ම ඔබවහන්සේ වෙතට හැරෙමින්, මගේ මුළු හදවතින්ම, මගේ මනසින් සහ මගේ ජිහ්වයෙන්, ඔවහන්සේගෙන් ඉතා ළැදිව බැගෑපත්ව අයැද සිටින්නේ, ඔබවහන්සේගේ දිව්‍යමය ඒකීයභාවයේ චක්‍රය තුළ ඔබවහන්සේගේ කැමැත්තට විරුද්ධ යන සියල්ලෙන් මා ආරක්ෂා කර දෙන ලෙසයි."[9]**

## 6 වන කොටස

සැන්වෙස්ගේ නිවසට ගොස් සදකාලික ගිවිසුමේ තේමාව මත ඔවුන් සමග කළ සංවාදයෙන් පසු අලෙහන්ද්‍රාගේ හදවත ප්‍රීතියෙන් පිරී ඇත. "ඊළග සංචාරය," "බහා'උ'ල්ලා තුමාගේ ජීවිතය පිළිබඳ ඔවුන්ගේ දැනුම ගැඹුරු කර ගැනීමට ඔවුන්ට හොඳ අවස්ථාවක්" වනු ඇතැයි ඇය සිතයි. පහතින් දැක්වෙන්නේ ඇය උකහා ගනු ඇති එම ඉදිරිපත් කිරීමයි:

බහා'උ'ල්ලා තුමාගේ උපත සිදුවූයේ 1817 නොවැම්බර් මස 12 වෙනි දින පර්සියාවේ අගනුවර වූ ටෙහෙරාන් නගරයේදීය. ළමාවියේදි පටන් එතුමා විශේෂ ගතිගුණ ප්‍රදර්ශනය කළ අතර එතුමාගේ හැසිරීම අනුව එතුමා අනාගතයේදි ශ්‍රේෂ්ඨ පුරුෂයෙක් වන බව එතුමාගේ මව්පියන්ට ප්‍රත්‍යක්ෂ විය. රාජසභාවේ විශිෂ්ඨ අමාත්‍යවරයෙකු වූ බහා'උ'ල්ලා තුමාගේ පියා එතුමාට විශේෂ ආදරයක් දැක්විය. බහා'උ'ල්ලාතුමා මහා සාගරයක පිහිනමින් සිටි බවත්, එතුමාගේ ශරීරයෙන් නික්මුණු ආලෝකයෙන් මුළු ප්‍රදේශයම දිප්තිමත්ව බැබළුන බවත් ඔහු එක් රාත්‍රියක සිහිනයෙන් දුටුවේය. එතුමාගේ කාලවර්ණ දිගු කෙස්කලඹ එතුමාගේ හිසවටා සෑම අතකටම විහිදී තිබුණේය. මත්ස්‍යයින් විශාල රාශියක් එතුමා අවට ගැවසෙමින් එකිනෙකා එතුමාගේ කෙස්ගස බැගින් අල්වාගෙන සිටියහ. මත්ස්‍යයින් සංඛ්‍යාව ඉතා විශාල වුවද, එක් කෙස්ගසක්වත් එතුමාගේ හිසින් ගැලවුනේ නැත. කිසිම බාධාවකින් තොරව නිදහසේ එතුමා දිය මත පාවූ අතර ඔවුන් සියල්ලෝම එතුමා පසුපස ගියහ. මේ සිහිනය තේරුම්කර දෙන ලෙස බහා'උ'ල්ලා තුමාගේ පියා ඥානවන්තභාවය ගැන ප්‍රසිද්ධ තැනැත්තෙකුගෙන් ඉල්ලා සිටියේය. අසීමිත සාගරය දිව්‍ය ලෝකය බැව් ඔහු කියා සිටියේය. තනිවම සහ අන්කෙනෙකුගේ ආධාරයෙන් තොරව බහා'උ'ල්ලා තුමා ඒ මත ස්වාධිපත්‍යය ලබාගනු ඇත. මත්ස්‍යයින් රාශියෙන් පෙන්නුම් කරණු ලැබුයේ ලෝකයේ මිනිසුන් අතර එතුමා ඇති කරවන කලබලයයි. එතුමාට සර්වබලධාරීන් වහන්සේගේ සහතික වූ ආරක්ෂාව ලැබෙන අතර කිසිවිටක එතුමාට හානි කිරීමට නොහැකිවේ.

බහා'උ'ල්ලා තුමා දහහතර වන වියට පත්වනවිට ඥානවන්තභාවය හා උගත්කම පිළිබඳව එතුමා රාජ සභාවේ ඉතා ප්‍රසිද්දවිය. එතුමා විසි දෙහැවිරිදි වියේදි එතුමාගේ පියා මියගිය අතර රජය විසින් ඔහු දරමින් සිටි උසස් තත්වය එතුමාට පිරිනමන ලදි. එහෙත් ලෞකික කටයුතු පාලනය කිරීමෙහිලා එතුමාගේ ආශාවක් නොවීය. සර්වබලධාරීන් වහන්සේ විසින් එතුමාට

නියමකර තිබූ මාර්ගයෙහි ගමන් කිරීම සඳහා එතුමා රාජසභාව සහ එහි ඇමතිවරු අත්හැර දැමීය. එතුමා පීඩිතයින්ට, රෝගීන්ට හා දුප්පතුන්ට ආධාර කිරීම සඳහා තම කාලය වැය කළ අතර වැඩිකල් නොගොස් යුක්තිය පසිඳලීමේ වීරයෙකු ලෙස ප්‍රසිද්ධ විය.

විසිහත්වන වියේදී, දෙවියන්වහන්සේගේ දිනය, එනම් මනුෂ්‍යවර්ගයා දිගකුලක් තිස්සේ බලාපොරොත්තු වූ සාමය, ඒකීයභාවය හා යුක්තිය දෙවියන්වහන්සේගේ නව ප්‍රකාශවීමක් විසින් ලොවට ගෙන එන දිනය නුදුරු බැව් ප්‍රකාශයට පත්කරමින් සිටි බාබ්තුමාගේ ලේඛන සමහරක් විශේෂ පණිවිඩ කරුවකුගේ මාර්ගයෙන් බහා'උ'ල්ලා තුමාට ලැබිණ. වහාම බාබ්තුමාගේ පණිවුඩය පිළිගත් බහා'උ'ල්ලා තුමා එතුමාගේ උද්යෝගීමත් අනුගාමිකයින්ගෙන් කෙනෙක් විය. එහෙත් අහෝ, ඔවුන්ගේ ආත්මාර්ථකාමී ආශාවන් නිසා අන්ධවූ, පර්සියාවේ පාලකයින් බාබ්තුමාගේ අනුගාමිකයින්ට ම්ලේච්ඡ ලෙස වධ හිංසා කිරීමට පටන් ගත්හ. තම වංශවත් බව ගැන ප්‍රසිද්ධ වූ බහා'උ'ල්ලා තුමා පවා එයින් නොගැලවුනේය. බාබ්තුමාගේ ප්‍රකාශයෙන් යම්තම් අවුරුදු අටකට පමණ පසු සහ බාබ්තුමා ඝාතනය කරණු ලැබීමෙන් අවුරුදු දෙකකට පසු "කළුවල" නම්වූ අඳුරු ගුහාවක බහා'උ'ල්ලා තුමා සිරකරණු ලැබීය. එතුමාගේ ගෙලවටා බැඳ තිබූ දම්වැල් වල බර නිසා එතුමාට හිස එසවීමට පවා නොහැකිවිය. බරපතල දුෂ්කරතා මධ්‍යයේ සිව්මසක් පමණ මෙය තුල බහා'උ'ල්ලා තුමාට ගත කිරීමට සිදුවිය. එසේ වුවද, දේවාත්මය එතුමාගේ ආත්මයට ඇතුළුවී සියළුම යුගවල පොරොන්දු වූ තැනැත්තන් වහන්සේ එතුමා බැව් අනාවරණය කරණු ලැබුයේ මේ ගුහාව තුලදීය. මේ අඳුරු ගුහාව තුලින් බහා'උ'ල්ලා තුමා නමැති සූර්යයා සකල නිර්මාණයම ආලෝකමත් කරමින් නැග ආවේය.

සිව් මසකට පසු සියළුම වස්තුව අහිමි කරනු ලැබූ බහා'උ'ල්ලා තුමා සහ එතුමාගේ පවුල රටින් පිටවුහල් කරණු ලැබීය. අද ඉරාක් දේශයේ අගනුවරවුත් එවකට ඔටෝමන් අධිරාජ්‍යයේ නගරයක් වුත් බැග්ඩැග් කරා, ශීත ඍතුවේ අධික ශීතල මධ්‍යයේ පර්සියාවේ බටහිර කඳුකරය හරහා යාමට එතුමාට සහ පවුලේ අයට සිදුවිය. ඒ ඉරණම්කාරී නගරය කරා සැතපුම් සිය ගණනක් හිමෙන් වැසී ගිය පොළව මත පයින් යාමේදී එතුමන්ලාට විඳිනන්ට සිදුවූ දුක් ගැහැට වචන වලින් විස්තර කළ නොහැක.

වැඩිකල් නොගොස් බහා'උ'ල්ලා තුමාගේ ප්‍රසිද්ධිය බැග්ඩැග් හා ප්‍රදේශයේ අනිකුත් නගර පුරා පැතිරගිය අතර වැඩි වැඩියෙන් මිනිසුන් මේ පිටවුහල් කරණු ලැබූ සිරකරුවාණන්ගේ ආශිර්වාදය ලබාගනුවස් එතුමාගේ දොරටුව වෙත පැමිණියහ. එහෙත් එතුමාගේ ප්‍රසිද්ධිය ගැන ඊර්ෂ්‍යාවෙන් පසුවූ කීපදෙනෙක්ද සිටියහ. බහා'උ'ල්ලා තුමාගේම ආදරය හා ආරක්ෂාව යටතේ ජීවත්වූ එතුමාගේ ඥාති සොයුරු මිර්සා යහියා ද ඔවුන් අතර විය. මේ වන විට ඔහුට විශාල ගෞරවයක් දක්වූ බාබිවරු ඔවුන්ගේ නායකයා ලෙස තමා පිළිගනීවි යන අදහසින් මිර්සා යහියා බහා'උ'ල්ලා තුමාට විරුද්ධ විය. දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීමට විරුද්ධ වීමෙන් තමාගේම පිරිහීම ලගාවන බැව් ඔහු දැන නොසිටියේය. දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීමක් පහලවූ විට සත්‍ය ශ්‍රේෂ්ඨත්වය බලාපොරොත්තු විය හැක්කේ එතුමන්ට සේවය කරමින් ජීවත් වන අයට පමණක්ය. එතුමා අනිකුත් සියළුම මනුෂ්‍යවර්ගයා ගෙන් වෙන්වී කැපී පෙනෙන බවත්, වෙනත් කිසිවෙකුට නැති තත්වයක් එතුමාට ඇති බවත් එතුමාගේ සමීපතම නෑදෑයින්ට පවා අමතක කළ නොහැකි විය.

මිර්සා යහියාගේ කුමන්ත්‍රණය නිසා බාබ්තුමාගේ අනුගාමිකයින් අතර භේද ඇතිවූ අතර මෙය බහා'උ'ල්ලා තුමාගේ තදබල කණගාටුවට හේතුවිය. එක්තරා රාත්‍රියක, එතුමා කිසිවෙකුට නොදන්වා තම නිවසින් පිටත්වී කුර්දිස්තාන් කඳුකරය බලා පිටත්විය. එතුමා එහිදී යාඥා හා භාවනා කරමින් හුදකලා ජීවිතයක් ගත කළේය. කුඩා ගුහාවක ජීවත්වූ එතුමා ඉතාම සරල ආහාර වලින් යැපුණේය. කිසිවෙක් එතුමාගේ නම හෝ කෙහෙන් පැමිණියේද යනවග නොදත්හ. එසේ වුවද, ක්‍රම ක්‍රමයෙන් ප්‍රදේශයේ මිනිසුන් දෙවියන්වහන්සේ විසින් ප්‍රදනය කර ඇති දැනීමකින් යුත් මේ නමක් නැති ශ්‍රේෂ්ඨ ශුද්ධවන්තයා ගැන කථා කිරීමට පටන් ගත්හ.

එතුමාගේ ශුද්ධ වූ පෞරුෂයේ ප්‍රවෘත්තිය බහා'උ'ල්ලා තුමාගේ වැඩිමහල් පුත් අබ්දුල්-බහා තුමාගේ කණ වැටුණු වහාම ඒ අන්කසිවෙක් නොව තම ආදරණීය පියාණන් බව එතුමා හඳුනා ගත්තේය. ආපසු බැග්ඩෑග් නගරයට එන ලෙස ඉල්ලා විශේෂ පණිවුඩකරුවෙකුගේ මාර්ගයෙන් බහා'උ'ල්ලා තුමාට ලිපි යවනු ලැබීය. එතුමා එම ඉල්ලීම පිළිගැනීම නිසා අවුරුදු දෙකක් තිස්සේ පැවති වේදනාකාරී වෙන්වී සිටීමේ කාලසීමාව අවසන් විය.

බහා'උ'ල්ලා තුමා වෙන්වී සිටි කාලය තුල බාබි සමාජයේ තත්වය වේගයෙන් පිරිහී තිබුණි. බහා'උ'ල්ලා තුමා දඬුවම් ලැබ සහ වික්ෂිප්තව සිටි බාබ්තුමාගේ අනුගාමිකයින් තුල නව උනන්දුවක් ඇති කිරීමෙහි නියුක්ත විය. බහා'උ'ල්ලා තුමා ඒ වනතුරු තම ශ්‍රේෂ්ඨ තත්වය ප්‍රකාශයට පත්කර නොතිබුණද, එතුමාගේ වචනවල බලය හා ඥනවන්තභාවය නිසා බාබිවරුන් වැඩි සංඛ්‍යාවකගේ පක්ෂපාතීභාවයත් සෑම තත්වයකම මිනිසුන්ගේ ගෞරවයත් දිනාගැනීමට සමත්විය. එහෙත් අන්තවාදී මුස්ලිම් පූජකවරුන්ට සහ එතුමාගේ ඊෂ්‍යායා පාර්ශව සොහොයුරු මිර්සා යහියාට එබඳු විශාල පිරිසක් මත බහා'උ'ල්ලා තුමා තුල තිබූ බලපෑම ඉවසිය නොහැකිවිය. ඔවුන් බලධාරීන්ට පැමිණිලි පිට පැමිණිලි කිරීම නිසා පර්සියානු රජය සහ ඔටෝමන් අධිරාජ්‍යයේ නිලධාරීන් කීප දෙනෙක්ද එකතු වී බහා'උ'ල්ලා තුමා එතුමාගේ ජන්මභූමියෙන් තවත් එපිටට, මෙවර කොන්ස්තන්තිනනෝපල් නගරයට, පිටවුහල් කිරීමට තීරණය කළහ.

1863 අප්‍රේල් මාසය බැග්ඩෑග් නගරවැසියන්ට ඉතා කණගාටු දයක මාසයක් විය. ඔවුන් ඉතා තදින් ආදරය කරමින් සිටි තැනැත්තාණන් කිසිවෙක් නොදන්නා ස්ථානයක් කරා යාම සඳහා තම නගරයෙන් නික්ම යමින් සිටියේය. එතුමා පිටත්වීමට දින කිහිපයකට කලින්, බහා'උ'ල්ලා තුමා නගරයෙන් පිටත උද්‍යානයකට පැමිණ, එහි තම කූඩාරම නංවා දින දෙලහක් තිස්සේ තමාට ආයුබෝවන් කීම සඳහා වැල නොකැඩී පැමිණි අමුත්තන් පිළිගනිමින් සිටියේය. බාබ් තුමාගේ අනුගාමිකයින් මේ උද්‍යානයට පැමිණියේ හදපිරි සොවින් යුතුවය. ඔවුන්ගෙන් සමහරෙක් බහා'උ'ල්ලා තුමාගේ පිටවුහල් කරණු ලැබීමේ මීලග පියවරේදී එතුමා සමග යන නමුදු, බොහෝ දෙනෙකුට නැවතීමට සිදුවන නිසා එතුමා සමග ලගින් ආශ්‍රය කිරීමේ අවස්ථාව නැතුව යනු ඇත. එහෙත් දෙවියන්වහන්සේ මේ අවස්ථාව කණගාටුදයක අවස්ථාවක් නොවීමට වග බලාගත්සේක. උන්වහන්සේ අසීමිත පරිත්‍යාගශීලි භාවයේ දෙරටු පුළුල්ව විවෘත කරණු ලැබීය. අනාගතයේදි පහල වන බවට බාබ් තුමා අනාගත වාක්‍ය පැවසූ තැනැත්තානන් දෙවියන්වහන්සේ විසින් ප්‍රකාශයට පත් කරණු ලබන තැනැත්තානන් තමා බව බහා'උ'ල්ලා තුමා තමා අවට සිටි අයට ප්‍රකාශ කළේය. කණගාටුව වෙනුවට අසීමිත ප්‍රීතියි පැතිර ගියේය. හදවත් ප්‍රීතියෙන් ඉපිලගිය අතර ආත්මයන් එතුමාගේ ආදරය නමැති ගින්නෙන් ආලෝකමත් විය. ඉදිරියේ එළඹෙන ශතවර්ෂ ගණනාවක් තිස්සේ, අප්‍රේල් මස 21 වෙනි දින සිට මැයි මස 2 වෙනි දින දක්වා වූ මේ දින දෙළහ, සෑම ප්‍රදේශයකම සිටින බහායිවරු රිස්වාන් උත්සවය ලෙස, බහා'උ'ල්ලා තුමාගේ ලෝක ව්‍යාප්ත පණිවුඩය ප්‍රකාශයට පත් කරණු ලැබීමේ වාර්ෂිකය ලෙස අනුස්මරණය කරණු ඇත.


කොන්ස්තන්තිනෝපල් නගරය ඔටොමන් අධිරාජ්‍යයේ අග නගරය විය. මෙහිදිද බහා'උ'ල්ලා තුමාගේ ශ්‍රේෂ්ඨ ඥනයත්, පෞද්ගලික ආකර්ෂණයත් නිසා වැඩි වැඩියෙන් මිනිසුන් එතුමා වෙතට ඇදී ඒමට පටන් ගත්හ. "ඔහු තව දුරටත් මෙහි රැදී සිටීම සුදුසු නැත" යනුවෙන් කසු කුසු ගෑ අන්තවාදී මුස්ලිම් පූජකවරු එතුමා අද්‍රියනෝපල් නගරයට පිටුවහල් කළ යුතු බව බලධාරීන්ට ඒත්තු ගැන්වූහ. අද්‍රියනෝපල් නගරයේදී ලෝකයේ රජවරුන්ට හා පාලකයින් හට ලිපි ලිවූ එතුමා ඔවුන්ගේ දරුණු පාලනය අතහැර දමා තම රටවල මිනිසුන්ගේ ශුභ සිද්ධිය උදෙසා සේවය කිරීමට කැපවන ලෙස දන්වා සිටියේය. මේ අවස්ථාව වනවිට එතුමාගේ සතුරෝ එතුමාට ඉතාම දරුණු දඬුවමක් දීමට අර අදිමින් සිටියහ. එතුමා සහ එතුමාගේ පවුලේ අය එකල මුළු අධිරාජ්‍යයේම තිබූ දරුණුතම සිරකඳවුර වූ ඇකා නගරය වෙත පිටවුහල් කිරීම ඔවුන්ගේ සැලසුම විය. දෙවියන්වහන්සේ විසින්ම ක්‍රියාත්මක කිරීමට පටන්ගෙන තිබූ ක්‍රියාදමය

නවතාලන්ට තමන්ට හැකිවේයයි සිතූ මේ දුබල මනසක් ඇති මිනිස්සුන් එම සිර කඳවුරේ කර්කශ තත්වයට ඔරොත්තු දිය නොහැකිව එතුමා මියයනු ඇතැයි සිතූහ.

ඇකාහිදී බහා'උ'ල්ලා තුමාට විඳින්නට සිදුවූ දුෂ්කරතා විස්තර කළ නොහැකි තරම්ය. ආරම්භයේදී වෙනමම සිරකුටියක තනිවම රඳවාලනු ලැබූ එතුමා බැලීමට එතුමාගේ දරුවන්ට පවා තහනම් විය. දිවා රාත්‍රී දෙකෙහිම සතුරන් විසින් වට කරණු ලැබ සිටි එතුමාට කිසිම සුව පහසුවක් නොවීය. එහෙත් සිරකරනු ලැබ සිටි තත්වය ක්‍රම ක්‍රමයෙන් වෙනස් වීමට පටන් ගත්තේය. ඇකා නගරයේ පදිංචිකරුවන් සහ එහි පාලක පක්ෂය ඔවුන්ගේ නගරයට පිටුවහල් කරනු ලැබ කුඩා බහායිවරුන් කණ්ඩායමේ අහිංසකත්වය අවබෝධ කර ගත්හ. නැවතත් වරක්, බොහෝ දෙනෙකුට එතුමාගේ ශ්‍රේෂ්ඨ තත්වය අවබෝධ කරගත නොහැකි වුවද, මේ අසාමාන්‍ය පුද්ගලයාණන්ගේ ප්‍රඥුව හා ආදරය නිසා එතුමා වටා මිනිස්සු රොක්වන්නට වූහ. අවුරුදු කීපයකට පසු බහා'උ'ල්ලා තුමාට සහ එතුමාගේ අනුගාමිකයින්ට සිර කඳවුරේ දොරටු විවෘත විය. අවසානයේදී අද අපි බාජී මන්දරිය ලෙස නම් කරන නිවාසයට වී වඩා සුවපහසු පරිසරයක ජීවත්වීමට එතුමාට අවසර ලැබිණ. එහිදී එතුමා තම ප්‍රතාපවත් බවේ මුදුන් හිණි පෙත්තටම නැග සිටි අවස්ථාවේ 1892 මැයි මාසයේදී ස්වර්ගස්ථ විය.

විශ්ව සාමයේ සහ සහෝදරත්වයේ ධජය නැංවූ බහා'උ'ල්ලා තුමා, දේව වචනය අනාවරණය කළේය. එතුමාගේ සතුරන් එකට එකතු වී එතුමාට විරුද්ධව කටයුතු කළද, ටෙහෙරාන්හි සිරගෙදර දම්වැල් වලින් බඳිනු ලැබ සිටියදී දෙවියන්වහන්සේ පොරොන්දු වූ පරිදි එතුමා ඔවුන් අභිබවා ජයග්‍රාහී විය. එතුමාගේ ජීවිත කාලය තුලදීම, එතුමාගේ පණිවුඩයෙන් දහස් ගණන් මිනිසුන්ගේ හදවත් නව පණක් ලද අතර බොහෝ දෙනෙක් එතුමාගේ මාර්ගයෙහි දිවි පිදූහ. එසේම අද, එතුමාගේ ඉගැන්වීම් ලොව පුරා පැතිරයමින් පවතී. මනුෂ්‍ය වර්ගයා එක් විශ්ව ආගමක් තුල, එක් පොදු ධර්මයක් තුල එක්සත් කිරීම නමැති එතුමාගේ අවසාන අරමුණ සාක්ෂාත් කර ගැනීමෙන් එතුමා වැලැක්වීමට කිසිවෙකුට නොහැක.

බහා'උ'ල්ලා තුමාගේ ජීවිතය පිළිබඳ ඉහත කථාව සාපේක්ෂව දිගුය. පහත අභ්‍යාස වෙත යාමට පෙර, ඔබ ඔබේ කණ්ඩායම තුල කථාව ඡේදය ඡේදයෙන් කියවා අන්තර්ගතය හොඳින් ඉගෙන ගෙන එය පහසුවෙන් ඉදිරිපත් කළ හැකි වන තෙක් එකිනෙකාගෙන් ප්‍රශ්න ඇසිය යුතුය. පහත සිතියම ඔබට බහා'උ'ල්ලා තුමාගේ පිටුවහල් කිරීමේ මාර්ගය සිහියට කැඳවා ගැනීමට සහ ඒ අතරතුර සිදු වූ සිදුවීම් මතක තබා ගැනීමට උපකාරී වනු ඇත.



1. ඉහත කථාවේ පදනම මත, බහා'උ'ල්ලා තුමාගේ ජීවිතය හා සම්බන්ධ ප්‍රධාන සිදුවීම් අනුපිළිවෙල සපයා ඇති අවකාශයේ ලිවීම ඔබට ප්‍රයෝජනවත් විය හැක.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

2. බහා'උ'ල්ලා තුමාගේ ජීවිතය යන තේමාව වටා කෙරෙන සාකච්ඡාවකදී, සිදුවීම් අනුපිළිවෙල හැරුණු විට අවධාරණය කළ යුතු සංකල්ප ගණනාවක් තිබේ. මනුෂ්‍යත්වයට ඇති ආදරය නිසා උන්වහන්සේ විඳදරාගත් දුක් වේදනා මෙන්ම විරුද්ධවාදිකම් හමුවේ උන්වහන්සේගේ ධර්මය විසින් අත්කරගත් අසාමාන්‍ය ජයග්‍රහණ පිළිබඳවද ආවර්ජනය කිරීම විශේෂ වැදගත්කමකි. මෙම වචන අපගේ මනසෙහි සහ හදවත්වල කැටයම් වේවා:

**"පෞරාණික අලංකාරය නම්වූ එතුමා මනුෂ්‍යවර්ගයා එහි වහල් භාවයෙන් මුදවාගනු වස් දම්වැල්වලින් බැඳ තබනු ලැබීම ඉවසූ සේක. මුළු ලොවටම සත්‍ය නිදහස ලබාගැනිමට හැකිවනු සඳහා මේ ප්‍රබල බලකොටුවු තුල සිරකරුවෙක් කරණු ලැබීම පිළිගත් සේක. මිහිමත වසන සියලුම මිනිසුන්ට සදාකාලික සතුට ලැබී ප්‍රීතියෙන් පිනායෑමට හැකිවෙනු සඳහා දුක්විඳීම නමැති කුසලානයේ පත්ල දක්වාම හිස්කල සේක. කාරුණික වූත්, අති සානුකම්පිතවූත්, ඔබලාගේ ස්වාමින්ගේ දයානුකම්පාව නම් මෙයයි. දෙවියන්වහන්සේගේ ඒකීයභාවය අදහන්නනි, ඔබලා උසස් බවට පත් කරුණු ලැබීම සඳහා අපි අවමානයට පත් කරණු ලැබීම පිළිගත්තෙමු. ඔබලා**

**සමෘද්ධිමත් හා සෞභාග්‍යමත් වීම සඳහා අනේක විධ දුක්කරදර වින්දෙමු. දෙවියන්වහන්සේ අදහන්නාවුන් වූ ඔවුන්, සකල ලෝකයම නැවත අලුතින් ගොඩ නැගීම සඳහා පහලවූ උත්තමයාට නගර අතුරින් ඉතාම පාළු නගරයෙහි පදිංචිවීමට බලකර ඇති අන්දම බලනු මැනවි."[10]**

3. අපි බහා'උ'ල්ලා තුමාගේ දුක් වේදනා ගැන කතා කරන විට, උන්වහන්සේගේ සතුරන්ගේ අසරණ ගොදුරක් ලෙස උන්වහන්සේව ඉදිරිපත් නොකිරීමට අපි වගබලා ගත යුතුය. මනුෂ්‍යත්වය නිදහස් කර ගැනීම සඳහා දම්වැල්වලින් බැඳදැමීම උන්වහන්සේ කැමැත්තෙන්ම පිළිගත්තේය. උන්වහන්සේගේ ජීවිත කතාව, මහා දුක්ඛිත සිදුවීම්වලින් පිරී තිබුණද, එහි සාරය තුළ පවතින්නේ විජයග්‍රහණයකි. ඔබේ කණ්ඩායමේ උපදේශකයාගේ සහාය ඇතිව, බහා'උ'ල්ලා තුමාගේ ජීවිතය පිළිබඳ ඔබේ වර්තමාන දැනුම මත පදනම්ව උන්වහන්සේගේ දුක් වේදනා සහ ජයග්‍රහණ පිළිබඳ කෙටි කතාවක් සකස් කළ හැකිද? පහත ප්‍රශ්න මේ සඳහා ඔබට උපකාර විය හැක.

අ. බහා'උ'ල්ලා තුමා දම්වැලකින් බැඳදැමීමට එකඟ වූයේ ඇයි?..........................................
..........................................................................................................................

ආ. බහා'උ'ල්ලා තුමා සිරකරුවෙකු වීමට පිළිගත්තේ ඇයි?..................................................
..........................................................................................................................

ඇ. බහා'උ'ල්ලා තුමා දුක්විඳීම නමැති කුසලානෙන් පානය කළේ ඇයි?..............................
..........................................................................................................................

ඈ. බහා'උ'ල්ලා තුමා අවමානයට පත් කරණු ලැබීම පිළිගත්තේ ඇයි?...............................
..........................................................................................................................

ඉ. බහා'උ'ල්ලා තුමා අනේක විධ දුක්කරදර වින්දේ ඇයි?......................................................
..........................................................................................................................

ඊ. බහා'උ'ල්ලා තුමා දුක් විඳීමට පිළිගත්තේ උන්වහන්සේට වෙනත් ආකාරයකින් කිරීමට උන්වහන්සේ බල රහිත නිසාද?.............................................................................................

උ. බහා'උ'ල්ලා තුමා තම සතුරන් ඉදිරියේ බල රහිත නොවූයේ නම්, උන්වහන්සේ දුක් විඳීම පිළිගත්තේ ඇයි?.............................................................................................................
..........................................................................................................................

**7 වන කොටස**

සැන්චෙස් නිවසට අලෙහන්ද්‍රාගේ දෙවන සංචාරයද පළමු අවස්ථාව තරම්ම ප්‍රීතිමත්ය. සැන්චෙස් මහතා සහ එම මහත්මිය බහා'උ'ල්ලා තුමාගේ ජීවිත කතාව ගැන දැනටමත් තරමක් හුරුපුරුදු නමුත් ඔවුන් අලෙහන්ද්‍රාගේ ඉදිරිපත් කිරීමෙන් වැඩි විස්තර දැනගැනීමට සතුටු වූ අතර උන්වහන්සේගේ දුක් විඳීමේ කථාව හේතුවෙන් පැහැදිලිවම හැගුම්බරවී ඇත. "පෙනෙන විදිහට", "දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම් සැමවිටම දුක් විඳින්නේ නායකත්වයට සහ ලෞකික බලයට

පිපාසයෙන් සිටින අය අතින් බව." සැන්චෙස් මහත්මිය එක් අවස්ථාවක ඕනෑකමින් සිතා බලයි. ඇය කටපාඩම් කරගත් - ඔබත් පසුගිය කොටස අධ්‍යයනයෙන් ඉගෙනගත් - උද්ධෘත පාඨයක් ඔවුන් සමඟ බෙදගැනීම සුදුසු බව අලෙහන්ද්‍රා තීරණය කරයි, එහිදී අප පීඩාවන්ගෙන් නිදහස්කර සදාකාලික සතුට ලබාගැනීමට හැකි වනු පිණිස, මනුෂ්‍යත්වය වෙනුවෙන් තමන් විඳින ලද දුක් වේදනා ගැන බහා'උ'ල්ලා තුමා කතා කරයි. එදින සාකච්ඡාවෙන් මිතුරන් තිදෙනාම උද්යෝගිමත් බවක් දැනේ.

ඇයගේ මීළඟ සංචාරය ගැන මෙනෙහි කිරීමේදී, අලෙහන්ද්‍රා ඉක්මනින් නිගමනය කරන්නේ අබ්දුල්-බහා තුමාගේ ස්ථානය සාකච්ඡාව සඳහා ස්වභාවික තේමාවක් වනු ඇති බවයි. ඇය ආවරණය කිරීමට වග බලා ගන්නා කරුණු මේවායः

බහා'උ'ල්ලා තුමාගේ වැඩිමහල් පුත්‍රයා වන 'අබ්දුල්-බහා තුමා යනු මානව ඉතිහාසයේ සුවිශේෂීම චරිතයක් වන අතර, පෙර කිසිම ආගමක උන්වහන්සේ වැනි පුද්ගල චරිතයක් අපට සොයාගත නොහැක. උන්වහන්සේ කුඩා කාලයේදීම තම පියාණන්ගේ දිව්‍යමය ස්ථානය හඳුනාගෙන උන්වහන්සේගේ පිටුවහල්කිරීම් වලට හා දුක් වේදනාවලට හවුල් විය. බහා'උ'ල්ලා තුමා උන්වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසු බහායි ප්‍රජාව 'අබ්දුල්-බහා තුමාගේ රැකවරණය සහ ආරක්ෂාව යටතට තබා ගියේය. උන්වහන්සේගේ අති උත්තරීතර අනාවරණය පමණක් නොව, උන්වහන්සේගේ පුත්‍රයාද අපට ලබා දීමෙන් බහා'උ'ල්ලා තුමා මනුෂ්‍යත්වයට ලබා දුන් දේ අපට කිසිදු සම්පූර්ණයෙන් අගය කළ නොහැක, උන්වහන්සේගේ දැනුම සහ ප්‍රඥාව තුළින් ලෝකය මඟ පෙන්වනු ලබන අතර ආලෝකමත් වනු ඇති බව උන්වහන්සේ පැවසීය.

අපි 'අබ්දුල්-බහා තුමාගේ ජීවිතය සහ ප්‍රකාශයන් අධ්‍යයනය කරන විට, මෙම ශාසනය තුළ උන්වහන්සේ සිටින අද්විතීය ස්ථානය පිළිබඳව අපට අවබෝධයක් ලැබේ. මෙම ස්ථානයේ අංග තුනක් අප මතක තබා ගැනීම වැදගත් වේ.

පළමුව, 'අබ්දුල්-බහා තුමා යනු බහා'උ'ල්ලා තුමාගේ ගිවිසුමේ කේන්ද්‍රයයි. බහා'උ'ල්ලා තුමා උන්වහන්සේගේ අනුගාමිකයන් සමඟ ගිවිසුමක් ඇති කරගත්තේ එම කේන්ද්‍රය දෙසට ඔවුන්ගේ හදවත් යොමු කරන ලෙස සහ සම්පූර්ණයෙන්ම එයට පක්ෂපාතී වන ලෙසට ඔවුන්ගෙන් ඉල්ලා සිටිමින්ය. උන්වහන්සේගේ අන්තිම කැමති පත්‍රය සහ තෙස්තමේන්තුවෙන්, 'අබ්දුල්-බහා තුමා ධර්මයේ ආරක්ෂකවරයා ලෙස ෂෝගි එෆෙන්ඩි තුමා නම් කරන ලද්දේ උන්වහන්සේගේ අභාවයෙන් පසු සියලු දෙනා හැරිය යුතු කේන්ද්‍රය වීමටය. අද, මෙම කේන්ද්‍රය වන්නේ බහා'උ'ල්ලා තුමාගේ පැහැදිලි අණට අනුව සහ 'අබ්දුල්-බහා තුමා සහ ආරක්ෂකවරයා විසින් දෙන ලද පැහැදිලි උපදෙස් අනුව පිහිටුවා ඇති විශ්ව අධිකරණ මණ්ඩලයයි. ගිවිසුමේ බලය බහායි ප්‍රජාව එකට තබා ඇති අතර එය බෙදීම් වලින් හා බිඳවැටීම් වලින් ආරක්ෂා කරයි.

දෙවනුව, අබ්දුල් බහාතුමා බහා'උ'ල්ලා තුමාගේ වචනයේ නොවරදින සුළු අර්ථකථකයාණෝය. බහා'උ'ල්ලා තුමාගේ අනාවරණය කොපමණ විශාලද එතුමාගේ සෑම ප්‍රකාශයකම අඩංගු අදහස් කොපමණ විශාලද එතුමාගේ සෑම ප්‍රකාශයකම අඩංගු අදහස් කොපමණ ගැඹුරුද යතහොත් එතුමා විසින්ම මග පෙන්වනු ලැබූ අර්ථකථකයාණන් කෙනෙක් හැරයාම අවශ්‍යයයි එතුමා කල්පනා කළේය. මේ අන්දමින් ඉදිරි පරම්පරාවලදී මනුෂ්‍යවර්ගයාට අබ්දුල්-බහාතුමා උන්වහන්සේගේ පත්‍රක විශාල සංඛ්‍යාවක් හා උන්වහන්සේගේ බවට සහතික කරන ලද කථාවල පිටපත්වලින් ඉදිරිපත් කරනු ලැබ ඇති අර්ථකථනයන් අධ්‍යයනය කිරිමෙන් බහා'උ'ල්ලා තුමාගේ ඉගැන්වීම් අවබෝධකර ගැනිමට හැකිවනු ඇත. අබ්දුල් බහා තුමාගෙන් පසු ෂෝගී එෆෙන්ඩි තුමා අර්ථකථකයාණන්වූ අතර එතුමාත් සමග අර්ථකථනය කිරිමේ කාර්යය අවසන්වූ බැවින් බහා'උ'ල්ලා තුමාගේ ශාසනයේ ඉතිරි කාලය තුල එතුමාගේ වචනවලට අර්ථකථනයක් දීමට වෙනත් කිසි කෙනෙකුට බලයක් නැත.

අතීතයේදී, සෑම ආගමක්ම එහි ශුද්ධ ලියවිල්ලේ ඡේදවල විවිධ අර්ථකථන මත බෙදීම්වලින් පීඩා විඳිති. නමුත් මෙම සාශනය තුළ, බහා'උ'ල්ලා තුමාගේ ප්‍රකාශයක අර්ථය පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇති විට, සෑම කෙනෙකුම 'අබ්දුල්-බහා තුමාගේ සහ ආරක්ෂකවරයාගේ අර්ථකථන වෙත යොමු වේ. අවිනිශ්චිතතාවයක් දිගටම පවතින්නේ නම්, පැහැදිලි කිරීම සඳහා කෙනෙකුට විශ්ව අධිකරණ මණ්ඩලය වෙත හැරිය හැකිය. එසේ නම්, ඉගැන්වීම්වල අර්ථය පිළිබඳ ගැටුමකට ඉඩක් ඉතිරි නොවන අතර ධර්මයේ එකමුතුකම ආරක්ෂා වේ.

තෙවනුව, අබ්දුල්-බහාතුමා තම පියාණන්ගේ ගැන්වීම්වල අංග සම්පූර්ණ ආදර්ශකයාණෝය. පරිපූර්ණත්වයේ එතරම් උසස් ස්ථානයකට ලගාවීමට අපට කිසිදිනක බලාපොරොත්තු විය නොහැකිවවුද අපි නිතරම එතුමා දෙස බලා එතුමාගේ ආදර්ශය අනුගමනය කිරිමට උත්සාහ කළ යුතුය. ප්‍රේමය ගැන ශුද්ධ වු ලේඛනවල ඔබ කියවනවිට අබ්දුල් බහා තුමා වෙතට යොමු වුව හොත් ඔබට ප්‍රේමයේ සහ කාරුණිකභාවයේ ප්‍රතිමූර්තිය එතුමා තුලින් දැකිය හැක. ඔබ පවිත්‍රතාවය, යුක්තිය, ඍජුභාවය, ප්‍රීතිය හා පරිත්‍යාගශිලීභාවය යන මේවා ගැන කියවනවිට එතුමා වෙතට යොමුවන්න. එතුමාගේ ජීවිතය ගැන සිතන්න. එවිට එතුමා මේ ගුණාංග කොපමණ අංග සම්පූර්ණ ලෙස පිළිබිඹු කළේදැයි ඔබට දැකිය හැක.

'අබ්දුල්-බහා තුමාගේ ජීවිතයේ සලකුණ වූයේ, ඇත්ත වශයෙන්ම, උන්වහන්සේගේ දසත්වයයි. "අබ්දුල්-බහා" යන නාමයේ තේරුම "බහාගේ සේවකයා" යන්නයි, මෙය උන්වහන්සේට ආරෝපණය කරන ලද අනෙක් සියල්ලන්ට වඩා එතුමාණන් කැමති පටබැඳිනාමය විය. අබ්දුල්-බහා තුමාගේ පහත වදන් උන්වහන්සේගේ සේවය කිරීමට ඇති දැඩි ආශාවේ ප්‍රකාශනයයි.

**"මාගේ නාමය අබ්දුල් බහාය. මාගේ සුදුසුකම අබ්දුල් බහාය. මාගේ සත්‍යතාවය අබ්දුල් බහාය. මගේ ප්‍රශංසාව අබ්දුල් බහාය. ආශිර්වාදලත් අලංකාරයට දස මෙහෙවර කිරීම මාගේ තේජාන්විත හා ප්‍රබෝධමත් කිරුළයි, සකල මනුෂ්‍යවර්ගයාට දසත්වය මාගේ සදකාලික ආගමයි..... අබ්දුල් බහා යන්න හැර අන් නමක්, නම්බු නාමයක්, වර්ණාකරනු ලැබිමක්, ප්‍රශංසාවක් මට නැතිවාක් මෙන්ම අනාගතයේදීද එසේම වනු ඇත. මාගේ ප්‍රාර්ථනය මෙයයි. මාගේ තදබල ආශාව මෙයයි. මාගේ සදකිලක ජීවිතය මෙයයි මාගේ සදකාලික කීර්තිය මෙයයි."[11]**

පැහැදිලිවම අලෙහන්ද්‍රා ඇගේ මීළඟ සංචාරයේදී සැන්චෙස්වරුන් සමඟ බෙද ගැනීමට සැලසුම් කරන දෙය වඩාත් සුවිශේෂී චරිතයක් පිළිබඳ හැඳින්වීමකට වඩා වැඩි දෙයක් නොවන්නේය; මෙම ශාසනය තුල 'අබ්දුල්-බහා තුමා' විසින් උසුලාගෙන සිටිනු ලැබු ස්ථානය පිළිබඳ ඔවුන්ගේ අගය කිරීම ඉදිරි වසරවල දී ද වර්ධනය වනු ඇත. ඔබගේම ජීවිතයේදී, ඔබ සේවයේ මාවතේ ගමන් කරන විට, උන්වහන්සේගේ ආදර්ශය සිහියට ගැනීමටත්, උන්වහන්සේගේ වදන් මෙනෙහි කිරීමටත් ඔබට බොහෝ අවස්ථාවන් ලැබෙනු ඇත. දැනටමත්, පෙර ඒකකයේදී, ඔබ උන්වහන්සේගේ සමහර ප්‍රකාශයන් ගැන හුරුපුරුදු වී ඇති අතර, උන්වහන්සේගේ පත්‍රක සහ ප්‍රසිද්ධ කතාවල දක්වා ඇති අදහස් උන්වහන්සේ කළ ආකාරයෙන් ප්‍රකාශ කිරීමට ඉගෙන ගැනීමට ඔබව දිරිමත් කර ඇත. දැනට, උන්වහන්සේගේ ස්ථානය පිළිබඳ ඔබේ වර්තමාන අවබෝධය තහවුරු කර ගැනීම සඳහා, ඉහත සඳහන් කළ ප්‍රධාන කරුණු පිළිබඳව ඔබේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයන් සමඟ සාකච්ඡා කර ඒවා හොඳින් කීමට පුරුදු වන්න. උපුටා දක්වන ලද ඡේදය ආවර්ජනය කිරීම සේවා මාවතේ ඉදිරියට යාමට ඔබ දරන ප්‍රයත්නයන් සඳහා ඔබව පොළඹවනු ඇත.

## 8 වන කොටස

සැන්චෙස් මහතා සහ එම මහත්මිය සමඟ ඇයගේ සංචාරයන් ආරම්භ කළද සිට අලෙහන්ද්‍රාගේ මනසේ පවතින ප්‍රශ්නයක් නම්, අසල්වැසි ප්‍රජාව ගොඩනැගීමේ ක්‍රියාවලියේ ස්ථිර සහ ක්‍රියාකාරී ප්‍රධාන චරිත බවට පත්වීමට ඔවුන්ට වැඩිපුරම උපකාර වන සාකච්ඡාවේ තේමාවන් මොනවාද යන්නයි. එක් අතකින්, ඔවුන්ගේ අධ්‍යාත්මික ජීවිතයේ අත්තිවාරම් අඛණ්ඩව ශක්තිමත් කළ යුතු නිසා ඔවුන් සමඟ සාකච්ඡා කිරීමට ඇය බලාපොරොත්තු වන යාච්ඤාව, ආත්මයේ අමරණීයභාවය,

දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ස්ථිරභාවය වැනි තේමාද තිබේ. අනෙක් අතට, ක්‍රමක්‍රමයෙන් වර්ධනය වන ප්‍රජාවක් පිළිබඳ දැක්මක් ලබා ගැනීම සහ එය සාක්ෂාත් කර ගැනීම සඳහා වටිනා දයකත්වයක් ලබා දිය හැකි බව දැන ගැනීම ඔවුන්ට වැදගත් වනු ඇත. 'අබ්දුල්-බහා තුමාගේ ස්ථානය ගැන සැන්වෙස් මහතා සහ එම මහත්මිය සමඟ කළ සංවාදයේදී, අලෙහන්ද්‍රාට ක්‍රමක්‍රමයෙන් ඇගේ මීළඟ සංචාරයේ තේමාව කුමක් විය යුතුද යන්න අවබෝධ විය. "මිනිසුන් එක්සත් කිරීම සඳහා ධර්මයේ අරමුණ ගැන ඔවුන්ට විශාල පැහැදිලිකමක් ඇත" යනුවෙන් ඇය සිතයි. "එබැවින්, අප දැන් ගවේෂණය කළ යුතු තේමාව වන්නේ ඒකාබද්ධ ප්‍රජාවක් ගොඩනගා පවත්වාගෙන යන්නේ කෙසේද යන්නයි."

අලෙහන්ද්‍රා සිය සිව්වන සංචාරය ආරම්භ කරන්නේ අසල්වැසි ප්‍රදේශයේ සාපේක්ෂව කුඩා මිතුරන් පිරිසක් විසින් දැනට කරගෙන යන ක්‍රියාකාරකම් විස්තර කිරීමෙනි. "අපේ සංඛ්‍යාව වැඩි වන විට," "අප සියලුදෙනාම උරදිය යුතු අභියෝගාත්මක වගකීම වන්නේ අපගේ වචනවලින්, අපගේ සිතුවිලිවලින් සහ අපගේ ක්‍රියාවලින් වඩ වඩාත් එක්සත් වීමයි, ඔබ එකඟ වන්නේ නම්, අද අපට එකට ඒකීයභාවයේ තේමාව ගවේෂණය කළ හැකිය," යනුවෙන් ඇය පැහැදිලි කරයි.

"අපේ ප්‍රජාවේ දියුණුවට ඒකීයභාවය කොතරම් වැදගත්ද කියා මට පේනවා," යනුවෙන් සැන්වෙස් මහත්මිය ප්‍රතිචාර දක්වයි.

"ඇත්තටම, අපගේ හදවත් මුලින්ම උන්වහන්සේගේ ඉගැන්වීම්වලට ආකර්ෂණය කළේ බහා'උ'ල්ලා තුමාගේ ඒකීයභාවයේ පණිවිඩයයි," යනුවෙන් සැන්වෙස් මහත්මිය මහතා පවසයි.

"මම අදහස් ගණනාවක් තෝරාගෙන ඇති අතර, ඒ සෑම එකක් සඳහාම උපුටා දැක්වීමක් සොයාගෙන ඇත, ඔබට ප්‍රශ්නයක් නැතිනම්, අපට ඒවා එකින් එක ගොස් සාකච්ඡා කළ හැකිය," යනුවෙන් අලෙහන්ද්‍රා පවසයි.

පහත දැක්වෙන්නේ අලෙහන්ද්‍රාගේ අදහස් ලැයිස්තුවකි:

- අපගේ ප්‍රජාව සැබවින්ම එක්සත් වීමට නම්, අප සෑම කෙනෙකුම ආරවුල් සහ කලහයන් වලින් වැළකී සිටිය යුතුය. බහා'උ'ල්ලා තුමා මෙසේ ප්‍රකාශ කරයි:

  **"මෙදවස දෙවියන්වහන්සේගේ ආදරණීයයන් අතර ඇතිවන ආරාවුල් සහ දබර කලහ මිත්‍රභේද හා නොසැලකිල්ල තරම් ධර්මයට හානි පැමිණවිය හැකි අන් කිසිවක් නැත. දෙවියන්වහන්සේගේ බලයෙන් හා උන්වහන්සේගේ ප්‍රබල ආධාරයෙන් ඒවායින් ඉවත්වී එක්සත් කරන්නාවුන්, සර්වඥවූත්, සර්වප්‍රාඥවූත් උන්වහන්සේගේ නාමයෙන් මිනිසුන්ගේ හදවත් එකට එකතු කිරීමට උත්සාහ ගන්න."**[12]

- අප ප්‍රජාවේ සෑම කෙනෙකු වෙනුවෙන්ම ආදරය තිබිය යුතුය, එය දෙවියන්වහන්සේට අපගේ වූ ප්‍රේමය පිළිබිඹු කරන ප්‍රේමයකි. අබ්දුල්-බහා තුමා මෙසේ පවසයි:

  **"සම්පූර්ණ ඒකීයභාවයෙන් යුක්ත වන්න. එකිනෙකා සමග කිසිවිටෙකත් කෝප නොවන්න ..... සියළුම ප්‍රාණීන්ට ඔවුන් වෙනුවෙන් නොව දෙවියන්වහන්සේ වෙනුවෙන් ප්‍රේම කරන්න. දෙවියන්වහන්සේ වෙනුවෙන් ඔවුන්ට ප්‍රේම කරන්නේ නම් ඔබ කිසි දිනක කෝපවන්නේ හෝ ඉවසිලි රහිත වන්නේ නැත. මනුෂ්‍ය වර්ගයා අංග සම්පූර්ණ නැත. සෑම මනුෂ්‍යයෙක් තුලම අසම්පූර්ණතාවයන් ඇති අතර මිනිසුන් දෙසම පමණක් බලන්නේ නම් ඔබ නිරන්තරයෙන්ම අසතුටින් සිටිනු ඇත. දෙවියන්වහන්සේගේ ලෝකය අංග සම්පූර්ණ හා පූර්ණ දයාවෙන් යුත් ලෝකය බැවින් ඔබ දෙවියන්වහන්සේ වෙත බැලූවහොත් ඔවුනට ආදරය හා කරුණාව දක්වනු ඇත."**[13]

- අපි එකිනෙකා කෙරෙහි දක්වන ආදරය සමඟම, අප අතර නොඉවසුම් ගතියක් ඇති වන්නේ නම්, අපි වහාම අබ්දුල්-බහා තුමාගේ මෙම උපදේශය සිහිපත් කළ යුතුයː

  **"ඔබ එකිනෙකා ඔබගේ හදවතේ ඇති සියලුම සිතුවිලි ප්‍රේමයත් ඒකීයභාවයත් කෙරෙහි යොමු කරන ලෙස මම අවවාද කරමි. යුද්ධය පිළිබඳ සිතිවිල්ලක් පහල වූ විට එයට වඩා ශක්තිමත් සාමය පිළිබඳ සිතිවිල්ලකින් එයට විරුද්ධ වන්න. වෛරය පිළිබඳ සිතුවිල්ලක් ඊට වඩා බලවත් ප්‍රේමය පිළිබඳ සිතුවිල්ලකින් විනාශකර දැමිය යුතුය. යුද්ධය පිළිබඳ සිතුවිලි නිසා සියළුම සමගිය, ශුභ සිද්ධිය, විවේකය, සන්තුෂ්ටිය යන මේවාට විනාශය ගෙන දේ.**

  **ප්‍රේමය පිළිබඳ සිතුවිලි නිසා සහෝදරත්වය, සාමය, මිත්‍රත්වය, හා ප්‍රීතිය වැනි ප්‍රයෝජනවත් දේ ලැබේ."[14]**

- ඒවා පාලනය කිරීමට සෑම උත්සාහයක්ම ගත් පසු, අපගේ ආශාවන් අපව අභිබවා ගොස් අන් අය සමඟ ගැටෙන බව අපට පෙනේ නම්, අපි බහා'උ'ල්ලා තුමාගේ මෙම වචන අපටම මතක් කර ගත යුතුයː

  **"ඔබලා අතර භේද උද්ගතවුවහොත් ඔබලාගේ මුහුණු ඉදිරියේ මා සිටගෙන සිටින්නේයයි සිතාගෙන, මාගේ නාමය වෙනුවෙනුත් මාගේ පැහැදිලි දීප්තිමත් ධර්මය කෙරෙහි ඇති ඔබගේ ආදරයේ සංකේතයක් වශයෙනුත් එකිනෙකාගේ වැරදි අමතක කර දමන්න."[15]**

- අන් අයගේ වැරදි නොසලකා හැරීම, ඔවුන්ගේ ප්‍රශංසනීය ගුණාංග කෙරෙහි අවධානය යොමු කිරීම සහ කේලාම් කීමෙන් සම්පූර්ණයෙන්ම වැළකී සිටීමේ අධ්‍යාත්මික හික්මීම අසමගියට එරෙහි වඩාත් ඵලදායී පියවරකි. අපි එකිනෙකාට ප්‍රේම කරන විට කේලාම් කීමට ඇති නැඹුරුව ජය ගැනීම පහසුය. අප ආදරය කරන අයගේ වැරදි නොදැකීමට අප නැඹුරු වන බවත් පාපයන් දෙස නොබලන ඇසකින් ඔවුන් දෙස බැලීමට අපහසු නොවන බවත් මතක තබා ගත යුතුය. අබ්දුල්-බහා තුමා මෙසේ පවසයිː

  **"අසම්පූර්ණ ඇස දකින්නේ අසම්පූර්ණත්වයන්ය. වැරදි දෙස නොබලන ඇස ආත්මයන්ගේ නිර්මාතෘවරයාණන් දෙස බලයි. උන්වහන්සේ ඔවුන් මැවූ සේක. ඔවුන් පුහුණුකර ඔවුනට අවශ්‍ය දේ සපයා දෙන සේක. ඔවුන් හැකියාවන්ගෙන් හා ජීවිතයෙනුත්, දර්ශනයෙන් හා ශ්‍රවණයෙනුත් යුක්ත කරන සේක. ඒ නිසා ඔවුන් උන්වහන්සේගේ මහිමයේ සංකේත වෙති. ඔබ සියලුදෙනාටම ආදරණීය හා කාරුණික විය යුතුයි, දුප්පතුන් රැකබලා ගතයුතුයි, දුබලයින් ආරක්ෂා කළ යුතුයි, රෝගීන් සුවපත් කළ යුතුයි, නූගතුන්ට අධ්‍යාපනයක් ලබාදී උගත් කළ යුතුයි."[16]**

  බහා'උ'ල්ලාතුමා මෙසේ පවසයිː

  **"එම්බා මාගේ සිංහාසනයේ සහායකය ! නපුරුදේ නොඅසන්න. නපුරු දේ නොබලන්න. ඔබම අවමානයට පත් නොවන්න. ඔබට නපුරුදේ කථාකරනු ඇසීමට නොහැකිවෙන පරිදි ඔබ අන් අයට නපුරුදේ කථා නොකරන්න. ඔබගේ වැරදි විශාල ලෙස නොපෙනෙන පරිදි අන් අයගේ වැරදි මහත්කොට කතා නොකරන්න. ඔබගේම අවමානය යටපත් කිරීම සඳහා අන් අයට අවමානය වේවායි නොපතන්න. එසේ නම්, නිදහස්ව සහ ප්‍රීතියෙන් යුක්තව මේ මියෙන සුළු ශරීරය හැරදමා ඒ ශුපත් පාරාදීසියට සම්ප්‍රාප්තව සදකාලික රාජධානියෙහි දිගටම රැඳී සිටිය හැකි වීම සඳහා ක්ෂණික මොහොතක් පමණ වූ ඔබගේ ජීවිතයේ ඉතිරි දවස් නොකැලැල් මනසින් නිමල හදවතින් පවිත්‍ර අදහසින් හා ශාන්ත වූ ස්වභාවයෙන් යුකත්ව ජීවත් වන්න."[17]**

  තවද උන්වහන්සේ අපට මෙසේ පවසයිː

**"විගාමිකයිනි! මා ගැන සඳහන් කිරීම සඳහා මා විසින් නිර්මාණය කරන ලද දිව, හෙළා දැකීමෙන් එය අපවිත්‍ර නොකර ගන්න. ස්වාර්ථයේ ගින්නෙන් ඔබව ආක්‍රමණයවී ඇත්නම්, මාගේ නිර්මාණයන්ගේ වැරදි නොව ඔබේම වැරදි මතක තබා ගන්න, මන්ද, ඔබ සෑම කෙනෙකුම අන් අයව හඳුනනවාට වඩා තමා තමන් ගැනම හොඳින් දන්නා බැවිනි."[18]**

- ඒකීයභාවය හුදෙක්ම දබර සහ භේද නැතිවීම පමණක් නොවේ, එසේම ප්‍රේමය ප්‍රකාශ කළ යුත්තේ වචන වලින් පමණක් නොවේ. අප බහායි සමාජය තුල සත්‍ය ඒකීයභාවය පවතින්නේයැයි අපට කිවහැක්කේ අප එකිනෙකා කෙරෙහි ඇති ආදරය සේවය බවට පරිවර්තනය කළහොත් පමණි. එසේම අපගේ ක්‍රියාකාරිත්වයන් සමූපකාරයේ සහ අන්‍යයෝන්‍යාධාරයේ ජීවයෙන් පාලනය වන්නේ නම් පමණි. අබ්දුල්-බහා තුමා අපෙන් ඉල්ලා සිටින්නේ:

**"ක්ෂණයකට වත් විවේකය නොගන්න, මොහොතකටවත් සැනසීම නොසොයන්න; ඒ වෙනුවට ඔබගේ මිතුරන් අතුරි එක් අයෙකුට හෝ කැප වූ සේවයක් කළ හැකිය වන පරිදි සහ එක් දීප්තිමත් හදවතකට සතුට හා ප්‍රීතිය ගෙන දීමට හැකිවන පරිදි හදවතින් සහ ආත්මයෙන්ම වෙහෙස මහන්සිවී වැඩකරන්න. මෙය සැබෑ ත්‍යාගය වන අතර එයින් 'අබ්දුල්-බහා තුමාගේ ගේ නළල් තලය ආලෝකමත් වේ. ඔබ මාගේ සහකරුවී ඒතුල ඇසුරු කරන්න."[19]**

තවද උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කරයි:

**"මනුෂ්‍ය වර්ගයාගේ පරම අවශ්‍යතාවය නම් සමූපකාරය හා අන්‍යෝන්‍යාධාරයයි. මිනිසුන් අතර සහෝදරත්වයේ සහ ඒකමතිකත්වයේ බැමි වඩා ශක්තිමත් වත්ම, මානුෂික ක්‍රියාකාරිත්වයන්ගේ සෑම තලයකම නිර්මාණාත්මක භාවයේ සහ නිපුණත්වයේ බලය වැඩිවනු ඇත."[20]**

- සාර්ථක සමාජ ක්‍රියාවලියක් සඳහා ඉතා වැදගත් අවශ්‍යතාවයක් නම් සෑම කරුණකදීම අවංකව හා ආදරයෙන් සාකච්ඡා කිරීමයි. සාකච්ඡාවේ මාර්ගයෙන් යම්කිසි කරුණක් දෙස අප එකිනෙකා බලන දෘෂ්ටි කෝණයන් එකට යොමු කිරීමෙන් අපගේ සාමුහික ක්‍රියා වලදී අප අනුගමනය කළ යුතු හොඳම මාර්ගය අනාවරණය කරගත හැක. සාකච්ඡාවේ මාර්ගයෙන්, අපගේ සිතුවිලි වලට එකමුතු භාවයක් ලැබෙන අතර, අපගේ සිතුවිලි හා අදහස් ඒකාග්‍රතාවයට පත්වීමෙන් අපගේ සමාජවල වර්ධනය සඳහා අවශ්‍ය නිර්මාණාත්මක සැලසුම් බිහිකරගත හැකිවේ. සාකච්ඡාවෙහි යෙදෙන්නන් පිළිබඳව අබ්දුල්-බහා තුමා මෙසේ ප්‍රකාශ කර තිබේ:

**"එක්ව උපදේශනය කරන අයගේ ප්‍රධාන අවශ්‍යතාව වන්නේ චේතනාවේ පවිත්‍රත්වය, ආත්මයේ ප්‍රභාව, දෙවියන්වහන්සේ හැර අන් සියල්ලෙන් වෙන්වීම, උන්වහන්සේගේ දිව්‍යමය සුගන්දයට ආකර්ෂණය වීම, උන්වහන්සේගේ ආදරණීයයන් අතර නිහතමානී භාවය සහ යටහත්පහත්කම, ඉවසීම සහ දුෂ්කරතා වලදී දිගු දුක් විඳීම සහ දසභාවයයි. උන්වහන්සේගේ උතුම් වූ එළිපත්තට වූ දසභාවයයි. මෙම ගුණාංග ලබා ගැනීමට ඔවුන් කාරුණිකව උපකාර කළහොත්, අදෘශ්‍යමාන බහාගේ රාජධානියේ ජයග්‍රහණයන් ඔවුනට සහතික වනු ඇත."[21]**

- එය ක්‍රියාවේ ඒකීයභාවයට බවට පරිවර්තනය නොකළහොත් සිතිවිලි ඒකීයත්වය ඉෂ්ට නොවේ. ඒකීයභාවයෙන් කටයුතු කරනවා යනුවෙන් අදහස් වන්නේ අප සැවොම එකම දේ කරන බව නොවෙයි. ඊට පටහැනිව, ඒකාබද්ධ ක්‍රියාවකදී ප්‍රජාවක සාමාජිකයින්ගේ විවිධ කුසලතා උපරිමයෙන් භාවිතා වේ. අපගේ බලතල වැඩි වන අතර, අපගේ සංඛ්‍යාව තවමත් කුඩා වන විට පවා, ලෝකයේ විශාලතම සහ බලවත් සංවිධානවලට ඉටු කරගත නොහැකි දේ පවා සාක්ෂාත් කර ගැනීමට අපට හැකි වේ. අබ්දුල්-බහා තුමා මෙසේ පවසයි:

**"සෑම විටම පවිත්‍රවූ ආත්මයන්, ස්වර්ගීය බලයන් උකහා ගන්නා විට, ආත්මයේ එවැනි ගුණාංග සමඟ නැගීසිටිනු ඇති අතර, පෙළක් මත පෙළක් සේ, එකඟත්වයෙන් ගමන් කරන, ඒවැනි සෑම**

**ආත්මයක්ම දහසකට තරම් සමාන වන අතර, ඒ මහා සාගරයේ නැඟී එන රළ, ඉහල දේව සමූහයාගේ බලඇණි මෙන් වන්නේය.”**[22]

ඔබ ඉහත කරුණු ප්‍රවේශමෙන් කියවා ඔබේ කණ්ඩායමේ සහභාගිවන්නන් සමඟ අන්තර්ගතය කරුණෙන් කරුණ ගෙන සාකච්ඡා කළ පසු, ඔබ පෙර කොටස් තුන සමඟ කළ පරිදි තේමාව ඉදිරිපත් කිරීමට එකිනෙකාට උපකාර කිරීමට ඔබට අවශ්‍ය වනු ඇත. ඔබගේ උත්සාහයට යම් උපකාරයක් පහත අභ්‍යාස වලින් ඔබට හමුවනු ඇත.

1. පහත වාක්‍ය සම්පූර්ණ කරන්නඃ

   අ. මෙදවස දෙවියන්වහන්සේගේ ආදරණීයයන් අතර ඇතිවන ....................................... සහ දබර, කලහ, මිත්‍රභේද හා නොසැලකිල්ල තරම් ධර්මයට හානි පැමිණවිය හැකි අන් කිසිවක් නැත.

   ආ. මෙදවස දෙවියන්වහන්සේගේ ආදරණීයයන් අතර ඇතිවන ආරාවුල් සහ ................................. කලහ, මිත්‍රභේද හා නොසැලකිල්ල තරම් ධර්මයට හානි පැමිණවිය හැකි අන් කිසිවක් නැත.

   ඇ. මෙදවස දෙවියන්වහන්සේගේ ආදරණීයයන් අතර ඇතිවන ආරාවුල් සහ දබර, කලහ, මිත්‍රභේද හා නොසැලකිල්ල තරම් ධර්මයට හානි පැමිණවිය හැකි .................................

   ඈ. මෙදවස දෙවියන්වහන්සේගේ ආදරණීයයන් අතර ඇතිවන ආරාවුල් සහ දබර, කලහ, මිත්‍රභේද හා .................................. තරම් ධර්මයට හානි පැමිණවිය හැකි අන් කිසිවක් නැත.

   ඉ. මෙදවස දෙවියන්වහන්සේගේ ආදරණීයයන් අතර ඇතිවන ආරාවුල් සහ දබර, ..............................., මිත්‍රභේද හා නොසැලකිල්ල තරම් ධර්මයට හානි පැමිණවිය හැකි අන් කිසිවක් නැත.

   ඊ. මෙදවස දෙවියන්වහන්සේගේ ආදරණීයයන් අතර ඇතිවන ආරාවුල් සහ දබර, කලහ, ................................. හා නොසැලකිල්ල තරම් ධර්මයට හානි පැමිණවිය හැකි අන් කිසිවක් නැත.

   උ. මෙදවස දෙවියන්වහන්සේගේ ආදරණීයයන් අතර ඇතිවන ආරාවුල් සහ දබර කලහ මිත්‍රභේද හා නොසැලකිල්ල තරම් ........................... හානි පැමිණවිය හැකි අන් කිසිවක් නැත.

2. දෙවන උපුටා දැක්වීමේදී, ‘අබ්දුල්-බහා තුමා අපට මෙසේ කියයිඃ

   අ. අප සම්පූර්ණ .................................. ජිවත් විය යුතුය.

   ආ. අප .......................................... සමග කිසිවිටෙකත් ............................ නොවිය යුතුයි.

ඈ. අප සියළුම ප්‍රාණීන්ට ඔවුන් වෙනුවෙන් නොව ........................................................ ප්‍රේම කරන්න.

ඈ. අප .................................................... ඔවුන්ට ප්‍රේම කරන්නේ නම් අප කිසි දිනක ....................................... හෝ ....................................... වන්නේ නැත.

ඉ. මනුෂ්‍ය වර්ගයා ...........................................

ඊ. අප ................................................................. බලන්නේ නම් අප නිරන්තරයෙන්ම ......................................

උ. අප ........................................වෙත බැලූවහොත් අප ඔවුනට ............................... හා ................................. දක්වනු ඇත.

3. තුන්වන උපුටා දැක්වීමේදී, 'අබ්දුල්-බහා තුමා අපට මෙසේ පවසයිඃ

අ. අප එකිනෙකා අපගේ හදවතේ ඇති සියලුම සිතුවිලි ........................................... සහ ................................................ කෙරෙහි යොමු කළ යුතුයි.

ආ. යුද්ධය පිළිබඳ සිතිවිල්ලක් පහල වූ විට ..................................................................... අප එයට විරුද්ධ විය යුතුයි.

ඇ. වෛරය පිළිබඳ සිතුවිල්ලක් ........................................................................ විනාශකර දැමිය යුතුය.

ඈ. යුද්ධය පිළිබඳ සිතුවිලි නිසා සියළුම ........................., .............................., ........................, සහ ................................ යන මේවාට විනාශය ගෙන දේ.

ඉ. ප්‍රේමය පිළිබඳ සිතුවිලි නිසා ................................, ................................, ................................, සහ .................................... වැනි ප්‍රයෝජනවත් දේ ලැබේ.

4. ඔබ සහ සමාජයේ අන් අය අතර මතභේද ඇති වන බව ඔබ දකින විට ඔබ කළ යුත්තේ කුමක්ද? ..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

5. ඔබේ ප්‍රජාව තුළ සමගිය සඳහා දයක වීමට ඔබට උපකාර වන අධ්‍යාත්මික විනය විස්තර කරන්නඃ ..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

6. පහත සඳහන් දේවලින් ඒකීයභාවයට දයක වන්නේ කුමක්ද?

.................... අන් අයගේ අඩුපාඩු දෙස බැලීම
.................... අන් අයගේ වැරදි නොසලකා හැරීම
.................... තවත් කෙනෙකුගේ අඩු පාඩු ගැන මිතුරෙකුට අදහස් දැක්වීම
.................... තවත් පුද්ගලයෙකු නරක ලෙස පෙනෙන පරිදි කථාවක් අතිශෝක්තියට නැංවීම හෝ වෙනස් කිරීම
.................... අන් අයගේ වැරදි ගැන සිතීම

7. සමහර අය වැරදි කරන විට අප විවේචනය කරන්නේ ඇයි, නමුත් ඒහා සමානම දේ අනෙක් අය කරන විට විවේචනය නොකරන්නේ ඇයි? ....................................................................................
............................................................................................................................................
............................................................................................................................................
............................................................................................................................................

8. එක් එක් පුද්ගලයා ගැන කේලාම් කියන තත්ත්වයක් තුළ ඒකීයභාවය ඇති කළ හැකිද? ඇයි එසේ කල නොහැක්කේ? ....................................................................................................
............................................................................................................................................
............................................................................................................................................
............................................................................................................................................
............................................................................................................................................

9. යමෙකු ගැන බොරු කීම පැහැදිලිවම වැරදිය. නමුත් කෙනෙක් ඇත්තටම කරපු දෙයක් ගැන අනිත් අයට විවේචනය කරන එක හරිද? ....................................................................................
............................................................................................................................................

10. කේලාම් කීම, ඕපාදූප කතා කිරීම සහ අන් අය විවේචනය කිරීම අතර වෙනස කුමක්ද?........
............................................................................................................................................
............................................................................................................................................
............................................................................................................................................
............................................................................................................................................

11. ඕපාදූප, කේලාම් කීම සහ නිරන්තර විවේචන ප්‍රජාවක් මත ඇති කරන බලපෑම් මොනවාද?.......
............................................................................................................................................
............................................................................................................................................
............................................................................................................................................
............................................................................................................................................

12. මෙම පුරුදු අපගේ ජීවිතයෙන් ඉවත් කරන්නේ කෙසේද? ..............................................................
....................................................................................................................................................
....................................................................................................................................................
....................................................................................................................................................

13. ඔවුන් සිටියාක් මෙන්, අප මිනිස්සු ගැන පමණක් කතා කළොත් සිදුවන්නේ කුමක්ද?...............
....................................................................................................................................................
....................................................................................................................................................
....................................................................................................................................................

14. අප ළමයින් ඉදිරියේ කේලාම් පවසනවා නම්, ඒය ඔවුන් මත කුමණ බලපෑමක් ඇති කරයිද?
....................................................................................................................................................
....................................................................................................................................................
....................................................................................................................................................

15. කේලාම් කීමේ සහ ඕපාදූප කීමේ නැඹුරුව පැමිණෙන්නේ කොහෙන්ද?..................................
....................................................................................................................................................
....................................................................................................................................................

16. බහා'උ'ල්ලා තුමා අපට අනුශාසනා කරන්නේ: ස්වාර්ථයේ ගින්නෙන් ඔබව ආක්‍රමණයවී ඇත්නම්, ........................................................ නොව ........................................................, මන්ද, ඔබ සෑම කෙනෙකුම ............................................. වඩා තමා ............................................ ........................................................................"

17. ආදරය වචන වලින් පමණක් ප්‍රකාශ නොවේ. එයට තවත් අවශ්‍ය වන්නේ කුමක්ද?.................
....................................................................................................................................................

18. ඒකීයභාවය සහා ආදරය සම්බන්ධයෙන්, 'අබ්දුල්-බහා තුමා අපෙන් ඉල්ලා සිටින්නේ: "ක්ෂණයකට වත් ......................................, මොහොතකටවත් ...................................... ...............................; ඒ වෙනුවට ඔබගේ මිතුරන් අතුරි එක් අයෙකුට හෝ .................................. කළ හැකිය වන පරිදි සහ ........................................................................ ගෙන දීමට හැකිවන පරිදි .......................... සහ ..............................................................".

19. තවද උන්වහන්සේ වැඩිදුරටත් මෙසේ ප්‍රකාශ කරයි: "මනුෂ්‍ය වර්ගයාගේ පරම අවශ්‍යතාවය නම් ........................................... හා ........................................... මිනිසුන් අතර ............................... සහ ............................................ බැමි වඩා ශක්තිමත් වත්ම, මානුෂික ක්‍රියාකාරිත්වයන්ගේ සෑම තලයකම ........................................... සහ ........................................ බලය වැඩිවනු ඇත."

20. සාර්ථක ප්‍රජා ක්‍රියාවක් සඳහා වැදගත්ම යතුර කුමක්ද? ..............................................................

..........................................................................................................................................

21. උපදෙශනය කරන අය ගැන අබ්දුල්-බහා තුමා මෙසේ පවසයි: "එක්ව උපදේශනය කරන අයගේ ප්‍රධාන අවශ්‍යතාව වන්නේ ........................................, ........................................, ........................................, ........................................, උන්වහන්සේගේ ආදරණීයයන් අතර ........................................................................, .............................. සහ දුෂ්කරතා වලදී ................................... සහ ................................... උන්වහන්සේගේ උතුම් වූ එළිපත්තට වූ දසභාවයයි. මෙම ගුණාංග ලබා ගැනීමට ඔවුන් කාරුණිකව උපකාර කළහොත්, අදෘශ්‍යමාන බහාගේ රාජධානියේ .................................. ඔවුනට ..........................................."

22. ඒකීයභාවයෙන් වැඩ කිරීමේ බලය ගැන අබ්දුල් බහා තුමා අපට මෙසේ කියයි: "සෑම විටම පවිත්‍රවූ ආත්මයන්, ........................................ උකහා ගන්නා විට, ........................................ සමඟ නැඟීසිටිනු ඇති අතර, පෙළක් මත පෙළක් සේ, ........................................ ගමන් කරන, ඒවැනි ................ ආත්මයක්ම .................................. තරම් සමාන වන අතර, ඒ මහා සාගරයේ නැඟී එන රළ, ........................................ ..................................... මෙන් වන්නේය."

**9 වන කොටස**

සැන්චෙස් මහතා සහ එම මහත්මිය සමඟ ඇයගේ සිව්වන සංචාරයේදී, අසල උසස් පාසලක අධ්‍යාපනය ලබමින් සිටියදී ඔවුන් සමඟ ජීවත් වීමට පැමිණි මිනිබිරියක වන බියට්‍රිස් හමුවීමට අලෙහන්ද්‍රා සතුටු විය. බියට්‍රිස් එකමුතුකමේ තේමාව ගැන ඉතා කුතුහලයෙන් සිටින අතර සාකච්ඡාවට උනන්දුවෙන් සහභාගී වේ. සංවාදය අවසන් වන විට, සැන්චෙස් මහත්මිය සෑම කෙනෙකුටම කෝපි සහ කේක් ගෙන එයි. මෙය අලෙහන්ද්‍රා හට බියට්‍රිස් වඩාත් හොඳින් දැන හඳුනා ගැනීමට අවස්ථාවක් ලබා දෙන අතර, අසල්වැසි ප්‍රජාව ගොඩනැගීමේ ප්‍රයත්නයන් ගැන කතා කිරීමට පසුද ඇයව හමුවීමට ඇය කටයුතු කරයි. "ඇය පාඨමාලා වල ප්‍රධාන අනුපිළිවෙල අධ්‍යනය කිරීමට උනන්දු වෙන් සිටිනවා විය හැකිය," "පළමු පොත් කිහිපය ස්ථාවර වේගයකින් කරගෙන යාමට මට ඇයට උදව් කළ හැකිය. එවිට ඇයට ළමා පන්තියක් ආරම්භ කිරීමට හෝ අසල්වැසි ප්‍රදේශයේ හැඩගැස්වෙමින් පවතින නව යෞවන කණ්ඩායමත් සමගින් මට සහාය වීමට අවශ්‍ය විය හැකිය. එවැනි අවස්ථාවක, ඇය 5 වන පොත දක්වා ඉදිරියට යන විට, ඇයට ක්‍රමයෙන් කණ්ඩායම සඳහා වැඩි වගකීමක් ගත හැකිය, එමඟින් ඇය සජීවිකාරකයෙකු ලෙස සේවය කිරීමට සූදානම් වනු ඇත." යනුවෙන් අලෙහන්ද්‍රා තමාටම සිතයි. අලෙහන්ද්‍රා තරුණයින් සඳහා වූ රැස්වීම් කිහිපයකට සහභාගී වී ඇති අතර, සමහර සාකච්ඡා කරණ ලද මාතෘකා කෙරෙහි අවධානය යොමු කිරීම මගින්, ආයතනික ක්‍රියාවලියට බොහෝ දෙනෙකුගේ සහභාගීත්වය ඇති කිරීමට හේතු වී තිබේ. ඊළඟ දවසේ බියට්‍රිස් සමඟ ඇයගේ සංවාදයේදී ඇය එම අදහස් අනුපිළිවෙල අනුගමනය කිරීමට තීරණය කරයි. සංවාදය විවෘත වන්නේ මෙලෙසිනි:

> අපි හැමෝම කැමතියි ලෝකය යහපත් තැනක් වෙනවා දකින්න. විශ්ව සාමය ස්ථාපිත කර මිනිස් පවුල සමගියෙන් ජීවත් වන අනාගතයක් දෙස අපි බලා සිටිමු. එවන් අනාගතයක් සිහිනයක් නොවන අතර එය ගොඩනගා ගත හැක්කේ අප වැඩි වැඩියෙන් ලෝකයේ අභිවෘද්ධිය සඳහා දායක වීමට උත්සාහ කරන විටය. අපගේ හදවතේ ගැඹුරේ අප සෑම කෙනෙකුම අපගේ ප්‍රජාවන් හට සේවය කිරීමට ආශාවක් ඇත. අපට අවශ්‍ය වන්නේ පොදු යහපත සඳහා පරාර්ථකාමී සේවා ක්‍රියා සිදු කිරීමට අපගේ හැකියාව වර්ධනය කර ගැනීමයි.

අපි එකට ගමන් කරන සේවා මාවතක් සිතින් මවා ගැනීමෙන් මනුෂ්‍යාත්වයට අප කරන සේවය ගැන අපට සිතිය හැකිය. මෙම මාර්ගය සැමට විවෘතයි. අපි සැම කෙනෙකුම එයට ඇතුළු වීමට තේරීමක් කරන අතර, අපි අපේම වේගයකින් එහි ඉදිරියට යමු. අපි මේ මාර්ගයේ ගමන් කරන්නේ තනිවම නොවේ; අපි අපේ මිතුරන් සමග එක්ව, එකට ඉගෙන ගනිමින් සහ එකිනෙකා සමග කැටුවයමින් සේවය කරමු. අප ගන්නා සැම පියවරක්ම ප්‍රීතිය සහ සහතිකය ජනනය කරන අතර, අප ගන්නා සැම උත්සාහයක්ම දිව්‍යමය තහවුරු කිරීම් ගෙන එයි.

බියට්‍රිස් ඇයට ඇසෙන දෙයට කැමති වන අතර, මෙම කෙටි ඉදිරිපත් කිරීමෙන් පසු සජීවී සංවාදයක් ඇති වේ. තවත් ඉදිරියට යාමට පෙර, අපි මෙහි විරාමයක් තබා නව මිතුරන් දෙදෙනා අතර අන්තර් ක්‍රියාකාරිත්වයේ ස්වභාවය ගැන මෙනෙහි කරමු. ආයතනයේ ක්‍රියාවලියට සහභාගී වන ලෙස බියට්‍රිස්ට ආරාධනා කිරීම සඳහා සාරවත් සංවාදයක නිරත වීමට අලෙහන්ද්‍රා තීරණය කර ඇත. ආයතනය මගින් පාඨමාලා මාලාවක් පිරිනමන බව බියට්‍රිස්ට පැවසීමත් ඒවාට සම්බන්ධ වන ලෙස ඇයට ආරාධනා කිරීමත් ඇයට ප්‍රමාණවත් නොවන්නේ මන්ද?

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

**10 වන කොටස**

අලෙහන්ද්‍රා සහ බියට්‍රිස් අතර සංවාදය පැය දෙකක පමණ කාලයක් පවතී. පහත දැක්වෙන්නේ අලෙහන්ද්‍රා ඇගේ නව මිතුරිය සමග බෙදා ගන්නා ලද අමතර අදහස් කිහිපයකි. ඇත්ත වශයෙන්ම, ඇය දිගු බාධාවකින් තොර ඉදිරිපත් කිරීමක් නොකරන බව අපට වැටහේ. පැය දෙකෙන් වැඩි කාලයක් මෙම ඡේදවල දක්වා ඇති අදහස් මත එකට සාකච්ඡා කිරීමට වැය කරයිඃ

අපි තරුණයි, අපට ශක්තියක් තියෙනවා, අපිට ලොකු උද්යෝගයක් තියෙනවා. මිනිස්සු සිතනවා අපි නොසැලකිලිමත් කියලා. නමුත් අප එයට ප්‍රතිවිරුද්ධයි; අපි මනුෂ්‍යාත්වයේ දුක්ඛිත තත්වය ගැන සැලකිලිමත් වන අතර සමාජයට සැබෑ වෙනසක් ගෙන එනු දැකීමට කැමැත්තෙමු. ඒ වගේම අපි අපේම ජීවිත - අධ්‍යාපනය, රැකියාව, මිතුරන්, පවුල - ගැනත් සිතිය යුතුයි. සැම වසරකම අපි වයසින් වැඩෙත්ම, අපි වැඩි වගකීම්වලට උර දෙනවාඃ අපේ දෙමාපියන් අපෙන් බොහෝ දේ බලාපොරොත්තු වෙනවා. සමහර වෙලාවට මගේ හැම වගකීමක් ගැනම හිතනකොට හිතට බරක් දැනෙනවා. එවිට මට මතකයට එනවා මම කටපාඩම් කළ බහායි ලේඛන වලින් වූ උපුටා ගැනීමක්ඃ "මිනිසාගේ ජීවිතයට එහි වසන්ත කාලය ඇති අතර එය පුදුමාකාර තේජසකින් සමන්විත වේ. යෞවන කාලය ශක්තියෙන් හා ජවයෙන් සංලක්ෂිත වන අතර එය මිනිස් ජීවිතයේ හොඳම කාලය ලෙස කැපී පෙනේ."

අප වැනි ප්‍රජාවන්හි ලොව පුරා සිටින බොහෝ යෞවනයන් තම ශක්තීන්, ඔවුන්ගේම බුද්ධිමය හා අධ්‍යාත්මික වර්ධනය භාර ගැනීමට සහ සමාජයේ පරිවර්තනයට දායක වීමට යන ද්විත්ව අරමුණකින් මෙහෙයවිය හැකි බව අවබෝධ කරගෙන සිටින බව මම ඔබ සමග බෙදා ගැනීමට කැමැත්තෙමු. අපගේ අරමුණෙහි මෙම පැති දෙක එකිනෙකට සම්බන්ධය. අප අපගේම හැකියාවන් වර්ධනය කර ගන්නා විට, අන් අයට සේවය කිරීම අපට වඩා හොඳින් කළ හැකි

වන අතර, එකිනෙකාට උපකාර කිරීමේදී, අපි පුද්ගලයන් ලෙස වර්ධනය වී අප සතු ගුණාංගද ශක්තිමත් කර ගනිමු.

මා කලින් සඳහන් කළ සේවා මාර්ගයක් පිළිබඳ අදහස එන්නේ මෙතැනදීය. එහි ගමන් කිරීම අපි අපගේ ජීවිතයට එකතු කරගන්නා දෙයක් නොව; එය අප කරන සෑම දෙයකටම අර්ථයක් ගෙන එයි. ප්‍රජාවට කරන සේවය අපගේ අධ්‍යාපනයේ අරමුණ වඩා හොඳින් අවබෝධ කර ගැනීමටත්, අනාගතය පිළිබඳ අපගේ සිතුවිලි පැහැදිලි කර ගැනීමටත්, අපගේ පවුල්වල යහපැවැත්මට දායක වීමට අවශ්‍ය ගුණාංග වර්ධනය කිරීමටත් උපකාරී වේ. එය අපගේ මිත්‍රත්වය ශක්තිමත් කරයි. එය අපව නොවැදගත් ලුහුබැඳීම් මත අපගේ ශක්තීන් නාස්ති කර හැරීමෙන් වළක්වයි.

අපගේ අධ්‍යාත්මික හා බුද්ධිමය වර්ධනය ගැන සිතීමේදී, අපට බලපෑම් කරන බොහෝ බලවේග පිළිබඳව අප දැනුවත් විය යුතුය. එවායෙන් සමහරක්, දැනුමේ, යුක්තියේ සහ ආදරයේ බලවේගයන් මෙන්, අපව නිවැරදි දිශාවට ගෙන යන අතර, අප එවා සමඟ පෙලගැසීමට ඉගෙන ගත යුතුය. අනෙකුත් එවා, භෞතිකවාදයේ සහ ආත්මාර්ථකාමීත්වයේ බලවේග මෙන්, ප්‍රතිවිරුද්ධ දෙය කරන අතර, අප ඒවාට විරුද්ධ විය යුතුය. අප විශිෂ්ටත්වය ළඟා කර ගැනීමට උත්සාහ කළ යුතු අතර අපගේ උත්සාහයන් දිව්‍යමය තහවුරු කිරීමකින් ආශීර්වාද කරනු ඇතැයි විශ්වාස කළ යුතුය.

ප්‍රචණ්ඩත්වය, දරිද්‍රතාවය සහ දුක්ඛිත ලෝකයක් සාමය, සෞභාග්‍යය සහ සහජීවනය ඇති ලෝකයක් බවට පරිවර්තනය කිරීමට - සමාජය පරිවර්තනය කිරීම සඳහා අපගේ දායකත්වය ගැන සිතීමේදී අපි භෞතිකමය හා අධ්‍යාත්මික ප්‍රගතිය යන දෙකම සලකා බැලිය යුතුය. අප අධ්‍යාත්මික දියුණුවක්ද ඇති නොකරන්නේ නම් සියලු මිනිසුන් හට භෞතික දියුණුව කරා ළඟා නොවනු ඇත. මේ දෙක එකට ගියොත් පමණක් ලෝකයේ අභිවෘද්ධිය සාක්ෂාත් වනු ඇත. මම කටපාඩම් කර ගැනීමට කැපකල තවත් උපුටා ගැනීමක් තිබේ: "භෞතික ශිෂ්ටාචාරය පහනට සමාන වන අතර අධ්‍යාත්මික ශිෂ්ටාචාරය එම පහනෙහි ආලෝකය වේ. භෞතිකමය සහ අධ්‍යාත්මික ශිෂ්ටාචාරයන් එකමුතු වන්නේ නම්, අපට ආලෝකය සහ පහන එකට ඇති අතර ප්‍රතිඵලය පරිපූර්ණ වනු ඇත."

අපි සේවයේ මාවතේ ගමන් කරන විට, දැනුම, කුසලතා සහ අධ්‍යාත්මික ගුණාංග ලබා ගැනීමට ඔවුනට උපකාර කරමින්, විශේෂයෙන්ම ළමුන් සහ නව යෞවන කණ්ඩායම් සමඟ වැඩ කිරීමට අප ඉගෙන ගනිමු. අපගේ ප්‍රජාවන්ගේ එකීයභාවය කෙරෙහි අවධානය යොමු කිරීමට ද අපි ඉගෙන ගනිමු. ප්‍රජාවක ප්‍රගතියට දායක වීමට කැමති පුද්ගලයන්, පවුල් සහ සංවිධාන සහයෝගයෙන් ක්‍රියා කළ යුතුය. ඔවුන් හවුල් දැක්මක් සහ අරමුණක් ගොඩනගා ගත යුතු අතර ගැටුමේ මාර්ග අත්හැරිය යුතුය.

එසේ නම්, තරුණ වියේදී අප අන් අය සමඟ සුහදව කටයුතු කිරීමේ පුරුදු වර්ධනය කර ගැනීම වැදගත්ය.: අප කරන කාර්යයේදී එකිනෙකා සමඟ කැටුවයමින්, එකිනෙකාගේ දායකත්වයන් පිළිගනිමින්, එකිනෙකා දිරිමත් කිරීම සහ සහයෝගය දක්වමින්, එකිනෙකාගේ ශක්තීන් දකිමින්, එකිනෙකාට ප්‍රයෝජනවත් උපදෙස් සොයමින් සහ ලබා දෙමින් සහ එකිනෙකාගේ ජයග්‍රහණ ගැන සතුටු වෙමින් අප මිතුරන් විය යුතුය. සේවා මාවතේ ගමන් කිරීමේදී, අප ක්‍රියා කළ යුතුය, අපගේ ක්‍රියාවන් ගැන මෙනෙහි කළ යුතුය, එසේම එක්ව උපදෙශනය හා අධ්‍යයනය කළ යුතුය.

පසුගිය දශක කිහිපය තුළ, ලෝකයේ සෑම රටකම ප්‍රායෝගිකව ඉතා සුවිශේෂී ආකාරයේ ඉගෙනුම් ආයතනයක් පිහිටුවීමට බහායි ප්‍රජාව සමත් වී ඇත. අප ඒ ආකාරයෙන හඳුන්වන, මෙම ආයතන, ප්‍රජාවට සේවය කිරීමට අපගේ හැකියාවන් ශක්තිමත් කරන පාඨමාලා පිරිනමයි. මෙම පාඨමාලා හැදෑරීමෙන්, අපි එක්ව සේවා මාවතේ ඉදිරියට යාමට අවශ්‍ය

අධ්‍යාත්මික අවබෝධය සහ ප්‍රායෝගික කුසලතා ලබා ගනිමු. අපි ඒවා හරහා ඉදිරියට යන විට, වඩ වඩාත් සංකීර්ණ සේවා ක්‍රියා සිදු කිරීමට අපගේ හැකියාව වර්ධනය වේ. මේ කාලය පුරාවටම, අපට වඩා අත්දැකීම් ඇති අය අප කැටුවයන අතර, කාලයත් සමඟම, අඩු අත්දැකීම් ඇති මිතුරන් සමඟ කැටුවයාමට ස්වභාවිකවම අප පැමිණෙමු. ආරම්භයේ සිටම, අපි සියල්ලෝම පුද්ගල සහ සමාජ පරිවර්තනයේ ප්‍රධාන චරිත වන අතර, අපගේම ඉගෙනීම සහ ප්‍රජාවට කරන සේවය සඳහා වගකීම ඉතා උනන්දුවෙන් භාර ගනිමු.

"ප්‍රධාන චරිතයක් වීම" යන්නෙන් අදහස් කරන්නේ කල්පනාකාරීව ක්‍රියා කිරීමටත්, අපගේ උත්සාහයන්හි නොපසුබට උත්සාහයටත්, සෑම පියවරකදීම දැනුම ලබා ගැනීමට සහ එවා යොදවා ගැනීමටත් කැමැත්ත තිබීමයි. ප්‍රධාන චරිතයක් යනු හුදු නිෂ්ක්‍රීය ප්‍රතිලාභ ලබන්නෙකු නොව ප්‍රගතියට ක්‍රියාකාරී දායකයෙකි. ප්‍රධාන චරිතයක් වීමට නම් නිර්මාණශීලී සහ විනයගරුක මුලපිරීමක් ක්‍රියාත්මක කිරීමට ඉගෙන ගත යුතුය. ආයතන පාඨමාලා අපට ප්‍රජාව ගොඩනැගීමේ ක්‍රියාවලියේ ප්‍රධාන චරිතයන් වීමට අපගේ හැකියාව වැඩි දියුණු කිරීමට උපකාරී වේ.

ඉහත ඡේදවල ඇති අදහස් ගැන අපි මොහොතක් සමාලෝචනය කළ යුතුයි. කොටස ආරම්භයේ සඳහන් කළ පරිදි, අලෙහන්ද්‍රා අදහස් එකින් එක ඉදිරිපත් නොකර ඒවා ගැන සිතීමට සහ සාකච්ඡාවට දායක වීමට බියට්‍රිස්ට ඕනෑ තරම් අවස්ථාව ඇති බවට වගබලා ගනී. ඔබේ කණ්ඩායම තුළ සෑම ඡේදයක්ම සාකච්ඡා කිරීමට ඔබට අවස්ථාවක් ලැබුණු පසු සහ ඔබම අදහස් හොඳින් ප්‍රකාශ කිරීමට ඉගෙන ගත් පසු - රූහී ආයතනයේ සමහර පාඨමාලා ගැන වචන කිහිපයක් බෙදාගැනීමෙන් සහ 1 වන පොත අධ්‍යයනයට සම්බන්ධ වන ලෙස බියට්‍රිස්ට ආරාධනා කිරීමේදී අලෙහන්ද්‍රා විශ්වාස කරන තරමට සංවාදය වර්ධනය වී තිබේද යන්න සලකා බැලීමට ඔබ කැමති වනවා ඇත. ඔබ ඇයගේ ස්ථානයේ සිටියා නම් ඔබ පවසන දේ පහත අවකාශයේ ලියා තැබිය හැකිද? 1 වන සහ 2 වන පොත් සහ ඔවුන් ඉල්ලා සිටින සේවා ක්‍රියාවන් ඔබ විස්තර කරන්නේ කෙසේද? පසුකාලීන පොත්වල - විශේෂයෙන් දරුවන්ගේ අධ්‍යාත්මික අධ්‍යාපනය සඳහා පන්ති වල ඉගැන්වීම සහ එහි සජීවිකාරකයෙකු ලෙස නව යෞවන කණ්ඩායමක් මෙහෙයවීම පිළිබඳ කෙටි සඳහනක් - බියට්‍රිස්ට අනාගතයේදී කළ හැකි සේවය පිළිබඳ දැක්මක් ලබා ගැනීමට උපකාර වනු නොඅනුමානය. 1 වන පොත අධ්‍යයනය කිරීමට බියට්‍රිස්ට ආරාධනා කිරීමේදී අලෙහන්ද්‍රාට එකතු කළ හැකි දේට සමානවම, මෙම සේවා ක්‍රියාවන් දෙක පිළිබඳව වාක්‍ය කිහිපයක් ලිවීමට ඔබේ කණ්ඩායමේ උපදේශකයාට ඔබට සහාය විය හැක.

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

## 11 වන කොටස

අලෙහන්ද්‍රා ඇගේ මීළඟ සංචාරය සැන්චෙස් නිවසට කිරීමට පෙර සති දෙකක් ගතවිය. එම කාලය තුළදී, බියට්‍රිස්ට තිවෘ ව්‍යාපාරයකට සහභාගී වීමටත්, පළමු පොතේ පළමු ඒකක දෙක සම්පූර්ණ කිරීමටත් හැකි විය. ඇය දැන් තුන්වන ඒකකය හරහා යන්නේ අසල්වැසි ප්‍රදේශයේ සතියකට දෙවරක් හමුවන මිතුරන් පස් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සමඟය. සැන්චෙස් පවුල සමඟ යාඥාවේ තේමාව ගැන කතා කිරීම සුදුසු යැයි අලෙහන්ද්‍රා සිතන අතර බියට්‍රිස්ගෙන් ඇයට උදව් කිරීමට කැමති දැයි අසයි. ඔබ 1 වන පොතේ දෙවන ඒකකය අධ්‍යයනය කර ඇත, එබැවින් සංචාරය අතරතුර අලෙහන්ද්‍රා සහ බියට්‍රිස් විසින් ආවරණය කරන ලද අන්තර්ගතය මෙහි සාරාංශ කිරීමට අවශ්‍ය නොවේ. ඒකකය සමාලෝචනය කිරීමෙන් පසු, මෙම තේමාව වටා ඇති සාකච්ඡාවකදී ඔබ ආමන්ත්‍රණය කිරීමට උත්සාහ කරන ප්‍රධාන කරුණු සැකසීමට ඔබට හැකි විය යුතුය. පහතින් ඔබට ඔබේ අදහස් ලිවීමට ඉඩ ඇත.

.............................................................................................................................................

.............................................................................................................................................

**12 වන කොටස**

සැන්වෙස් පවුල වෙත අලෙහන්ද්‍රා ගේ සංචාර ඉදිරි සති කිහිපය තුළ දිගටම පවතින අතර, යාච්ඤාවේ වැදගත්කම පිළිබඳ ඔවුන්ගේ සාකච්ඡාවලින් අනතුරුව - ආත්මයේ ජීවිතය, අධ්‍යාත්මික ගුණාංග වර්ධනය කිරීම, දෙවියන්වහන්සේගේ නීති සහ අණපනත්වලට කීකරු වීම සහ උන්වහන්සේගේ ප්‍රේමයේ ස්ථිරසාර භාවය යන ස්වභාවිකව ගලා එන තේමා කිහිපයක් සාකච්ඡා කිරීමට ඔවුන්ට අවස්ථාවක් ලැබුනි. එක් අවස්ථාවක, ඔවුන් පරිපාලන නියෝගයේ ආයතන ගැන, විශේෂයෙන් ප්‍රාදේශීය සහ ජාතික අධ්‍යාත්මික සභාවන් ගැනද ටිකක් කතාබහ කරයි. මෙම එක් එක් පසු සංචාරයකදී ආවරණය කරන ලද අන්තර්ගතය අප සලකා බැලිය යුතු නැත. කෙසේ වෙතත්, අප සිතන ආකාරයට, සංවාද මාලාවක සහභාගිවන්නන් අතර බෝහෝ විට පැන නගින ප්‍රශ්න දෙකක් තිබේ. පළමුවැන්න ප්‍රජාව විසින් පවත්වනු ලබන රැස්වීම්වල ස්වභාවය සමඟ සම්බන්ධ වන අතර දෙවැන්න මූල්‍ය සම්පත් සමඟ සම්බන්ධ වේ. අපි මෙම කොටසේදී රැස්වීම් පිළිබඳ විෂය, විශේෂයෙන් එකුන්විසිදින උත්සවය, සහ මීළඟ කොටසෙන් මූල්‍ය ප්‍රශ්නය දෙස බලමු.

- එසේ නම්, එකුන්විසිදින උත්සවයේ තේමාව පිළිබඳ සංවාදයක් සඳහා පහත කරුණු පදනම් විය හැකියඃ බහායි ප්‍රජාව තුළ, - යාඥ කිරීමට, අධ්‍යයනය කිරීමට, විශේෂ අවස්ථා සැමරීමට, ප්‍රජා කටයුතු සහ සමාජයට කරන සේවය පිළිබඳ උපදේශනයට, ක්‍රියාකාරී සැලසුම් සාකච්ඡා කිරීමට යන විවිධ අරමුණු සඳහා රැස්වීම් පවත්වනු ලැබේ. බහා'උ'ල්ලා තුමා පහත පොරොන්දුව ලබාදෙයිඃ

  **"මාගේ ජීවිතය සහ මාගේ ධර්මය පා ! දෙවියන්වහන්සේගේ මිත්‍රයින් ඇතුළුවී ස්වාමීන් වහන්සේට ප්‍රශංසා කර උත්කර්ෂයට පත් කරන්නා වූ කාහල නාදය නැගළුන කිසියම් පදිංචි ස්ථානයක් වේද, සත්‍ය බැතිමතුන්ගේ ආත්ම සහ සියලුම හිතවත් දේවදූතයින් ඒ වටා සැරිසරණු ඇත."**[23]

- මිතුරන් අතර රැස්වීම්වලදී දෙවියන්වහන්සේගේ වචනයට සවන් දීම හදවත්වලට ප්‍රීතිය ගෙන දෙන අතර සමගියේ බැඳීම් ශක්තිමත් කරයි. බහා'උ'ල්ලා තුමා අපට මෙසේ අනුශාසනා කරයිඃ

  **"කවර රටක වුවද සිටින මිත්‍රයින් රැස්වීම් වලදී එකට එකතු වී ඥනවන්තව හා චතුර ලෙස කථා කිරීමත්, දෙවියන්වහන්සේගේ පද්‍යයන් කීමත් අවශ්‍යය, ප්‍රේමයේ ගිනි දල්වා එය ආලෝකමත් කරන්නේ දෙවියන්වහන්සේගේ වචන වලින් බැවිනි."**[24]

  අබ්දුල් බහා තුමා මෙසේ ලියයිඃ

  **"ඒ රට සත්‍යතාවයේ ආලෝකයෙන් ආලෝකමත් වී, ඒ දේශය ශුද්ධාත්මයේ ශක්තියෙන් සත්‍ය පාරාදීසයක් වන පරිදි රැස්වීම් පවත්වා දිව්‍යමය ඉගැන්වීම් කියවා ගායනා කරන්න. මේ කාලචක්‍රය මහානුභා සම්පන්න ස්වාමීන් වහන්සේගේ කාලචක්‍රය බැවින් හා මනුෂ්‍ය වර්ගයාගේ ලෝකයෙන් ඒකීයභාවයේ හා ඒකමතිකත්වයේ කාලය පෙර අපර දෙදිගම කන්වලට ඇසිය යුතු බැවින්."**[25]

- සියලුම බහායි රැස්වීම් අතරින් එකුන්විසිදින උත්සවය විශේෂයෙන් සඳහන් කළ යුතුය. බහායි දින දර්ශනය දින දහනවයේ මාස දහනවයකින් සමන්විත වන අතර, සෑම ප්‍රදේශයකම, බහායිවරුන් මසකට වරක් මෙම රැස්වීම සඳහා එක්රැස් වන්නේ බහා'උ'ල්ලා තුමා විසින්ම නියම කරන ලද පරිදියඃ

**"ඇත්ත වශයෙන්ම, භෞතික හා ස්වර්ගීය යන මාර්ග දෙකින්ම හෝ හදවත් එකට බැඳ තැබීම දෙවියන්වහන්සේගේ කැමැත්ත බැවින්, මසකට වරක් වතුරෙන් පමණක් සංග්‍රහ කිරීමෙන්වත් උත්සවයක් පවත්වන ලෙස ඔබට නියම කර තිබේ."[26]**

- එකුන්විසිදින උත්සවය කොටස් තුනකින් සමන්විත වේ. පළමුවැන්න අධ්‍යාත්මික කොටස වන අතර, එම කාලය තුළ යාඥාවන් කියවන අතර ශුද්ධවූ ලේඛනවල කොටස් කියවනු ලැබේ. දෙවැන්න පරිපාලන කොටස වන අතර, එම කාලය තුළ ප්‍රජාවගේ කටයුතු පිළිබඳ උපදේශනය සිදු වේ. තුන්වැන්න සමාජ කොටසයි.

- එකුන්විසිදින උත්සවයේ අධ්‍යාත්මික කොටසෙහි වැදගත්කම පිළිබඳ 'අබ්දුල්-බහා තුමාගේ පහත වදන්වලින් අපට ක්ෂණික දර්ශනයක් ලැබේ.

  **"පෞරාණික අලංකාරයේ හිතවත් සේවකයිනි සෑම කාල චක්‍රයකම හා ශාසනයකම, භෝජන සංග්‍රහය ඉතා ප්‍රිය මනාප දෙයක්වූ අතර දෙවින්වහන්සේගේ ආදරණීයයන් උදෙසා කෑම මේසයක් පිළියෙල කිරීම ප්‍රශංසා කටයුතු ක්‍රියාවක් ලෙස සලකා තිබේ. මෙය මෙදවස සඳහා, අසමානවූ මේ ශාසනයේදී, මේ ඉතාම පරිත්‍යාගශීලි යුගයේදී, විශේෂයෙන් වැදගත් ලෙස ගණන් ගැනෙන්නේ ඇත්ත වශයෙන්ම දෙවියන්වහන්සේට වැඳුම් පිදුම් කිරීම සහ ගෞරව කිරීම සඳහා පවත්වන රැස්වීම් අතර වේ. මෙහිදී දිව්‍යමය ස්තෝත්‍ර හා ප්‍රශංසාවන් ගැයෙන අතර හදවත් උනන්දුවී ප්‍රීතියෙන් ඉපිල යති."[27]**

- උත්සවයේ පරිපාලන කොටස අතරතුර, රැස්ව සිටින මිතුරන් ආසන්නයේ සහ දුර බැහැර බහායි ප්‍රජාවන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවන් වලට ඇහුන්කම් දෙති, ඔවුන්ගේම ප්‍රජාව තුළ ධර්මයේ කටයුතු සහ සමාජයේ යහපැවැත්ම සඳහා ඔවුන්ගේ දායකත්වය පිළිබඳව උපදේශනය කරති, විශ්ව අධිකරණ මණ්ඩලයෙන් ලැබෙන මගපෙන්වීම් ගැන හුරුපුරුදු වෙති, ඔවුන්ගේ සැලසුම්වල ප්‍රගතියද සමාලෝචනය කරන අතර, ධර්මයේ ආයතන වෙත යෝජනාද ඉදිරිපත් කරයි. එකුන්විසිදින උත්සවයේ උපදේශනය ඉතා වැදගත් වේ, මන්ද, මේ හරහා සෑම පුද්ගලයෙකුටම ලොව පුරා බහායි ප්‍රජාවේ කටයුතුවලට සහභාගී වීමට හැකි වේ.

- උත්සවයේ සමාජ කොටස සම්බන්ධයෙන් ගත් කල, මෙය සහෝදරත්වය සහ ආගන්තුක සත්කාරය සඳහා කාලයයි. සංගීතය වාදනය කළ හැකිය, උද්ගාමකවූ කතාවන් පැවැත්විය හැකි අතර, ළමයින්ගේ ඉදිරිපත් කිරීම්ද සිදුකල හැක. කෙටියෙන් කිවහොත්, ප්‍රවේශමෙන් තෝරාගත් ගෞරවනීය හා ප්‍රීතිමත් සංස්කෘතියේ ප්‍රකාශනද, උත්සවයේ මෙම කොටස පොහොසත් කිරීමට භාවිතා කළ හැකිය.

- එකුන්විසිදින උත්සවය ධර්මයේ පරිපාලන නියෝගයේ සැලකිය යුතු ලක්ෂණයකි. එය ප්‍රජා ජීවිතයේ අධ්‍යාත්මික, පරිපාලනමය සහ සමාජීය අංගයන් එකට ගෙන එයි. උත්සවයේ සාර්ථකත්වය රඳා පවතින්නේ මෙම සංරචක තුන අතර නිවැරදි සමතුලිතතාවය මත බැවින්, මෙම සියලු අංගයන් එක හා සමානව අවධාරණය කළ යුතුය. 1989 අගෝස්තු මාසයේදී ලියා ඇති පණිවිඩයක විශ්ව අධිකරණ මණ්ඩලය මෙසේ සඳහන් කරයි:

  **"බහා'උ'ල්ලා තුමාගේ ලෝක ක්‍රමය මානව සමාජයේ සියලුම ඒකක ආවරණය කරයි; ජීවිතයේ අධ්‍යාත්මික, පරිපාලන හා සමාජ ක්‍රියාවලීන් ඒකාබද්ධ කරන අතර, නව ශිෂ්ටාචාරයක් ගොඩනැගීම සඳහා මානව ප්‍රකාශනය එහි විවිධ ස්වරූපවලින් යොමු කරවයි. එකුන්විසිදින උත්සවය සමාජයේ එම පදනම මත මෙම සියලු අංගයන් වැලඳගනී. ගමේ, සුළු නගරයේ, නගරයේ ක්‍රියාත්මක වන එය බහාගේ සියලුම ජනතාව සාමාජිකත්වය දරන ආයතනයකි. එය ඒකීයභාවය ප්‍රවර්ධනය කිරීම, ප්‍රගතිය සහතික කිරීම සහ ප්‍රීතිය පෝෂණය කිරීම අරමුණු කර ගෙන ඇත."[28]**

- එකුන්විසිදින උත්සවය වැනි එවැනි වැදගත් සිදුවීමක් කඩිමුඩියේ එකට එකතු කළ නොහැකිය. යාච්ඤාව සහ සමාලෝචනය තුළින්, සෑම පුද්ගලයෙකුම ඔහුගේ හෝ ඇයගේ උත්සවය සඳහා අධ්‍යාත්මිකව සූදනම් වියයුතු අතර, උත්සවය අතරතුර, අධ්‍යාත්මික කොටසේදී කියවීම සිදුකරන්නේද නැතහොත් හුදෙක් කියවන ඡේදවලට සවන් දීම සිදු කරන්නේද, වාර්තා ලබා දීම, මාර්ගෝපදේශ ලබා ගැනීම හෝ යෝජනා කිරීම හෝ වේවා; සත්කාරකයා ලෙස ක්‍රියා කරන්නේද නැතහොත් ඔහුගේ හෝ ඇයගේ ආගන්තුක සත්කාරයට ප්‍රීතියෙන් හා දීප්තියෙන් යුතුව සහභාගි වන්නේද සෑම කෙනෙකුම හදවතින් සහ මනසින් සහභාගී විය යුතුය. එකුන්විසිදින උත්සවය පිළිබඳව එම ලිපියේම විශ්ව අධිකරණ මණ්ඩලය මෙසේ සඳහන් කරයි.

  **"එකුන්විසිදින උත්සවයට සූදනම් වීමේ වැදගත් අංශ අතර කියවීම සඳහා සුදුසු ඡේද තෝරා ගැනීම, කල්තබා ඒවා හොඳින් කියවිය හැකි අය තෝරා ගැනීම සහ අධ්‍යාත්මික කොටස ඉදිරිපත් කිරීමේදී මෙන්ම පිළිගැනීමේදීද හොඳ විනයක් පවත්වා ගැනීම යන මේවාද අඩංගු වේ. ගොඩනැගිල්ලක් තුල වේවා එලිමහනේ වේවා රැස්වීම පවත්වන පරිසරය ගැන සැලකිලිමත් වීමෙන් එයින් ලැබෙන අත්දැකීමට බලපෑමක් ඇතිවේ. පවිත්‍රතාවය, ස්ථානය ඉඩකඩ ඇති අන්දමින් හා ලස්සනට පිළියෙල කිරීම ආදී මේ සියල්ලම වැදගත් කොටසක් ඉටු කරයි. කලට වේලාවට වැඩ කිරීමද හොඳින් සූදනම් වීමේ වැදගත් අංගයකි.**

  **"බොහෝ දුරට උත්සවයේ සාර්ථකත්වය රඳපවත්නේ සූදනම් කිරීමේ තත්වය හා පුද්ගලයාගේ සහභාගිත්වය මතය. ආදරණීය ගුරුතුමා පහත සඳහන් උපදේශය පිරිනමා තිබේ. මේ අවස්ථා වලදී ස්වාමීන් වහන්සේගේ ආදරණීයයන්ට සහ සානුකම්පිතයාණන්ගේ සේවිකාවන්ට රාජධානිය දෙසට තම මුහුණ යොමා, යාඥා කර, දෙවියන්වහන්සේගේ ආධාර අයැද, එකිනෙකා කෙරෙහි ආදරයෙන් හා ප්‍රීතියෙන් යුකත්ව පවිත්‍රත්වයෙන් හා ශුද්ධත්වයෙනුත්, දෙවියන්වහන්සේ කෙරෙහි ඇති බිය අතිනුත්, හැඟීම් වලට හා ආත්මාර්ථයට යටත් නොවීම අතිනුත් වර්ධනය වීමට හැකිවන පරිදි එකුන්විසිදින උත්සවය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්විය යුතුය. මේ අන්දමින් ඔවුන් මේ භෞතික ලෝකයෙන් වෙන්වී ආත්මීය ප්‍රේමයෙහි නිමග්න වනු ඇත."[29]**

සෑම විටම මෙන්, ඔබ ඉහත අදහස් කිහිප වතාවක් කියවා ඒවා ඔබේ කණ්ඩායම තුළ සාකච්ඡා කළ යුතුය, එවිට ඔබට ඒවා පහසුවෙන් පැවසීමට ඉගෙනගත හැක. එකුන්විසිදින උත්සවයේ වැදගත්කම පිළිබඳ වැඩිදුර අවබෝධයක් ලබා ගැනීමට පහත අභ්‍යාස ඔබට උපකාරී වනු ඇත.

1. ස්වාමීන් වහන්සේට ප්‍රශංසා කිරීමට සහ මහිමයට පත් කිරීමට අප එක්රැස් වන සෑම වාසස්ථානයකම විදහා දක්වනු ඇතැයි බහා'උ'ල්ලා තුමා අපට සහතික කරන්නේ කුමක් ද?
   ..........................................................................................................................................
   ..........................................................................................................................................

2. ඉහත දෙවන උපුටා දැක්වීමේදී, බහා'උ'ල්ලා තුමා අපට පවසන්නේ, අපි රැස්වීම්වලට එක්වන විට, අප ................................ හා ................................ ලෙස කථා කිරීමත්, ................................ ................................ අවශ්‍යය, ................................................ එය ................................ කරන්නේ දෙවියන්වහන්සේගේ වචන වලින් බැවිනි.

3. ඉහත තුන්වන උපුටා දැක්වීමේදී, 'අබ්දුල්-බහා තුමා අපට රැස්වීම් පවත්වමින්

   - අප ජීවත් වන රට ...................................................................................... විය හැකිවන පරිදි
   - අප දේශය ...................................................................................................... බවට පත්විය හැකි වන පරිදි

   ස්වර්ගීය ඉගැන්වීම් කියවා ගායනා කරන ලෙස උපදෙස් දෙයි.

4. බහායි දින දර්ශනයේ මාස කීයක් තිබේද? ..............................................................................................

5. සෑම මාසයකම දින කීයක් තිබේද? ..........................................................................................................

6. මසකට වරක් බහායිවරුන් අතර සිදුවන විශේෂ රැස්වීම කුමක්ද? .................................................
..........................................................................................................................................................

7. එකුන්විසිදින උත්සවයේ කොටස් තුන කුමක්ද? ................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

8. එකුන්විසිදින උත්සවයේ කොටස් කිසියම් අනුපිළිවෙලකට සිදු කරන්නේද?...............................

9. උත්සවයේ අධ්‍යාත්මික කොටසෙහි අරමුණ කුමක්ද?.................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

10. උත්සවයේ පරිපාලන කොටසෙහි අරමුණ කුමක්ද? ?...........................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

11. උත්සවයේ සමාජ කොටසෙහි අරමුණ කුමක්ද?.........................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

12. උත්සවයේ පරිපාලන කොටසේදී සාකච්ඡා කිරීම යෝග්‍ය වන්නේ පහත සඳහන් මාතෘකාවලින් කවරක් ද?

............. ප්‍රජාව බාරගත් කටයුතු වල මූල්‍ය අවශ්‍යතා
............. ජාතික පාපන්දු කණ්ඩායමේ ලකුණු
............. සමාජයේ සාමාජිකයන් දෙදෙනෙකු අතර මතභේදයක් විසඳන්නේ කෙසේද යන්න
............. ප්‍රජාව තුළ බහායි ළමා පන්තිවල ප්‍රගතිය
............. ප්‍රජාවේ එක් සාමාජිකයෙක් සතියේ මුල අධ්‍යයනය කරමින් සිටි ලේඛනවල ඡේදයක තේරුම
............. ප්‍රජාව තුළ වූ නව යෞවන වැඩසටහන් වල ප්‍රබෝධය
............. තරුණ තරුණියන්ට දේශීය රැකියා අවස්ථා විවෘත වීම සම්බන්දව

............. සේවා ව්‍යාපෘති සංකීර්ණ වී ඇති නව යෞවන කණ්ඩායම් සඳහා ප්‍රජාවට ලබා දිය හැකි සහයෝගය

............. ආයතනය විසින් ප්‍රවර්ධනය කරන ලද අධ්‍යාපනික වැඩසටහන් වල ළමුන්ගේ සහ නව යෞවනයින්ගේ දෙමාපියන් වෙත සංචාරය කිරීම

............. ප්‍රජාවගේ අධ්‍යාත්මක් චරිත ස්වභාවය ශක්තිමත් කිරීම

............. රූපවාහිනියේ විකාශය වන වැඩසටහන්වල කාලසටහන

............. අධ්‍යයන කවයන් තුළ ප්‍රීතිමත් සහ විනයගරුක වාතාවරණයක් ඇති කිරීම පිළිබඳව ලබාගෙන ඇති අවබෝධය

............. එළඹෙන ශුද්ධවූ දින සැමරුම

............. ප්‍රජාව ගොඩනැගීමේ ක්‍රියාවලියෙන් පැන නගින සමාජ ක්‍රියාකාරකම්වල මූලපිරීම්

13. ඔබේ කණ්ඩායම සමඟ පහත ප්‍රශ්නය සාකච්ඡා කරන්නඃ උත්සවයේ කොටස් තුන අතර සමබරතාවය එතරම් වැදගත් වන්නේ ඇයි?

14. දැන් පහත ප්‍රශ්න දෙක සාකච්ඡා කරන්න.

අ. ඔබ එය සත්කාරකත්වය දරන්නේ නම්, ඔබ උත්සවය සඳහා සූදනම් වන්නේ කෙසේද?

ආ. ඔබ උත්සවයට සහභාගී වන්නේ නම් පමණක් ඔබ එයට සූදනම් වන්නේ කෙසේද?

## 13 වන කොටස

ධර්මය පිළිබඳ සංවාදයන්හිදී බොහෝ විට පැන නගින දෙවන ප්‍රශ්නය වන්නේ බහායි ප්‍රජාව තම මූල්‍ය අවශ්‍යතා සපුරා ගන්නේ කෙසේද යන්නයි. එවැනි විමසුම්වලට ප්‍රතිචාර දැක්වීමට ඔබට උපකාර විය හැකි කරුණු කිහිපයක් මෙන්නඃ

- බහායි ප්‍රජාව තම භෞතිකමය අවශ්‍යතා සපුරාලීම සඳහා භාවිතා කරන මෙවලම වන්නේ බහායි අරමුදලයි. එය විවිධ - එනම් දේශීය, ජාතික, මහාද්වීපික සහ ජාත්‍යන්තර මට්ටම්වල ධර්මයේ ආයතන විසින් පරිපාලනය කරනු ලැබේ. බහායිවරුන් විශ්වාස කරන්නේ ඔවුන්ගේ ධර්මය ප්‍රවර්ධනය කිරීම සඳහා දරන ප්‍රයත්නවල වියදම් තමන් විසින්ම දැරිය යුතු බවයි, එබැවින් අරමුදලට දයකත්වය ලැබෙන්නේ ප්‍රජාවේ සාමාජිකයින්ගෙන් පමණි.

- අරමුදලට දයක වීම ස්වේච්ඡා ක්‍රියාවකි. එය පුද්ගලයා සහ ධර්මයේ ආයතන අතර වූ කාරණයක් යන අර්ථයෙන් රහසිගතය; දයකයින්ගේ නම් සහ ලබා දී ඇති මුදල ප්‍රකාශයට පත් නොකෙරේ. දයක වීමට ප්‍රජාවේ සාමාජිකයින්ට කිසිදු බලපෑමක් සිදු නොවේ. ආයතන ප්‍රජාවට සාමාන්‍ය පරිත්‍යාග සඳහා ආයාචනා කරයි, අරමුදලේ වැදගත්කම මතක් කර, එහි අවශ්‍යතා පෙන්වා දෙයි. කලාතුරකින් සිදුවන්නක් ලෙස නොව, ප්‍රජාවක් තමන් වෙනුවෙන් දයක ඉලක්කයක් සකසනු ඇත. නමුත් පුද්ගලයන් සඳහා මුදලක් කිසිවිටෙක නියම කර නැති අතර මුදල් ඉල්ලා නොසිටිනු ඇත. ඊට අදළ මූලධර්ම පිළිබඳ ඔහුගේ හෝ ඇයගේ අවබෝධය අනුව, කොපමණ දයක විය යුතුද යන්න තීරණය කිරීම එක් එක් පුද්ගලයාට පැවරේ.

- අප ගොඩනගන්නට උත්සාහ කරන ශිෂ්ටාචාරය භෞතික වශයෙන් මෙන්ම ආධ්‍යාත්මික වශයෙන්ද සමෘද්ධිමත් එකක් වනු ඇත. ධනය පිළිගත හැක්කේ යම් කොන්දේසි සපුරා ඇත්නම් පමණි. අපි එය ලබා ගත යුත්තේ අවංක ක්‍රියාවලිනි. අපි එය මනුෂ්‍යත්වයේ යහපත සඳහා

වියදම් කළ යුතුයි. එමෙන්ම සමස්ත ප්‍රජාවම නගා සිටුවිය යුතුය. බහුතරයකට ජීවිතයේ අත්‍යවශ්‍ය දෑ හිඟව තිබියදී කිහිප දෙනෙකුට අතිශයින් ධනවත් වීම අනුමත කළ නොහැක. බහා'උ'ල්ලා තුමා අපට මෙසේ කියයිː

**"මිනිසුන්ගෙන් හොඳම අය වන්නේ, ඔවුන්ගේ කැදවීමෙන් ජීවනෝපායක් උපයාගෙන, සියලු ලෝකයන්හී ස්වාමීන් වන දෙවියන්වහන්සේට වූ ආදරය සඳහා තමන් සහ තම ඥාතීන් වෙනුවෙන් වියදම් කරන අයයි.""**[30]

**". . . ඔබටත් අන් අයටත් ප්‍රයෝජන ලැබෙනු පිණිස ඔබ යහපත් හා ආශ්චර්යමත් ඵලයන් දිය යුතු ය. එබැවින් ශිල්ප හා වෘත්තීන්හි නියැලීම සැම කෙනෙකුටම පැවරී ඇත, මන්දයත් අවබෝධය ඇති පුරුෂයෙනි, ධනයේ රහස එහි සැඟව ඇත."**[31]

තවද 'අබ්දුල් බහා තුමා මෙසේ පැහැදිලි කරයිː

**"මුළු ජනගහනයම ධනවත් නම් ධනය ඉතාමත් ප්‍රශංසනීයයි. කෙසේ වෙතත්, කිහිප දෙනෙකුට අප්‍රමාණ ධනය ඇති අතර අනෙක් අය දුප්පත්ව සිටී නම් සහ එම ධනයෙන් කිසිදු ඵලයක් හෝ ප්‍රතිලාභයක් නොලැබෙන්නේ නම්, එය එහි හිමිකරුට වගකීමක් පමණි."**[32]

- අයුක්තියෙන් හා දුක්ඛිතභාවයෙන් තොර සමාජයක් ගොඩනැගීමට නම් අප සැවොම පරිත්‍යාගශීලී සහ දීම කල යුතුය. අපගේ මූල්‍ය සම්පත් අල්ප වුවද, මනුෂ්‍යත්වයේ ප්‍රගමනයට අප යම් දායකත්වයක් සැපයිය යුතුය, මන්ද සැබෑ සමෘද්ධිය ළඟා කර ගත හැක්කේ දීමෙන් පමණි. ත්‍යාගශීලීත්වය මිනිස් ආත්මයේ ගුණාංගයකි; එය අපගේ භෞතිකමය තත්වයන් සමඟ කිසිදු සම්බන්ධයක් නැත. ගුහ්‍ය වචනවල බහා'උ'ල්ලා තුමා මෙසේ පවසයිː

  **"දීම සහ පරිත්‍යාගශීලී වීම මාගේ ගුණාංග වෙති. මාගේ ගුණාංගයන්ගෙන් සැරසෙන්නාට යහපතක්ම වේ."**[33]

- අප සතු කුමන හෝ ධනයක සැබෑ මූලාශ්‍රය සර්ව ත්‍යාගශීලී දෙවියන්වහන්සේ බව අප මතක තබා ගත යුතුය. උන්වහන්සේ අපගේ පැවැත්ම සඳහා අපට සපයයි; උන්වහන්සේ අපට දියුණු වීමට ඉඩ සලසයි. අපි අරමුදලට දායක වන විට, උන්වහන්සේ අපට ලබා දුන් දෙයින් කොටසක් අප උන්වහන්සේගේ ධර්මය සඳහා වියදම් කරන්නෙමු. බහායිවරුන්ට, අරමුදලට ලබා දීම හුදෙක් ත්‍යාගශීලීභාවය පිළිබඳ කාරණයක් නොවේ; එය අධ්‍යාත්මික දීමනාවක් සහ විශාල පුද්ගල වගකීමක් ද වේ. ආරක්ෂකවරයා අපට මෙසේ උපදෙස් දෙයිː

  **"අප එහි ඇති සියල්ලෙන් නිරන්තරයෙන් හිස් වන සහ නොපෙනෙන ප්‍රභවයකින් නිරන්තරයෙන් පුරවන දිය උල්පත හෝ වසන්තය මෙන් විය යුතුය. දුප්පත්කමට බිය නොවී අපගේ මිතුරන්ගේ යහපත උදෙසා නොකඩවා දීම සියලු ධනය හා සියලු යහපත් ප්‍රභවයන්ගේ නොවරදින ත්‍යාගය මත රඳා සිටීම - මෙය නිවැරදි ජීවත්වීමක රහසයි."**[34]

භෞතික වත්කම් යන විෂය ආමන්ත්‍රණය කරන මෙම අනුපිළිවෙලෙහි පසුකාලීන පාඨමාලාවකදී මෙහි ඇති සමහර අදහස් වඩාත් ගැඹුරින් සලකා බැලීමට ඔබට අවස්ථාවක් ලැබෙනු ඇත. දැනට, ඔබ සැම විටම මෙන්, ඉහත අන්තර්ගතය කරුණෙන් කරුණ සාකච්ඡා කිරීමට සහ පහත අභ්‍යාස සිදු කිරීමට දිරිගන්වනු ලැබේ, එවිට ඔබට අදහස් ස්වභාවිකව සහ පහසුවෙන් ප්‍රකාශ කිරීමට ඉගෙන ගනු ඇතː

1. උපුටා දැක්වීම් මත පදනම්ව, පහත වාක්‍යවල හිස් තැන් පුරවන්න.

අ. බහා'උ'ල්ලා තුමා අපට පවසන්නේ අපගේ කැඳවීමෙන් ......................................, ........................................................................ වෙනුවෙන් වියදම් කරන ලෙසයි.

ආ. ඔබටත් අන් අයටත් .................................................. පිණිස අප ...................................... හා .................................... ඵලයන් දිය යුතු ය.

ඇ. එබැවින් ........................ හා ........................ හි ........................ සෑම කෙනෙකුටම පැවරී ඇත, මන්දයත් අවබෝධය ඇති පුරුෂයෙනි, ........................ ......................... එහි සැගව ඇත.

ඈ. අබ්දුල්-බහා තුමා පැහැදිලි කරන්නේ ........................................... ධනවත් නම් ධනය ................... ..................................... .

ඉ. කෙසේ වෙතත්, .................................... අප්‍රමාණ ....................... ඇති අතර ........................... දුප්පත්ව සිටී නම් සහ එම ..................... කිසිදු ..................... හෝ ..................... නොලැබෙන්නේ නම්, එය එහි ..................... ...................... පමණි.

ඊ. බහා'උ'ල්ලා තුමා පවසන්නේ, .............. සහ ........................................ මාගේ ගුණාංග වෙති. මාගේ ........................................... ......................................... යහපතක්ම වේ.

උ. එසේම ආරක්ෂකවරයා අපව දිරිමත්කරන්නේ එහි ඇති සියල්ලෙන් නිරන්තරයෙන් ........................................ සහ ....................................................................................... .............................. හෝ ......................................... මෙන් විය යුතුය.

ඌ. .................................................... අපගේ මිතුරන්ගේ ............................. නොකඩවා ................. ........................................................................................................ මත රඳ සිටීම - මෙය නිවැරදි ජීවත්වීමක රහසයි.

2. ඉහත ඉදිරිපත් කිරීමෙහි අනුගමනය කරන ලද අදහස් අනුපිළිවෙල ලියන්න:

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

**14 වන කොටස**

ක්‍රියාකාරකම්වලින් පිරී ඇති ගමක හෝ අසල්වැසි ප්‍රදේශයක දිග හැරිය හැකි ආකාරයේ සංවාදයන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා, අපි තරුණ විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකු වන අලෙහන්ද්‍රාගේ උත්සාහය අනුගමනය කළෙමු. සති කිහිපයක සංචාරයන් මාලාවක් පුරා, ඇය සැන්චෙස් මහතා සහ එම මහත්මිය සමඟ මාතෘකා ගණනාවක් සාකච්ඡා කර ඇති අතර, එය ඔවුන්ගේ ධර්මය පිළිබඳ දැනුම ගැඹුරු කිරීමට සහ ඔවුන් වැළඳගත් ඉගැන්වීම් සඳහා ඔවුන්ගේ කැපවීම ශක්තිමත් කිරීමට උපකාරී වනු ඇතැයි ඇය බලාපොරොත්තු වේ. අවසානයේදී, සැන්චෙස්ගේ මිනිබිරිය වන බියට්‍රිස් එම ස්ථානයට පැමිණීමෙන්, තවත් ආකාරයක එනම්, දෙදෙනාම තම ප්‍රජාවන්ට සේවය කරන්නේ කෙසේදැයි ඉගෙන ගැනීමට උනන්දුවෙන් සිටින, තරුණයින් දෙදෙනෙකු අතර වූ සංවාදයක් පරීක්ෂා කිරීමටද අපට හැකි විය. කථාව හරහා ඉදිරියට යාමේදී සහ අභ්‍යාස සිදු කිරීමේදී, අප මෙහි සලකා බලන සංවාදයන් පවත්වා ගැනීමට අදාළ විෂයයන් පිළිබඳ වර්ධනය වන දැනුමට අමතරව, යම් යම් අධ්‍යාත්මික ගුණාංග, ආකල්ප සහ කුසලතා අවශ්‍ය බව අපට පෙනී ගියේය.

මෙම ඒකකයේ මෙම සහ මීළඟ කොටසේදී අපි විවිධ වර්ගයේ - එනම්, ආයතනය විසින් ප්‍රවර්ධනය කරනු ලබන අධ්‍යාපනික වැඩසටහන් සඳහා සහභාගී වන යෞවනයින් සිටින පවුල් වෙත සිදු කරණ සංචාරයන් හිදී සාමාන්‍යයෙන් සාකච්ඡාවට ගනු ලබන තේමා ගවේෂණය කරන්නෙමු. දැනටමත් පෙන්වා දී ඇති පරිදි, ළමුන් සඳහා වූ පන්ති වල ඉගැන්වීමේ සහ සජීවිකාරකයෙකු ලෙස නව යෞවන කණ්ඩායමක් මෙහෙයවීමේ සේවා ක්‍රියාවන් පිළිවෙළින් 3 සහ 5 පොත්වල සඳහන් කර ඇත. ඔබගේ පෙර වයසේදී ඔබ ඒවාට සහභාගී වූවාද යන්න මත පදනම්ව, අනුරූප වැඩසටහන් දෙක ගැන ඔබ හුරුපුරුදු හෝ නොදන සිටිය හැකිය.

නව යෞවනයින්ගේ පවුල් සමඟ නිරන්තර සංවාදයකට බොහෝ විට පදනම සකසන අන්තර්ගතය දෙස අප මුලින්ම බලමු. අපි අපේ කතාවෙන් ඉවත් වී යම් කාලයක් ගත වී ඇති බවත් බියට්‍රිස් දැන් 2 පොත අධ්‍යනය කරන බවත් අපි සිතමු. ඇයගේ සහාය ඇතිව කණ්ඩායමක් පිහිටුවීමට යන නව යෞවනයින් කිහිප දෙනෙකුගේ පවුල් වෙත ඇය සංචාරය කරන විට ඇය සමඟ යාමට කැමතිදැයි අලෙහන්ද්‍රා ඇගේ මිතුරියගෙන් අසයි. ඇය උනන්දුවෙන් එය පිළිගනී.

අලෙහන්ද්‍රා බියට්‍රිස්ට ඇය සිතන දේ පැහැදිලි කරයි. "අපි සෑම සංචාරයක්ම ආරම්භ කරන්නේ, තම පුතා හෝ දියණිය සම්බන්ධ වීමට කැමැත්තක් පෙන්වා ඇති වැඩසටහන දෙමාපියන්ට හඳුන්වා දීමෙන් සහ එය අසල්වැසි ප්‍රජාව ගොඩනැගීමේ ක්‍රියාවලියේ කොටසක් බව සඳහන්

කිරීමෙන්ය, ඉන්පසුව අපි ඔවුන් සමඟ වැඩසටහනේ කේන්ද්‍රීය සංකල්ප සහ අදහස් කිහිපයක් ගවේෂණය කරන්නෙමු. මෙය සංචාර මාලාවක පළමු අවස්ථාව වනු ඇති අතර, අපගේ බලාපොරොත්තුව කාලයත් සමඟ සංවාදය ඉදිරියට යන විට, පවුල විවිධ ආකාරවලින් කණ්ඩායමට සක්‍රියව සහාය දෙනවා පමණක් නොව, ප්‍රජාව තුළ නව යෞවනයින්ගේ අධ්‍යාත්මික සවිබල ගැන්වීමේ වැඩසටහනේ ප්‍රවර්ධකයන් බවට පත්වනු ඇත." යනුවෙන් ඇය ඇයට දන්වයි.

අලෙහන්ද්‍රා සහ බියට්‍රිස් එක් එක් පවුල සමඟ මතු කිරීමට අදහස් කරන කරුණු කිහිපයක් සාකච්ඡා කිරීමට යයි. ඔවුන් වැදගත් යැයි සිතන සියලුම අදහස් ලියා තැබීමට ඔවුන් තීරණය කරයි, ඔවුන් පළමු සංචාරයේදී එයින් කිහිපයක් පමණක් ආවරණය කරන බවත් ඉතිරිය ඊළඟ සංවාදවලදී ආමන්ත්‍රණය කරන බවත් දන සිටියහ. නව යෞවනයන්ගේ හැකියාවන් ගැන ඔවුන් සඳහන් කරන කරුණු පහත පරිදි වේ:

- පුද්ගලයෙකුගේ ජීවිතයේ, වයස අවුරුදු 12 ත් 15 ත් අතර අවුරුදු තුන තීරණාත්මක කාල පරිච්ඡේදයකි - ළමා කාලයේ සිට පරිණතභාවය දක්වා සංක්‍රමණය වීමේ අදියරකි.

- අපි බොහෝ විට මෙම වයස් සීමාවේ සිටින යෞවනයන් හඳුන්වන්නේ "නව යෞවනයන්" ලෙසයි. ඔවුන් තවදුරටත් දරුවන් නොවන නමුත් තවමත් තාරුණ්‍යයේ පූර්ණත්වයට පැමිණ නැත.

- අවාසනාවකට මෙන්, නව යෞවනයන් ආවේගශීලී, කැරලිකාර, ස්වයං-අවශෝෂක සහ නිරන්තර අර්බුදයට ගොදුරු වන අය ලෙස වැරදි නමුත් පුළුල් ලෙස ප්‍රචාරය කරන ලද ප්‍රතිරූපයක් ඇත. කෙසේ වෙතත්, අපි ඔවුන්ව වෙනත් ආකාරයකින් දකිමු. මේ කෙටි ජීවිත කාලය තුළදී අප සියලු දෙනාම කායික, චිත්තවේගීය සහ මානසික වශයෙන් වේගවත් වෙනස්කම්වලට මුහුණ දෙන බව ඇත්තකි. එමෙන්ම එහි ප්‍රතිඵලයක් වශයෙන් අප යම් කැරලිකාර ස්වභාවයක් පෙන්විය හැකි බවද සත්‍යයකි. එහෙත්, යථාර්ථයේ දී, මෙය විශාල හැකියාවක් සහ විශාල පොරොන්දුවක් ඇති යුගයකි.

- අපි බොහෝ කලකට පෙර නව යෞවනයන් වූ අතර මෙම වෙනස්කම් අපට බලපෑ ආකාරය මතකයට නගා ගන්න. විටෙක අපි නිර්භීත වූ අතර විටෙක බියගුලු වූවෙමු. සමහර විට අපි තරමක් සමාජශීලී වූ අතර තවත් විටෙක ඉතා ලැජ්ජාශීලී විය. අවධානය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් අපි බොහෝ විට තනිව සිටීමට ඇති ආශාව ප්‍රකාශ කළෙමු. අපට අවශ්‍ය වූයේ අප දක්ෂ වන්නේ මොනවාද සහ අපට ඇති දක්ෂතා සහ හැකියාවන් මොනවාද යන්න තේරුම් ගැනීමටයි. ඒ වගේම අනිත් අය අපිව දකින්නේ කෙසේද සහ අපේ අදහස් ගැන ඔවුන් සිතන්නේ කුමක්ද යන්න අපට බොහෝ වැදගත් විය.

- මේ ආකාරයේ හැසිරීම් තාවකාලික බව වටහා ගැනීම වැදගත්ය. මනුෂ්‍ය ජීවිතය තුළ මනසේ යම් යම් ශක්තීන් වේගයෙන් වර්ධනය වන්නේ මේ වසරයන් තුළදීය. පැවැත්ම පිළිබඳ මූලික ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමට අප පටන් ගනිමු. අප අවට සිදුවන දේ විශ්ලේෂණය කර අපට උගන්වා ඇති බොහෝ දේ ප්‍රශ්න කරමු. වැඩිහිටියන් අපට කරන ලෙස පවසන දේ ස්වයංක්‍රීයව අනුගමනය කිරීමට අප පෙර මෙන් කැමැත්තක් දක්වන්නේ නැත, ඒ විශේෂයෙන් ඔවුන්ගේ වචන සහ ක්‍රියාවන් අතර පරස්පරතා දකින නිසාවෙනි.

- තරුණ තරුණියන්ට ඔවුන්ගේ නැගී එන බලතල ඵලදායි ලෙස යෙදවීමට සහාය වීමට නම්, ඔවුන් දරුවන් ලෙස සැලකීමෙන් වැළකී සිටීම අත්‍යවශ්‍ය වේ. අබ්දුල්-බහා තුමා මෙම කාල පරිච්ඡේදය විස්තර කරන්නේ මේ ආකාරයෙන්ය:

  **"යම් කාලයකට පසු ඔහු තරුණ අවධියට පිවිසෙන අතර, ඔහුගේ තත්වයට උසස්වීමට අදාළ වන නව අවශ්‍යතා මගින් ඔහුගේ කලින් කොන්දේසි සහ අවශ්‍යතා අභිබවා යයි. ඔහුගේ නිරීක්ෂණ**

**හැකියාවන් පුළුල් හා ගැඹුරු වේ; ඔහුගේ බුද්ධිමත් හැකියාවන් පුහුණු කර අවදි කරනු ලැබේ; ළමා වියේ සීමාවන් හා පරිසරය තවදුරටත් ඔහුගේ ශක්තීන් හා ජයග්‍රහණ සීමා නොකරයි."**[35]

- බහායි ධර්මයේ පරිපාලන ආයතනය වන විශ්ව අධිකරණ මණ්ඩලය, නව යෞවනයන් සමඟ වැඩ කිරීමේදී අප අනුගමනය කර ඇති ප්‍රවේශය ගැන මෙසේ පවසයි:

  **"ගෝලීය ප්‍රවණතාවය වන්නේ මෙම වයස් කාණ්ඩයේ ප්‍රතිරූපය ගැටලුකාරී, කැලඹිලි සහිත කායික හා චිත්තවේගීය වෙනස්වීම්වල ගිලිහී ගොස් ඇති, ප්‍රතිචාර නොදක්වන සහ ස්වයං ආවිෂ්ට, ලෙස ප්‍රක්ෂේපණය කිරීම වන අතර, බහායි ප්‍රජාව - එය භාවිතා කරන භාෂාවෙන් සහ එය අනුගමනය කරන ප්‍රවේශයන් ගෙන් - තීරණාත්මක ලෙස ප්‍රතිවිරුද්ධ දිශාවට ගමන් කරමින්, ඒ වෙනුවට නව යෞවනයන් තුළ පරාර්ථකාමීත්වය, යුක්තිය පිළිබඳ තියුණු හැඟීමක්, විශ්වය ගැන ඉගෙන ගැනීමට ඇති ආශාව සහ වඩා හොඳ ලෝකයක් ගොඩනැගීමට දයක වීමට ඇති ආශාව දකිනු ලබයි."**[36]

අලෙහන්ද්‍රා සහ බියට්‍රිස්  මීළඟට ඔවුන්ගේ අවධානය අධ්‍යාත්මික සවිබල ගැන්වීමේ වැඩසටහන වෙත යොමු කර එහි ලක්ෂණ කිහිපයක් හඳුනා ගැනීමට උත්සාහ කරයි:

- වයස අවුරුදු 12 ත් 15 ත් අතර පසුවන අය ඔවුන්ගේ සිතුවිලි බෙදාහදා ගැනීමට, ව්‍යාපෘතිවල වැඩ කිරීමට, ක්‍රීඩා කිරීමට යනාදිය හැකි මිතුරන් කණ්ඩායමකට සම්බන්ධ වීමට ආශාවෙන් සිටිති. මෙම හේතුව නිසා, වැඩසටහන "නව යෞවන කණ්ඩායමක්" යන සංකල්පය වටා ගොඩනගා ඇත. සෑම කණ්ඩායමක්ම "සජීවිකාරකයෙකු" විසින් මෙහෙයවනු ලැබේ, බොහෝ විට මෙය වැඩිහිටි තරුණයෙකු, සාමාජිකයින්ගේ සැබෑ මිතුරෙකු ලෙස, ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කර ගැනීමට ඔවුන්ට උපකාර කරයි.

- කණ්ඩායම් නිතිපතා රැස්වේ. ඔවුන්ගේ රැස්වීම්වලදී, නව යෞවනයන් සංකල්ප ගවේෂණය කිරීමට සහ වාරණයට හෝ සමච්චලයට බිය නොවී අදහස් ප්‍රකාශ කිරීමට ඉගෙන ගනී. සවන් දීමට, කථා කිරීමට, සමාලෝචනය කිරීමට, විශ්ලේෂණය කිරීමට, තීරණ ගැනීමට සහ ඒවාට අනුව ක්‍රියා කිරීමට ඔවුන් දිරිමත් කරනු ලැබේ.

- අප ජීවත් වන්නේ බොහෝ අයහපත් බලවේග නව යෞවනයන්ගේ සිතන ආකාරයට සහ හැසිරීමට බලපාන කාලයකය. සමාජයේ සදාචාරාත්මක පරිහානියෙන් ආරක්ෂා වීමට පමණක් නොව ලෝකයේ අභිවෘද්ධිය සඳහා වැඩ කිරීම උදෙසා සජීවිකාරකයින් මෙම බලවේගයන්ට එරෙහිව සටන් කිරීමට ඔවුන්ට උපකාර කරයි.

- මෙම වැඩසටහන නව යොවුන් වියේ මුල් අවධියේදී වැඩි සහ විශාල මට්ටම් වලින් ප්‍රකාශ වීමට පටන් ගන්නා, මිනිස් ආත්මයට ආවේණික වූ බලයන් පෝෂණය කිරීමට උත්සාහ කරයි. විශේෂයෙන් වැදගත් වන්නේ සිතීමේ සහ ප්‍රකාශනයේ බලයන්ය. ලෝකය පිළිබඳ ගැඹුරු අදහස් ප්‍රකාශ කිරීමට සහ එය වෙනස් වනු දැකීමට ඔවුනට අවශ්‍ය ආකාරය ප්‍රකාශ කිරීමට යන මේ දෙකටම අවශ්‍ය භාෂාව යෞවනයින් දියුණු කරගත යුතුයි.

- නව යෞවනයන් අරමුණු සහිත ජීවිතයක් සඳහා මූලික සංකල්පවල අර්ථය ගැන මෙනෙහි කිරීමට උනන්දු වෙති. සතුට, බලාපොරොත්තුව සහ විශිෂ්ටත්වය එයට උදාහරණ කිහිපයකි. කනගාටුවට කරුණක් නම් මිනිසුන් මෙම අදහස් ගැන මතුපිටින් කතා කිරීමට නැඹුරු වීමයි. එවැනි සංකල්ප පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම, එදිනෙදා ජීවිතයේදී ඒවා ප්‍රකාශනය කරන ආකාරය හඳුනා ගැනීම, හොඳ සදාචාරාත්මක ව්‍යුහයක් ගොඩනැගීමට සහ සමාජයේ ඍණාත්මක බලවේගයන්ට ඔරොත්තු දීමට තරුණ මනසට උපකාර කළ හැකිය.

- සංකල්ප තේරුම් ගැනීම බුද්ධිමය වර්ධනයට අත්‍යවශ්‍ය වේ. අභ්‍යන්තරයෙන් දිවෙන සංකල්ප ග්‍රහණය කර ගැනීමට ප්‍රමාණවත් උපකාරයක් ලබා නොදී විවිධ විෂයයන් පිළිබඳ විශාල තොරතුරු රාශියක් ඉගෙන ගැනීමට අපේක්ෂා කරන නිසා නව යෞවනයින් සමහර විට පාසැලේදී දුෂ්කරතාවන්ට මුහුණ දිය හැකිය. සදචාරාත්මක, ගණිතමය, විද්‍යාත්මක යනාදී අදහස් ගැන ගැඹුරින් සිතීමට මෙම වැඩසටහන ඔවුන්ව පොලඹවයි, මෙය පාසැලේදී ඔවුන්ගේ කාර්ය සාධනය නිරන්තරයෙන් වැඩි දියුණු කරයි.

- නව යෞවනයන්ට දේවල් තේරුම් ගැනීමට විශාල ආශාවක් ඇත. ඔවුන් අවට සිදුවන දේ සඳහා හේතු තේරුම් ගැනීමට ඔවුනට අවශ්‍යයයි. සාර්ථක වීමට නම්, ඔවුන්ගේ භෞතික ඇසින් පමණක් නොව ආත්මයේ ඇසින් ද දකීමට ඔවුන්ට හැකි විය යුතුය. එසේ නම්, වැඩසටහනේ වැදගත් අරමුණක් වන්නේ අධ්‍යාත්මික සංජානනයඃ එනම් අධ්‍යාත්මික බලවේග හඳුනා ගැනීමට සහ මුහුණ දෙන අවස්ථාවන්හිදී අධ්‍යාත්මික මූලධර්ම හඳුනා ගැනීමට ඇති හැකියාව වැඩිදියුණු කිරීමයි.

- වැඩසටහන එහි විවිධ අරමුණු - එනම් සදචාරය සංවර්ධනය කිරීම, අධ්‍යාත්මික සංජානනය, සහ ප්‍රකාශනයේ බලය - පෙල පොත් මාලාවක් ආධාරයෙන් සාක්ෂාත් කර ගනී. ලෝකයේ විවිධ ප්‍රදේශවල යෞවන යෞවනියන්ගේ ජීවිත පිළිබඳ සරල කථාවලින් මෙම පෙල පොත් පෙළ සමන්විත වේ. මෙම පෙල පොත් එකට අධ්‍යයනය කිරීම, ඒවායේ අන්තර්ගතය සාකච්ඡා කිරීම සහ අවශ්‍ය අභ්‍යාස සම්පූර්ණ කිරීම හැරුණු විට, නව යෞවනයින් ක්‍රීඩා වලට සහභාගී වී කලා හා ශිල්ප පිළිබඳ ඉගෙන ගනී.

- සජීවිකාරකයාගේ සහාය ඇතිව, මෙම කණ්ඩායම් වැඩසටහනේ ප්‍රධාන අංගයක් වන සේවා ව්‍යාපෘති මාලාවක් සැලසුම් කර ක්‍රියාත්මක කරයි. මෙම ව්‍යාපෘති හරහා, නව යෞවනයන් ප්‍රජාව සහ එහි අවශ්‍යතා ගැන සිතීමටත්, උපදෙස් ලබා ගැනීමට සහ තමන් අතර සහ ප්‍රජාව තුළ වූ අන් අය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමටද ඉගෙන ගනී.

- පෙල පොත්වලින් ආවරණය වන විෂයයන් විවිධාකාර වේ; නව යෞවනයන්ගේ අධ්‍යාත්මික සවිබල ගැන්වීම සඳහා අත්‍යවශ්‍ය තේමාවක් කෙරෙහි එකි නෙකෙහි අවධානය යොමු කරයි. නිදසුනක් වශයෙන්, පළමු පෙල පොත, "තහවුරු කිරීම" - උතුම් අරමුණු සාක්ෂාත් කර ගැනීමට අප ගන්නා උත්සාහයන් හට දෙවියන්වහන්සේ තහවුරු කිරීම් ලැබෙයි - යන තේමාව සලකා බලයි. තවත් පෙල පොතක් වන්නේ "බලාපොරොත්තුව" - එහිදී දුෂ්කරම කාලවලදී පවා අපි අනාගතය දෙස බලා සිටිය යුතු ආකාරය පිළිබඳ සලකාබලයි. තවත් එකකදී "විශිෂ්ඨත්වය" යන සංකල්පය විශ්ලේෂණය කරයි. "ප්‍රීතිය" යනු එක් කතාවක තේමාව වන අතර, "වචනයේ බලය" තවත් කතාවක සමාලෝචනයේ විෂය වේ. ගණිතමය සංකල්ප ආමන්ත්‍රණය කරන පෙල පොත් අතර, ක්‍රමවත් මනසක පුරුදු ගවේෂණය කරයි. විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳව ගත් කල, කායික, මානසික සහ අධ්‍යාත්මික වශයෙන් කෙනෙකුගේ සෞඛ්‍යය ගැන සැලකිලිමත් වීම කෙරෙහි අවධානය යොමු කරන පෙල පොත්ද තිබේ. තවද වසර තුනක කාලය තුළ නව යෞවනයන් මේ ආකාරයෙන් දුසිමක් හෝ ඊට වැඩි ගණනක් ඉගෙන ගන්නවා ඇත.

දෙමව්පියන් එවා දෙස බැලීමට කැමති නම් ඔවුනට පෙන්වීමට අලෙහන්ද්‍රා සහ බියට්‍රිස් ඔවුන් සමඟ පෙළ පොත් කිහිපයක් ගෙන ඒමට සැලසුම් කරයි. ඔබ පෙල පොත් හොඳින් හඳුනන්නේ නැත්නම්, හැකිතාක් එවායේ කථාවන් කියවීමට යම් කාලයක් ගත කිරීම ඔබට ප්‍රයෝජනවත් වනු ඇත - මෙය ඔබට ප්‍රජාව තුළ දිග හැරෙමින් පවතින විවිධ සංවාද වඩාත් හොඳින් අනුගමනය කිරීමට හැකියාව ලබාදේ. මේ අතර, ඔබගේ අධ්‍යයන කණ්ඩායමේ අනෙකුත් සහභාගිවන්නන් සමඟ 5 වන පොතෙහි වඩාත් ගැඹුරින් සලකා ඇති ඉහත ඉදිරිපත් කර ඇති අදහස් සම්පූර්ණයෙන් සාකච්ඡා කිරීමට ඔබව දිරිමත් කරනු ලැබේ. එම පොත හැදෑරීමෙන් පසු, ඔබ නව යෞවන කණ්ඩායමක සජීවිකාරකයෙකු ලෙස ක්‍රියා කිරීමට තීරණය කරන්නේ නම්, ඔබ ක්‍රමානුකූලව එහි සාමාජිකයින්ගේ

පවුල් වෙත ගොස් ඔවුන් සමඟ මෙවා සහ බොහෝ ඒහාසමාන අදහස් ගවේෂණය කරනු ඇත. නමුත් දැන් පවා, බියට්‍රිස් මෙන්, ඔබේ ප්‍රජාවේ නව යෞවනයින්ගේ පවුල් වෙත වූ සංචාරයන් කිහිපයකදී අත්දැකීම් ඇති කෙනෙකු සමඟ යාමට ඔබ කැමති විය හැක.

**15 වන කොටස**

ඊළඟ දවසේ, අලෙහන්ද්‍රා සහ බියට්‍රිස් අසල්වැසි ප්‍රදේශයේ පිහිටුවා ඇති නව කණ්ඩායමට එක්වීමට නියමිත නව යෞවනයින් තිදෙනෙකුගේ නිවෙස්වලට සංචාරය කරයි. අධ්‍යාත්මිකව සවිබල ගැන්වීමේ වැඩසටහන පිළිබඳව සංවාදයේ යෙදෙන දෙමාපියන්ගේ උද්‍යෝගය දැකීමෙන් බියට්‍රිස් සතුටු වේ. දහවල් අවසන් වන විට, ඇය නව යෞවන කණ්ඩායම සමඟ අලෙහන්ද්‍රාට උදව් කිරීමට කැමති බවත්, වසරක් තුළ බලාපොරොත්තු වන පරිදි නව කණ්ඩායමක සජීවිකාරකයෙකු ලෙස සේවය කිරීමට ඉගෙන ගැනීමට කැමති බවත් ඇයට ඒත්තු ගැන්වී ඇත. ඇත්ත වශයෙන්ම, මේ අතරතුර සම්පූර්ණ කිරීමට ඇයට ආයතනික පොත් කිහිපයක් ඇති බව ඇය තේරුම් ගනී. නමුත් ඇයව මේ දක්වා ගෙන ආ ස්ථාවර වේගයකින්ම එවායේ අධ්‍යයනයේ ඉදිරියට යාමට ඇය අධිෂ්ඨාන කර ඇත.

ඒ අනුව, අලෙහන්ද්‍රා ගේ නිරන්තර සහාය සහ දිරිගැන්වීමත් සමඟ බියට්‍රිස් සේවා මාවතේ ඉදිරියට ගමන් කරයි. අපි ඇගේ කතාව නැවත ආරම්භ කරමු, එසේ නම්, මාස කිහිපයකට පසු, ඇය 3 පොත අවසන් කිරීමට ආසන්න වන විට. ඇයගේ අධ්‍යයන කවයේ උපදේශකවරිය ළමා පන්ති ගුරුවරියක වන මාරිබෙල්ගෙන් ඉල්ලා ඇත්තේ 1 ශ්‍රේණිය සඳහා අලුතින් පිහිටුවන ලද පන්තියේ තරුණයින්ගේ දෙමාපියන් බැලීමට බියට්‍රිස්ට සහ ඇගේ සෙසු සහභාගිවන්නන්ට ඇය සමඟ යාමට ආරාධනා කරන ලෙසයි. බියට්‍රිස්ට හැඟෙන්නේ ඇය 3 වන පොත අධ්‍යයනය කිරීමෙන් බොහෝ දේ ඉගෙන ගත් බවයි. පොතෙන් ඇය ලබාගෙන ඇති අවබෝධය සජීවිකාරකයෙකු ලෙස සේවය කිරීමට ඇයගේ හැකියාව වැඩි කරන බව අලෙහන්ද්‍රා එය කිහිප වතාවක්ම සඳහන් කළ බැවින් ඇය දනී.

ඔවුන් එකතු වූ විට, මාරිබෙල් බියට්‍රිස්ට පවසන්නේ ඔවුන් එමාගේ මව බැලීමට යන බවයි. "ඇය ඉගෙනීමට ඉතා ප්‍රිය කරන ප්‍රියජනක කුඩා දැරියකි," යනුවෙන් මාරිබෙල් බෙදා ගනී. "මම දැනටමත් වරක් ඇගේ දෙමාපියන් බැලීමට ගොස් බහායි ළමා පන්තියක ස්වභාවය ඔවුන්ට පැහැදිලි කර ඇත්තෙමි. එමාට සහභාගී වීමට ඉඩ දීම ගැන ඔවුන් සතුටු විය. ඇගේ මව පන්තිය ගැන වැඩි විස්තර ඇසීමට කැමැත්තක් දැක්වූ අතර, මම ආපසු ගොස් අප උගන්වන අධ්‍යන කට්ටලවලට අභ්‍යන්තරයෙන් දිවෙන අධ්‍යාපනික අදහස් ගැන ටිකක් කතා කිරීමට පොරොන්දු වුණෙමි. ඇත්ත වශයෙන්ම මම මා වෙනුවෙන් සටහන් කිහිපයක් ලියා ඇත. ඔබට අවශ්‍ය නම්, අපට එක්ව ඒවා අධ්‍යනය කර ඒවා ගැන කතා කළ හැකිය." බියට්‍රිස් එකඟ වේ. ඔවුන් සාකච්ඡා කරන සටහන් මෙවාය:

- පළමුව, මම මාර්ටිනස් මහත්මියට එමා පන්තියේ සිටීම ගැන මම කොතරම් සතුටු වෙනවාද යන්න පවසන අතර ඇගේ අපූරු ගුණාංග කිහිපයක් ගැන සඳහන් කරමි.

- ඇය සමඟ බහ'උ'ල්ලා තුමාගේ ලේඛනවල මෙම උපුටා දැක්වීමක් කියවීමෙන් සාකච්ඡාව ආරම්භ කිරීම වඩාත් සුදුසු බව පෙනේ:

  **"මනුෂ්‍යයා නොමිණිය හැකි වටිනාකමකින් යුත් මාණික්‍යයන්ගෙන් පිරි ආකරයක් ලෙස සලකන්න. එහි අඩංගු වස්තුව අනාවරණය කර එයින් මනුෂ්‍ය වර්ගයාට ප්‍රයෝජන ගැනීමට සැලැස්විය හැක්කේ අධ්‍යාපනයට පමණි."**[37]

- මෙම ප්‍රකාශය ගුරුවරයෙකු ලෙස මට කෙතරම් බලපෑවාද යන්න පිළිබඳව මට අදහස් කිහිපයක් බෙදා ගත හැකිය. පන්තියේ ළමුන් දෙස බලා ඔවුන් මිල කළ නොහැකි මැණික්වලින් පිරුණු ආකර ලෙස සිතන හැම මොහොතකම මගේ හිත සතුටින් උතුරනවා. ඔවුන් සෑම කෙනෙකුටම ස්වර්ගීය ගුණාංග පෙන්වීමට හැකියාව ඇත. ඔවුන් සෑම කෙනෙකුටම

සොයාගෙන සහ දියුණු කළ හැකි කුසලතා ඇත. ඔවුන් සෑම කෙනෙකුටම සමාජයේ වටිනා සාමාජිකයෙකු බවට පත් වී ලෝකයේ අභිවෘද්ධියට දයක විය හැකිය.

- ඊළඟට, අධ්‍යාපනයෙන් සෑම දරුවෙකු තුළම හෙළිදරව් කිරීමට උත්සාහ කළ යුතු මාණික්‍යයන් පිළිබඳ උදහරණ කිහිපයක් මම ලබා දිය යුතුය. ස්වභාවධර්මයේ නියමයන් සොයා ගැනීමටත්, අලංකාර කලා කෘති බිහි කිරීමටත්, උදර සිතිවිලි ප්‍රකාශ කිරීමටත් මනසේ ඇති ශක්තීන් කිහිපයක් මට සඳහන් කළ හැකිය. ඔවුන් නිසි අධ්‍යාපනයක් ලබා ගන්නා විට, දරුවන් හට මෙම සියලු බලයන් වර්ධනය කිරීම ආරම්භ කළහැකි බව මම පැහැදිලි කරමි. එහෙත්, මෙය සිදු වීමට නම්, ඔවුන් කුඩා අවධියේදීම යම් ගුණාංග ලබා ගත යුතුය. නිදසුනක් වශයෙන්, ඔවුන් අවධානයෙන් සිටීමට, අවශ්‍ය වූ විට වෙහෙස මහන්සි වී වැඩ කිරීමට සහ ඔවුන් කරන දේ කෙරෙහි අවධානය යොමු කිරීමට ඉගෙන ගත යුතුය. ඔවුන් අන් අයගේ යහපැවැත්ම ගැන සැලකිලිමත් වන සහ ප්‍රජාවට සේවය කිරීමට කැමති පුද්ගලයින් බවට වර්ධනය විය යුතුය. කුඩා වියේදීම ඔවුන්ගේ චරිතයේ වර්ධනයට අවධානය යොමු කිරීම වැදගත් වන්නේ එබැවිනි.

- එසේ නම්, මාර්ටිනස් මහත්මිය තම දියණිය කුමන ආකාරයක පුද්ගලයෙක් බවට පත්වීය යුතුද, සහ එමාට තිබිය යුතු, වැදගත් යැයි ඇය සිතන, චරිත ලක්ෂණ මොනවාද යන්න පිළිබඳවත් අදහස් කිහිපයක් අප සමඟ බෙද ගන්නා ලෙස ඉල්ලා සිටීමට මෙය හොඳ අවස්ථාවක් වනු ඇත.

- ඇය සඳහන් කරන ගුණාංග අතර, සමහරක්, නිසැකවම, මම හඳුන්වා දෙන ඊළඟ විෂය වන ආධ්‍යාත්මික ගුණාංග ගණයට වැටෙනු ඇත. මනුෂ්‍ය පැවැත්මට මූලික වන යම් පුද්ගලයෙකු සතුව තිබිය යුතු නිශ්චිත ගුණාංග ඇති බව මම පවසමි. ඒවා මිනිස් ආත්මයට අයත් වේ. අපගේ හදවතේ කැඩපත ඔප දැමීමෙන් අපි ඒවා වර්ධනය කරමු, එවිට එය දෙවියන්වහන්සේගේ ගුණාංග පිළිබිඹු කරයි. මේවා අපි අධ්‍යාත්මික ගුණාංග ලෙස හඳුන්වමු, 1 ශ්‍රේණිය සඳහා අපගේ පන්තිවල උගන්වන පාඩම් බොහෝ දුරට මෙම ගුණාංග කෙරෙහි අවධානය යොමු කරයි.

- මම 3 පොතේ 1 ශ්‍රේණියේ පාඩම් වල ආමන්ත්‍රණය කර ඇති අධ්‍යාත්මික ගුණාංග කිහිපයක් ලැයිස්තුගත කර ඊට අනුරූප උපුටා දැක්වීම් ඇය සමඟ බෙද ගැනීමට සිතමි. එමා මෙම උපුටා දැක්වීම් කටපාඩම් කරන බවත්, ඒවා ඇයට කියවන ලෙස තම දියණියගෙන් ඉල්ලා සිටිය හැකි බවත්, ඇය යාච්ඤාවන් ඉගෙන ගන්නා බවත් මම පැහැදිලි කරමිඃ

- ආදරයඃ

**"ඔබගේ හදවත නැමැති උද්‍යානයෙහි ප්‍රේමය නැමැති රෝස පැළය හැර වෙන කිසිවක් නොසිටුවන්න....."**[38]

- යුක්තියඃ

**"ඔබ යුක්තියේ මාර්ගයේ ගමන් කරන්න. ඇත්තවශයෙන්ම, ඍජු මාර්ගයේ ගමන් කරන්න."**[39]

- සත්‍යවාදී බවඃ

**"සියළුම මානුෂික ගුණාංගයන්ගේ පදනම සත්‍යවාදිබවය"**[40]

- ප්‍රීතියඃ

**"එම්බා මනුෂ්‍ය පුත්‍රය ! මා මුණ ගැසීමටත් මාගේ සෞන්දර්යය පිළිබිඹු කිරීමටත් ඔබ සුදුසු වීම ගැන ඔබගේ හදපිරි ප්‍රීතියෙන් ඉපිල යන්න."**[41]

ඉහත අදහස් එක් සංචාරයක් සඳහා ප්‍රමාණවත් බව මාරිබෙල් සහ බියට්‍රිස් තීරණය කරයි. ඔබ ඉක්මනින්ම 3 වන පොත අධ්‍යයනය කිරීමට ඉදිරියට යන අතර දරුවන්ගේ අධ්‍යාත්මික අධ්‍යාපනය සඳහා රූහි ආයතනයේ හය අවුරුදු වැඩසටහනට හැඩගැසෙන මූලධර්ම කිහිපයක් මෙනෙහි කිරීමට ඔබට අවස්ථාවක් ලැබෙනු ඇත. ඊට පෙර, ඔබට ළමා පන්ති ගුරුවරයෙකු සමඟ දෙමාපියන් කිහිප දෙනෙකු හමුවීමට අවස්ථාවක් උද වන්නේ නම්, මෙහි දක්වා ඇති අදහස් උපකාර වනු ඇති අතර, ඔබ දූන් ඔබේ අධ්‍යයන කණ්ඩායම තුල කරුණෙන් කරුණ ගෙන ඒවා සාකච්ඡා කළ යුතුය.

**16 වන කොටස**

මීට පෙර අපි 'අබ්දුල්-බහා තුමාගේ පහත සඳහන් වදන් කියවා ඇත්තෙමු: "මිනිසුන් අතර මිත්‍රත්වයේ සහ සහයෝගීතාවයේ බැඳීම් ශක්තිමත් වන තරමට, මිනිස් ක්‍රියාකාරකම්වල සියළු තලවල නිර්මාණාත්මකභාවයේ සහ ජයග්‍රහණයේ බලය වැඩි වනු ඇත." විශ්ව අධිකරණ මණ්ඩලය අපට පවසන්නේ, නිවෙස්වලට සංචාරයේදී සහ අපගේ නිවෙස්වලට ආරාධනා කිරීමේදී, අපි "ප්‍රජාව පිළිබඳ හැඟීමක් ඇති කරන අධ්‍යාත්මික ඥාතිත්වයේ බැඳීම් ගොඩනගා ගන්නා" බවයි. එසේ නම්, වර්ධනය වන අපගේ ප්‍රජාවේ සංස්කෘතියට මෙම ක්‍රියාවෙහි බලපෑම අප අවතක්සේරු නොකළ යුතුය.

පෙර කොටස්වලදී අපි එකිනෙකාගේ නිවෙස්වලට යන විට සිදු විය හැකි වෙනස් ආකාරයේ සංවාදයන් කිහිපයක් දෙස බැලුවෙමු. අප සියලු දෙනාම, අප සේවා මාවතේ ගමන් කරන විට, අපගේ පුද්ගල සහ සාමූහික ජීවිතයට බහා'උ'ල්ලා තුමාගේ ඉගැන්වීම් අදළ කර ගැනීම පිළිබඳව අපගේ ගම තුල, නගරයේ හෝ අසල්වැසි ප්‍රදේශයේ හෝ වෙවා පුළුල් සංවාදයකට සහභාගී වනු ඇත. සමහර විට මෙම ඉගැන්වීම් පිළිබඳ ඔවුන්ගේ දැනුම ගැඹුරු කිරීමට වැඩිවන සංඛ්‍යාවකට හැකි වන පරිදි සංවිධානය කරන ලද විධිමත් සංචාරයන් මාලාවක් තුළ මෙය දිග හැරෙනු ඇත. තවත් අවස්ථා ගණනාවකදී, ආයතනයේ අධ්‍යාපනික වැඩසටහන්, ඒවායේ අරමුණු සහ අන්තර්ගතයන් සාකච්ඡාවට බඳුන් වනු ඇත. ප්‍රජාව ගොඩනැගීමේ ක්‍රියාවලියේ නිරත වීමට ආරාධනා වැඩි වැඩියෙන් අසල්වාසීන්ට සහ මිතුරන්ට ලබා දෙනු ඇත. ඔබ අනාගතය දෙස බලන විට සහ ඔබ ඉදිරියෙහි විහිදෙන සේවා මාවත දෙස බලන විට, මෙම ඒකකයේ ඉදිරිපත් කර ඇති අන්තර්ගතය හොඳින් ඉගෙන ගැනීමටත්, එක් එක් තේමාවන් පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමටත්, ඇත්ත වශයෙන්ම, බහා'උ'ල්ලා තුමාගේ ඉගැන්වීම් පිළිබඳ ඔබේම දැනුම ගැඹුරු කරගැනීම දිගටම කරගෙන යාමටත් ඔබ සෑම උත්සාහයක්ම ගත යුතුය. මෙසේ දෙවියන්වහන්සේගේ වචනය අන් අය සමඟ බෙදගැනීමේ නිමක් නැති ප්‍රීතිය ඔබ සතු වනු ඇත.

## REFERENCES


1. Bahá'u'lláh, *The Hidden Words* (Wilmette: Bahá'í Publishing Trust, 2003, 2012 printing), Arabic no. 4, p. 4.

2. Bahá'u'lláh, in *Bahá'í Prayers*: *A Selection of Prayers Revealed by Bahá'u'lláh, the Báb, and 'Abdu'l-Bahá* (Wilmette: Bahá'í Publishing Trust, 2002, 2017 printing), p. 4.

3. *Gleanings from the Writings of Bahá'u'lláh* (Wilmette: Bahá'í Publishing Trust, 1983, 2017 printing), IV, par. 1, p. 5.

4. Ibid., V, par. 2, pp. 6–7.

5. 'Abdu'l-Bahá, in *Bahá'í Prayers*, p. 81.

6. Ibid., p. 111.

7. Ibid.

8. From a talk given on 16 August 1912, published in *The Promulgation of Universal Peace: Talks Delivered by 'Abdu'l-Bahá during His Visit to the United States and Canada in 1912* (Wilmette: Bahá'í Publishing, 2012), par. 23, p. 364.

9. 'Abdu'l-Bahá, in *Bahá'í Prayers*, p. 130.

10. *Gleanings from the Writings of Bahá'u'lláh*, XLV, par. 1, pp. 111–12.

11. 'Abdu'l-Bahá, cited by Shoghi Effendi, *The World Order of Bahá'u'lláh: Selected Letters* (Wilmette: Bahá'í Publishing Trust, 1991, 2012 printing), p. 139.

12. *Gleanings from the Writings of Bahá'u'lláh*, V, par. 5, p. 8.

13. From a talk given by 'Abdu'l-Bahá on 5 May 1912, published in *The Promulgation of Universal Peace*, par. 4, p. 128.

14. From a talk given on 21 October 1911, published in *Paris Talks: Addresses Given by 'Abdu'l-Bahá in 1911* (Wilmette: Bahá'í Publishing, 2006, 2016 printing), no. 6.7–8, p. 22.

15. *Gleanings from the Writings of Bahá'u'lláh*, CXLVI, par. 1, p. 357.

16. From a talk given by 'Abdu'l-Bahá on 5 May 1912, published in *The Promulgation of Universal Peace*, par. 4, p. 128.

17. *The Hidden Words*, Persian no. 44, p. 37.

18. Ibid., Persian no. 66, p. 45.

19. From a Tablet of 'Abdu'l-Bahá. (authorized translation)

20. From a talk given by 'Abdu'l-Bahá on 25 September 1912, published in *The Promulgation of Universal Peace*, par. 2, pp. 478–79.

21. *Selections from the Writings of ‘Abdu’l-Bahá* (Wilmette: Bahá’í Publishing, 2010, 2015 printing), no. 43.1, p. 125.

22. Ibid., no. 207.3, p. 360.

23. Bahá’u’lláh, in *Bahá’í Meetings: Extracts from the Writings of Bahá’u’lláh, ‘Abdu’l- Bahá, and Shoghi Eff ndi*, compiled by the Research Department of the Universal House of Justice (Wilmette: Bahá’í Publishing Trust, 1976, 1980 printing), p. 3.

24. Ibid.

25. *Tablets of Abdul-Baha Abbas* (New York: Bahá’í Publishing Committee, 1916, 1930 printing), vol. 3, p. 631. (authorized translation)

26. Bahá’u’lláh, in *The Kitáb-i-Aqdas: The Most Holy Book* (Wilmette: Bahá’í Publishing Trust, 1993, 2013 printing), par. 57, p. 41.

27. *Selections from the Writings of ‘Abdu’l-Bahá*, no. 48.1, p. 130.

28. From a letter dated 27 August 1989, published in *Messages from the Universal House of Justice, 1986–2001: The Fourth Epoch of the Formative Age* (Wilmette: Bahá’í Publishing Trust, 2010), no. 69.2, pp. 132–33.

29. Ibid., no. 69.9–10, p. 135.

30. *The Hidden Words*, Persian no. 82, p. 51.

31. Ibid., Persian no. 80, p. 51.

32. ‘Abdu’l-Bahá, *The Secret of Divine Civilization* (Wilmette: Bahá’í Publishing, 2007, 2016 printing), par. 46, p. 33.

33. *The Hidden Words*, Persian no. 49, p. 39.

34. Shoghi Effendi, cited in *Bahá’í News*, no. 13 (September 1926), p. 1.

35. From a talk given by ‘Abdu’l-Bahá on 17 November 1912, published in *The Promulgation of Universal Peace*, par. 3, p. 617.

36. From a message dated 21 April 2010, published in *Framework for Action: Selected Messages of the Universal House of Justice and Supplementary Material, 2006–2016* (West Palm Beach: Palabra Publications, 2017), no. 14.16, p. 82.

37. *Gleanings from the Writings of Bahá’u’lláh*, CXXII, par. 1, p. 294.

38. *The Hidden Words*, Persian no. 3, p. 23.

39. *Gleanings from the Writings of Bahá’u’lláh*, CXVIII, par. 1, p. 283.

40. ‘Abdu’l-Bahá, cited by Shoghi Eff ndi, *The Advent of Divine Justice* (Wilmette: Bahá’í Publishing Trust, 2006, 2018 printing), par. 40, p. 39.

41. *The Hidden Words*, Arabic no. 36, p. 12.